# රණවිරුවා

2023 අප්‍රේල් • 254 කලාපය




## චීරබදු කොවුල් ඔංචිලි චාරම් මැද්දේ
## තිබුණා මෙවර හමුදා අවුරුදු සද්දේ

මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය, යුද්ධ හමුදා මූලස්ථානය, ශ්‍රී ජයවර්ධනපුර





# ජනාධිපතිතුමන්

## ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සහ පොලිස් නිලධාරීන් අමතයි





සන්නද්ධ හමුදා සේනාධිනායක ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉකුත් අප්‍රේල් 01 වන දින අනුරාධපුර ගුවන් හමුදා කඳවුරේ සංචාරයක නිරත වෙමින් වන්නි ප්‍රදේශයේ ත්‍රිවිධ හමුදා නිලධාරීන්, සෙසුනිලයන් සහ පොලිස් නිලධාරීන් ආමන්ත්‍රණය කළේය. මෙම අවස්ථාව සඳහා ගරු ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක යන මහත්වරු, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ත්‍රිවිධ හමුදාධිපතිවරු, පොලිස්පති ප්‍රමුඛ නිලධාරීන් සහ එම සාමාජිකයින් රැසක්ද සහභාගී වූහ.

ත්‍රස්තවාදී යුද්ධය ජයගත්තා සේම ශ්‍රී ලංකාවේ ආර්ථික යුද්ධයද ජයගෙන ආර්ථික ස්වාධීනත්වයක් ඇති කිරීමට කඩිනමින් පියවර ගන්නා බව ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසින් එහිදී ප්‍රකාශ කරන ලදී. ඒ සඳහා ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ දායකත්වය නිරන්තරයෙන්ම අවශ්‍ය බව පෙන්වා දුන් සෙනෙතම නීතිය හා සාමය ආරක්ෂා කිරීම වෙනුවෙන් පසුගිය වසරේදී ත්‍රිවිධ හමුදාව සහ පොලීසිය ක්‍රියා කළ ආකාරයද ඇගයීමට ලක් කළේය. දේශනය සමාප්තියේ ජනාධිපතිතුමන් එම අවස්ථාවට සහභාගීවූවන් සමඟින් සුහද අදහස් හුවමාරුවක ද නිරත වූයේය.



# උතුරේ ජනදිවි නැගුමට සත්කාරයක්





යාපනය අර්ධද්වීපයේ දැඩි ආර්ථික දුෂ්කරතා මධ්‍යයේ දිවි ගෙවන අඩු ආදායම්ලාභී පවුල් සඳහා ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ උපදෙස් මත සහල් බෙදාදීමේ වැඩසටහනක් පසුගිය අප්‍රේල් 28 වන දින යාපනය වේලනි සහ තෙලිප්පලෙයි යන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලදී පැවැත්විණි. ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සහ ජාතික ආරක්ෂාව පිළිබඳ ජනාධිපති ජ්‍යේෂ්ඨ උපදේශක සාගල රත්නායක, ධීවර අමාත්‍ය ඩග්ලස් දේවානන්ද, සමාජ සවිබල ගැන්වීම් රාජ්‍ය අමාත්‍ය අනුප පැස්කුවල් යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ද එක්විය.



එහිදී, ව්‍යාපෘතිය ආරම්භයේදී සහල් සහනාධාරය පවුල් ලක්ෂ 20ක් සඳහා ලබාදීමට නියමිත වූ අතර, පසුව ජනාධිපතිතුමන්ගේ උපදෙස් මත එය පවුල් ලක්ෂ 29ක් දක්වා වැඩිකෙරිණි. මේ යටතේ සෑම පවුලක් සඳහාම මසකට සහල් කිලෝ ග්‍රෑම් 10 බැගින් හිමිවන අතර, මෙම ව්‍යාපෘතිය අනෙකුත් දිස්ත්‍රික්කවලද ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම්කර ඇත.



යුද්ධ හමුදාධිපතිගේ උපදෙස් මත ශ්‍රී ලංකා යුද්ධ හමුදා කෘෂිකර්ම හා පශු සම්පත් බලකාය විසින් එම බලකාය යටතේ පවත්වාගෙන යනු ලබන ගොවිපොලවල්වලින් නෙලාගත් සහල් කිලෝග්‍රෑම් 10,000 ක් මෙම ව්‍යාපෘතිය යටතේ බෙදාදීම සඳහා පරිත්‍යාග කරන ලදී.

එම අවස්ථාවන් සඳහා යාපනය දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් ඒ සිවබාලසුන්දරන් මහතා, ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීබීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී වීඑස්වී යූඑස්පී පීඑස්සී, ඇතුළු ප්‍රදේශයේ රාජ්‍ය නිලධාරීන් සහ සිවිල් වැසියන් පිරිසක් ද සහභාගී වූහ.



# හෙළ කෙළි සෙල්ලම් සමඟින් යුද්ධ හමුදා අවුරුදු උත්සවය මෙවරත්



ශ්‍රී ලංකා යුද්ධ හමුදාව වාර්ෂිකව සංවිධානය කරනු ලබන සිංහල හා දමිළ අලුත් අවුරුදු උත්සවය හෙළ කෙළි සෙල්ලම් රැසක් සමඟින් පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේදී ඉකුත් අප්‍රේල් 10 වන දින පවත්වනු ලැබිය. ශ්‍රී ජයවර්ධනපුර යුද්ධ හමුදා මූලස්ථානයේ සේවයේ නියුතු යුද්ධ හමුදා සාමාජිකයින් විශාල පිරිසකගේ සහභාගීත්වයෙන් පැවති එම අවස්ථාව සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සමඟින් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූවාය.




තවද, මෙම උත්සව අවස්ථාවට යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී, නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී, යුද්ධ හමුදා ස්වෙච්ඡා බලසේනාවේ සේනාවිධායක, ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති, යුද්ධ හමුදා විධායක ජෙනරාල් ඇතුළු ජ්‍යේෂ්ඨ නිලධාරීන් පිරිසක් ද එක්වූහ.











මෙවර යුද්ධ හමුදා මූලස්ථාන බක්මහ උළෙල "අවුරුදු කුමරිය" තේරීම, අලියාට ඇස තැබීම, බනිස් කෑම, කොට්ටාපොර ගැසීම, සෙමින් බයිසිකල් පැදීම, ගම හරහා දිවීම, විකට ඇඳුම් තරඟය, බාධක දිවීම ඇතුළු සම්ප්‍රදායික ජන ක්‍රීඩා හා විනෝදාත්මක ක්‍රීඩා රැසකින් සමන්විත විය.

ගැමි ගම්මානයක අසිරිය විදහා දක්වමින් යුද්ධ හමුදා සාමාජිකයින් විසින් ක්‍රීඩාපිටියේ ඉදිකර තිබූ ආදර්ශ ගැමි ගෙදර සංචාරය කළ යුද්ධ හමුදාධිපති එම අවස්ථාවට සහභාගී වූ නිලධාරීන් සහ සෙසුනිලයින් සමඟින් සුහදව අදහස් හුවමාරු කරගත්හ.

එහිදී, ඔවුහු එම අවස්ථාවට එක්වූ "මිහිඳු සෙත් මැදුර", රාගම "රණවිරු සෙවණ" සහ "අභිමංසල" සුවතා නිකේතනවල රණක්ෂිතයට පත් විරෝදාර රණවිරුන් වෙත අවුරුදු සුබපැතුම් එක්කරමින් ඔවුන් වෙත විශේෂ ත්‍යාග පිරිනමන්නටද අමතක නොකළහ.



# මිහිඳු සෙත් මැදුරේ බක්මහ අසිරිය

සිංහල සහ දමිළ අලුත් අවුරුද්ද වෙනුවෙන්, මාතෘභූමියේ ඒකීයභාවය උදෙසා කැපවී රණක්ෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන හා පුනරුත්ථාපන කටයුතුවල නිරතව සිටින විරෝදාර රණවිරුවන් වෙනුවෙන් සංවිධානය කෙරුණු අවුරුදු උත්සවයක් අත්තිඩිය "මිහිඳු සෙත් මැදුර" සුවතා නිකේතන පරිශ්‍රයේදී ඉකුත් අප්‍රේල් 24 වන දින පැවැත්විණ. එම අවස්ථාවට එහි සේනාවිධායක බ්‍රිගේඩියර් වීඑස් බාලසූරියගේ ආරාධනයෙන් යුද්ධ හමුදාපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ප්‍රධාන අමුත්තා ලෙස එක්විය.



මානුෂීය මෙහෙයුමේදී රණක්ෂිතයට පත් විරෝදාර රණවිරුවන් සහභාගී වූ මෙම අවුරුදු උත්සවය සඳහා කොට්ටා පොර ගැසීම, කණා මුට්ටිය බිඳීම, අලියාට ඇස තැබීම, සංගීත පුටු තරගය, බැලුන් පිපිරවීම, හැන්ද මත දෙහි ගෙඩිය ගෙන යාම, අන්ධයාට කිරි කැවීම ආදී ක්‍රීඩා අංග රැසක් ඇතුළත් විය.

එහිදී, යුද්ධ හමුදාපති එහි නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරුවන්ගේ වාට්ටු වෙත ගොස් ඔවුන්ගේ සුවදුක් විමසා සුහදව අදහස් හුවමාරු කරගනිමින් ඔවුන් වෙත විශේෂ අලුත් අවුරුදු ත්‍යාග පාර්සල් ද ප්‍රදානය කළේය.

මෙම අවස්ථාවට හටකාර්ය සම්පාදක අණසක මූලස්ථානයේ ආඥාපති, යුද්ධ හමුදා ප්‍රධාන සෙන්ත්‍ර ඉංජිනේරු, යුධෝපකරණ මාස්ටර්, යුද්ධ හමුදා විධායක ජෙනරාල් ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.













# අවුරුදු සිරිමැද සංගීත හද පැතිරේ

සිංහල හා දෙමළ අලුත් අවුරුදු උත්සවයට සමගාමීව පනාගොඩ යුද්ධ හමුදා ජනපදයේ සංවිධානය කෙරුණු සංගීත ප්‍රසංගයක් ඉකුත් අප්‍රේල් 10 වන දින සන්ධ්‍යාවේදී යුද්ධ හමුදා නවක ගායක ගායිකාවන් සහ ජනප්‍රිය කලාකරුවන්ගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබීය.




ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංගීත කණ්ඩායම සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා සංගීත කණ්ඩායම එක්ව පවත්වන ලද "*Ranaviru Fiesta* 2023" සංගීත ප්‍රසංගය සඳහා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්ඩබ්ලිව්ඒම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු සහභාගී විය.




ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) විසින් සංවිධානය කරන ලද යුද්ධ හමුදාධිපති අභියෝගතා වොලිබෝල් ශූරතාවලිය - 2023 ජයග්‍රාහකයන් වෙත කුසලාන, සහතිකපත් සහ ත්‍යාග ප්‍රදානය කිරීමද එම සංගීත සන්ධ්‍යාව අතරතුරදී යුද්ධ හමුදාධිපතිගේ සුරතින් සිදුවිය. එම තරගාවලියේ ශූරතාව ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) වොලිබෝල් කණ්ඩායමටත් අනුශූරතාව 143 වන පාබල බලසේනා වොලිබෝල් කණ්ඩායමටත් හිමි විය.

# ගජබා රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී අලුත් අවුරුදු පොළක්





ගජබා රෙජිමේන්තු හටපිරිස්වල සහයෝගය ඇතිව එම සේවා වනිතා ඒකකයේ සාමාජිකාවන් විසින් සංවිධානය කරන ලද අලුත් අවුරුදු පොළක් සාලියපුර ගජබා රෙජිමේන්තු පරිශ්‍රයේදී ඉකුත් මාර්තු 07 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට යුද්ධ හමුදාධිපති හා ගජබා රෙජිමේන්තුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්ඩබ්ලිව්ඒම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියු සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ හා ගජබා රෙජිමේන්තු සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය එක්වූහ. වෙළඳ කුටි 25 කට වැඩි ප්‍රමාණයක් ඉදිරිපත්කර තිබූ එම අලුත් අවුරුදු පොළෙහි එළවළු, පලතුරු, මල් පැළ වර්ග සහ ආහාර ද්‍රව්‍ය රැසක්ද විනෝදාස්වාදය සඳහා වායු රයිෆල් වෙඩි තැබීමේ කුටියකින් ද සමන්විත විය.



# “ඉෆ්තාර්” උත්සවයට යුද්ධ හමුදාධිපති එක්වෙයි



මුස්ලිම්වරුන්ගේ උපවාසය අත්හැරීම හෙවත් "ඉෆ්තාර්" චාරිත්‍ර ඉටු කිරීමේ උත්සවය යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්ඒල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් යුද්ධ හමුදාවේ සේවයේ නියුතු ඉස්ලාම් ආගමික නිලධාරීන් සහ සෙසුනිලයින් රැසකගේ සහභාගීත්වයෙන් ඉකුත් අප්‍රේල් 19 වන දින වාද්දුව "ලයා බීච්" හෝටල් පරිශ්‍රයේදී පැවැත්විණ.



ලොව පුරා වෙසෙන ඉස්ලාම් බැතිමතුන් විසින් සිදුකරනු ලබන "ඉෆ්තාර්" චාරිත්‍රයට අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ මුස්ලිම් නිලධාරීන් සහ සෙසු නිලයින් වෙනුවෙන් මෙම වැඩසටහන ශ්‍රී ලංකා යුද්ධ හමුදා මුස්ලිම් සංගමය විසින් සංවිධානය කරන ලද අතර, මෙමඟින් රටේ සමෘද්ධිය සහ සෞභාග්‍ය ප්‍රාර්ථනා කරමින් ආශිර්වාද කිරීම සිදුකෙරේ.



උත්සවයේ පිළිගැනීමේ කතාව යුද්ධ හමුදා මුස්ලිම් සංගමයේ සභාපති බ්‍රිගේඩියර් ඒඑම් මුතාලිෆ් විසින් පවත්වනු ලැබූ අතර, ගරු මවුලවි අබ්දුල්ලා මොහිදීන් විසින් සිංහල සහ ඉංග්‍රීසි භාෂාවෙන් දේශන පවත්වමින් "ඉෆ්තාර්" චාරිත්‍ර චාරිත්‍ර පිළිබඳ සහ එහි අර්ථය ජීවන රටාවට වැදගත්වන ආකාරය පිළිබඳව පැහැදිලි කරන ලදී. මෙම අවස්ථාව සඳහා යුද්ධ හමුදා සේවා වනිතා සභාපතිනිය ඇතුළු ජ්‍යෙෂ්ඨ නිලධාරීහු රැසක්ද සහභාගී වූහ.





# කෘතහස්ත රණවිරු කලාකරුවාට ගෞරවාචාරය

ප්‍රවීණ රංගන ශිල්පී අභාවප්‍රාප්ත අමරසිරි කලංසූරිය මහතාගේ දේහයට අවසන් ගෞරව දැක්වීම සඳහා යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා විධායක ජෙනරාල් මේජර් ජෙනරාල් එම්ජීඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්එම්සීබී වික්‍රමසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ පීඑස්සී ඉකුත් අප්‍රේල් 03 වන දින සහභාගී වූහ.

එහිදී, එම කලාකරුවාගේ ඥාතීන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගත් යුද්ධ හමුදාධිපති, ඔහුගේ ප්‍රතිභාපූර්ණ සිනමා කෞශල්‍ය පිළිබඳව සිහිපත් කළේය. අමරසිරි කලංසූරිය මහතා රංගන ජීවිතයට පිවිසීමට පෙර, 1963 වර්ෂයේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ දෙවන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල්වරයකු ලෙසද රාජකාරී කර ඇත. එම විශිෂ්ට රණවිරු කලාකරුවාට "රණවිරුවා" තුළින් අපිද නිවන්සුව අත්වේවායි පතන්නෙමු.

**1958 වර්ෂයේදී යුද්ධ හමුදාවට බැඳී ඇති අමරසිරි කලංසූරිය දියතලාවේ පැවති මූලික පුහුණුවීම්වලදී එම කණ්ඩායමේ ප්‍රගුණ වෙඩික්කරු ශූරතාව දිනාගැනීමටද සමත්ව ඇත. පුහුණුවෙන් අනතුරුව 2 වන (ස්වෙච්ඡා) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවට ආධුනික සෙබළෙක් ලෙස එක්ව ඇති ඔහු යාපනය ඇතුළු දවයිගේ ප්‍රදේශ කිහිපයක සේවයකොට ලාන්ස් කෝප්‍රල්වරයෙක් ලෙස උසස්වීමක්ද ලැබීය.**





# රණවිරු පවුලකට නව නිවසක්





රටේ ඒකීයභාවය වෙනුවෙන් තම දිවි කැපකළ 10 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ සැරයන් ඩබ්එම් කුමාරදාස රණවිරුවාගේ බිරිඳ සහ දරුවන් වෙනුවෙන් අනුරාධපුර කුඩා කලත්තෑව ප්‍රදේශයේ ඉදිකරන ලද නව නිවසක් ඉකුත් අප්‍රේල් 08 වන දින එම ප්‍රතිලාභීන් වෙත භාරදෙනු ලැබීය. ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ජ් කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී ගේ ආරාධනයෙන් එම අවස්ථාවට යුද්ධ හමුදාධිපති සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු අධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ යුද්ධ හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මිය සහභාගී වූහ.

අභාවප්‍රාප්ත සැරයන්වරයාගේ පවුල වෙත යුද්ධ හමුදාධිපති අරමුදල සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ ඒකාබද්ධ අරමුදලින් රුපියල් මිලියන 2.2 ක මුදලක් වැයකර මෙම නව නිවස ඉදිකරන ලද අතර, ඊට 4 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ හටපිරිස් ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික දැනුම ලබාදුන්හ. මෙම නව නිවස නිදන කාමර තුනක්, මුළුතැන්ගෙයක් හා සනීපාරක්ෂක පහසුකම් සියල්ලෙන් සමන්විතය.

එහිදී, නව නිවසේ ප්‍රතිලාභීන් වෙත ශීතකරණයක්, රයිස් කුකරයක්, මුළුතැන්ගෙයි උපකරණ, වියළි ආහාර සලාක පාර්සල් ඇතුළු තවත් අත්‍යවශ්‍ය භාණ්ඩ රැසක් ද පිරිනැමිණි. මෙම අවස්ථාවට 21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ඇතුළු නිලධාරීන් හා ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පිරිසක් ද සහභාගී වූහ.







අඹ යහළුවන් ලෙස දෙපසක වී ඉවුරු
දඹකොළ පටුන ජයගත් බිඳ දා පවුරු
සිඹ පා පුදම් මතකය සිහිකොට මියුරු
නුඹ මට දෙවැනි මව මිස නොම වෙන කවුරු

- ලුතිනන් කර්නල් [illegible]

# අරමුණ දිනන්නට පෙරමුණට හයියවුණු

## වෙහෙරමහ පරපුරේ බිරින්දෑවරුනට උපහාර පිදේ

ශ්‍රී ලාංකික ජාතියේම ප්‍රණාමයට හා ගෞරවාදරයට පාත්‍ර වූ අමරණීය රණවිරුවන් වන ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පතිගේ භාර්යාව වන ලලී කොබ්බෑකඩුව මැතිණිය සහ මේජර් ජෙනරාල් විජය විමලරත්න සෙන්පතිගේ භාර්යාව වන මානෙල් විමලරත්න මැතිණිය ඉකුත් අප්‍රේල් 27 වන දින යුද්ධ හමුදාධිපති කාර්යාලය වෙත ආරාධනා කොට බුහුමන් පුදන්නට යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්වීඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ විසින් කටයුතු කරන ලදී.

යුද්ධ හමුදා මූලස්ථාන පරිශ්‍රය වෙත සපැමිණි එම දෙපළ යුද්ධ හමුදාධිපති සහ යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනී ජානකී ලියනගේ මහත්මිය විසින් උණුසුම් අයුරින් පිළිගනු ලැබුවේ ඔවුන් පිළිබඳ වන බොහෝ ගෞරවණීය මතක ආවර්ජනය කරමිනි. එහිදී, දේශය තුළ අමරණීය නාමයක් හිමිකරගත් ශ්‍රේෂ්ඨ රණවිරුවකු වූ ලුතිනන් ජෙනරාල් ඩෙන්සිල් කොබ්බෑකඩුව සෙන්පති වෙත උපහාර දැක්වීම ද දේශය සුරැකීම වෙනුවෙන් පාබල හමුදා ඒකකයක් ලෙස අනුපමේය මෙහෙවරක් ඉටුකරනු ලැබූ ගජබා රෙජිමේන්තුවේ නිර්මාතෘ වන දිවංගත මේජර් ජෙනරාල් විජය විමලරත්න සෙන්පති වෙත ගෞරවාචාරය පුදකිරීමත්, යුද්ධ හමුදාධිපතිගේ අතින් සිදුකෙරුණේ කළගුණ දත් හමුදාවක ඓතිහාසික යුතුකමක් ඉටුකරමිනි. තවද, යුද්ධ හමුදා සේවා වනිතා ඒකකය විසින් සංවිධානය කළ සුබසාධන වැඩසටහනකටද එම දෙපළ වෙත ආරාධනා කෙරුණු අතර දිවංගත ඔවුනගේ ස්වාමිපුරුෂයන්ගේ මතක ආවර්ජනය කරමින් සැකසූ වීඩියෝවක්ද එහිදී ප්‍රදර්ශනය කෙරිණි.











# ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවට නව නේවාසිකාගාර ගොඩනැගිලි දෙකක්

කුරුණෑගල, හෙරලියාවල පිහිටි ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රෙජිමේන්තු මූලස්ථාන බළඇණි පරිශ්‍රයේ නවතමයෙන් ඉදිකරන ලද නේවාසිකාගාර ගොඩනැගිලි දෙකක් පසුගිය අප්‍රේල් 06 වන දින එම රෙජිමේන්තු අධිපති සහ යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ සුරතින් විවෘත කෙරිණ.

ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ මධ්‍යස්ථාන සේනාවිධායක බ්‍රිගේඩියර් එච්ජ් කීර්තිනාථ ආර්එස්පී කේඑස්පී පීඑස්සී ගේ ගෞරවනීය ආරාධනයෙන් එම අවස්ථාවට එක්වූ යුද්ධ හමුදාධිපති සෙසුනිලයන් සඳහා ඉදිකරන ලද එම නේවාසිකාගාර ගොඩනැගිල්ලෙහි නිරීක්ෂණ කටයුතු සිදුකරමින් එය ඉදිකිරීමට ශ්‍රම දායකත්වය හා තාක්ෂණික දැනුම ලබාදුන් භටපිරිස් සමගින් සුහදව අදහස් හුවමාරු කර ගත්තේය. තවද, කඳවුරු පරිශ්‍රය තුළ දැනට පවතින ප්‍රතිසංස්කරණය කිරීමට නොහැකි ගොඩනැගිලි වෙනුවට අමතර තෙමහල් නේවාසික ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ද එහිදී යුද්ධ හමුදාධිපති විසින් මුල්ගල තබන ලදී.

# ධුරයෙන් නික්මයන නවදිල්ලියේ නැමීබියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක යුද්ධ හමුදාධිපති හමුවෙයි



නවදිල්ලියේ නැමීබියානු මහ කොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක බ්‍රිගේඩියර් ජෙනරාල් ටයිටස් සයිමන් (Brigadier General Titus Simon) ඉකුත් අප්‍රේල් 20 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවී සුහද පිළිසඳරක නිරත විය.

සිය ධුරයේ රාජකාරීන් අවසන් කර නික්මයන ආරක්ෂක උපදේශකගේ සේවා කාලය තුළ යුද්ධ හමුදාව වෙතින් ලබාදුන් සහයෝගය සහ සුහදතාවය වෙනුවෙන් හෙතෙම යුද්ධ හමුදාධිපති වෙත සිය කෘතඥතාවය පුදකළේය.

# නයිජීරියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ දූත පිරිසක් යුද්ධ හමුදාධිපති හමුවෙති

දින හයක නිල සංචාරයක් සඳහා ශ්‍රී ලංකාවට පැමිණි නයිජීරියානු ජාතික ආරක්ෂක විද්‍යාලයේ එයාර් කොමඩෝරු ඔසිචිනාකා චෙඩු උබඩිකේ (*Osichinaka Chedu UBADIKE*) ඇතුළු සාමාජිකයින් 17 දෙනකුගෙන් සමන්විත දූත පිරියක් ඉකුත් අප්‍රේල් 25 වන දින යුද්ධ හමුදා මූලස්ථානයේදී යුද්ධ හමුදාධිපති ලුතිනන් ජෙනරාල් එච්එල්විඑම් ලියනගේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ හමුවූහ. අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් වන ද්විපාර්ශ්වික පුහුණු අවස්ථා, හමුදා රාජ්‍ය තාන්ත්‍රික කටයුතු සහ දෙරටේම හමුදාවන් සඳහා ප්‍රතිලාභ ලැබෙන කරුණු පිළිබඳව ඔවුහු එහිදී අදහස් හුවමාරු කරගත්හ.



# පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් සොයාබලමින්

2023 සිංහල හා දමිළ අලුත් අවුරුද්ද නිමිත්තෙන් අත්තිඩිය මිහිඳු සෙත් මැඳුරෙහි නේවාසික රණවිරුවන්ගේ සුවදුක් සොයාබලමින් ඔවුනට ත්‍යාග පිරිනැමීම සඳහා යුද්ධ හමුදාධිපති පසුගියදා එහි සංචාරයක නිරතවිය. එම සංචාරයට සමගාමීව එතුමන්ගේ මාර්ගෝපදේශ මත ජ්‍යෙෂ්ඨ නිලධාරීන් කිහිපදෙනකුද පසුගියදා "අභිමංසල 1, 2, 3" සහ "රණවිරු සෙවන" රාගම හි සංචාරයක නිරතවූහ.



"අභිමංසල 2" සුවසහන නිකේතනයේ පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා ඉකුත් අප්‍රේල් 24 වන දින ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ඩීඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ, උපකරණ මාස්ටර් ජෙනරාල් මේජර් ජෙනරාල් ජීආර්ආර්පී ජයවර්ධන ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීයූ ඇතුළු නිලධාරීහු සහභාගී වූහ.



2023 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිත්තෙන් ආරක්ෂක සේනා මූලස්ථානය (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සිඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඇතුළු නිලධාරීන් පිරිසක් "අභිමංසල 1" සුවසහන නිකේතනයේ පුනරුත්ථාපනලාභීන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා ඉකුත් අප්‍රේල් 24 වන දින සංචාරයක් සිදුකළහ.



"අභිමංසල 3" සුවසහන නිකේතනයේ රණකමිතයට පත් විරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා ඉකුත් අප්‍රේල් 24 වන දින අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ඇතුළු නිලධාරීන් සහභාගී වූහ.



ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ඉකුත් අප්‍රේල් 24 වන දින "රණවිරු සෙවන" රාගම සුවසහ නිකේතනයේ රණකමිතයට පත් විරුවන්ගේ සුවදුක් සොයාබැලීම සඳහා සංචාරයක නිරත විය.

# ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති ඒකක සංචාරයක



යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී සහ ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඉකුත් මාර්තු මස 28 වන දින පනාගොඩ ස්ථාපිත 1 වන ශ්‍රී ලංකා පාබල හමුදා මූලස්ථානය, දෙල්ගොඩ ස්ථාපිත 8 වන ශ්‍රී ලංකා පාබල හමුදාව සහ කැලණිමුල්ලේ ස්ථාපිත 2 වන (ස්වේ) ශ්‍රී ලංකා පාබල හමුදාවේ සංචාරයක නිරතවිය. එහිදී, එම හටපිරිස්වල ක්‍රියාන්විත සහ පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබලමින් ඔවුන් සමඟ සුහදව අදහස් හුවමාරු කරගත් හෙතෙම, 8 වන ශ්‍රී ලංකා පාබල හමුදා කඳවුරේ නවතමයෙන් ඉදිකරන ලද සෙයුනිල හටනිවාසය විවෘත කිරීමටද එක්විය.

## නවෝත්පාදන පාඨමාලාව අදියර 3 සහතිකපත් ප්‍රදානය

ස්වේච්ඡා බලසේනා සෙයුනිල සාමාජිකයන් වෙනුවෙන් පවත්වනු ලබන නවෝත්පාදන පාඨමාලාවේ තුන්වන අදියරෙහි සහතිකපත් ප්‍රදානෝත්සවය පසුගිය අප්‍රේල් මස 27 වන දින ස්වේච්ඡා බලසේනා සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්ජීඑස්එස් වනසිංහ ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩියූ ගේ ප්‍රධානත්වයෙන් එම මූලස්ථානයේදී පැවැත්විණ.





හරිත සෙබළා තුළින් ස්වයංව නැගී සිටිය හැකි නිර්මාණශීලී සොල්දාදුවන් පිරිසක් බිහිකිරීමත්, ඉවතලන ද්‍රව්‍ය වඩා ඵලදායීව යොදාගැනීමත් අරමුණු කරගනිමින් මෙම පාඨමාලාව ක්‍රියාත්මක කරනු ලබයි. මෙම අවස්ථාව සඳහා ස්වේච්ඡා බලසේනා නියෝජ්‍ය සේනාවිධායක මේජර් ජෙනරාල් එම්ටීකේආර් සිල්වා කේඑස්පී ඇතුළු නිලධාරීන් හා සෙබළුන් රැසක් සහභාගී වූහ.



# 33 වසරක අභිමානය උත්කර්ෂවත්ව සැමරේ





විජයබාහු පාබල රෙජිමේන්තුවේ අභිමානවත් 33 වන සංවත්සරය ඉකුත් මාර්තු මස 22 දින බෝයගනේ පිහිටි රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී උත්කර්ෂවත්ව සමරනු ලැබිය. එම රෙජිමේන්තු අධිපති, අධ්‍යක්ෂ ජෙනරාල් ප්‍රධාන මාණ්ඩලික සහ 1 වන බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් එස්යූඑම්එන් මානගේ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම සැමරුම් වැඩසටහනට එම ඒකකයේ සියලු නිලයෝ සාමූහිකව එක්වූහ.

ආගමික වතාවත්වලට මුල්තැනක් දෙමින් සංවිධානය කෙරුණු මෙම වැඩසටහනේදී රෙජිමේන්තු අධිපති වෙත රෙජිමේන්තු වර්ණ වලින් සමන්විත හමුදා සම්ප්‍රදායානුකූල ගෞරවාචාරය පුදකිරීම, දිවංගත රණවිරුවන් වෙත පුෂ්පෝපහාර දැක්වීම, සියලු නිල දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම ප්‍රධාන විය. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු නිලධාරීන්, සෙසුනිලයින්, විශ්‍රාමික නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී වූහ.


# යාපනය ප්‍රදේශයේ පවුලක් වෙත නව සෙවනක්



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) හටපිරිස්හි සම්බන්ධීකරණයෙන් ආරම්භ කරන ලද නිවාස ව්‍යාපෘතිය යටතේ තුන්නාලෙයි ප්‍රදේශයේ ඉදිකරන ලද 767 වන නව නිවස එම ප්‍රතිලාභීන් වෙත ලබාදීම ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඩීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 06 වන දින පැවැත්විණ.

55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපතිගේ මගපෙන්වීම යටතේ 4 වන ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ හටපිරිස් විසින් ඊට අවශ්‍ය ශ්‍රම දායකත්වය සහ තාක්ෂණික දැනුම ලබාදෙන ලදී. මට්ටක්කුලිය සිංහ සමාජයේ සහ මේජර් ජෙනරාල් රවී රත්නසිංහම් (විශ්‍රාමික) ගේ සම්බන්ධීකරණයෙන් තබිතා සින්නයියා මහත්මිය සහ "*Wanni Aid organization*" සංවිධානයේ මූල්‍ය දායකත්වය මේ සඳහා හිමිවිය.

# ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති හමුවෙයි



ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඩීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී පීඑස්සී ඉකුත් අප්‍රේල් 06 වන දින යාපනය විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය සිවකොළුන්දු ශ්‍රීසත්කුණරාජා මහතා හමුවී සාකච්ඡාවක නිරතවිය.

# විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලාව සාර්ථකව අවසන්





ආරක්ෂක සේනා ආඥාපති (වන්නි) මේජර් ජෙනරාල් සිඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ අධීක්ෂණය යටතේ පොම්පේමඩු බලඇණි පුහුණු පාසල මගින් පවත්වනු ලැබූ විශේෂ අතිරේක ප්‍රහාරක බණ්ඩ පුහුණු පාඨමාලා අංක - 04 ඉකුත් මාර්තු 27 වන දින එම පුහුණු පාසල් පරිශ්‍රයේදී සාර්ථකව අවසන් විය.

එම මූලස්ථානය යටතේ ස්ථාපිත 21, 54, 56, 62, සහ 65 වන පාබල සේනාංක නියෝජනය කරමින් නිලධාරීන් 10 දෙනකු සහ සෙසුනිලයන් 250 දෙනකුගෙන් යුත් බණ්ඩ 10 ක් ඊට සහභාගී වූහ. ඉකුත් පෙබරවාරි 13 වන දින ආරම්භ කළ මෙම පාඨමාලාවේ විෂය නිර්දේශය සඳහා ජී.පී.එස් අභ්‍යාස, නිරායුධ සටන් ක්‍රම (*UC*), ප්‍රභූ ආරක්ෂාව (*VIP/VVIP*), ජීව වෙඩි තැබීමේ අභ්‍යාස, සෙවීමේ සහ ගලවාගැනීමේ මෙහෙයුම්, සම්බන්ධවීමේ නීති (*ROE*), විශේෂ ක්‍රියාත්මක ක්‍රියාමාර්ග සහ අභ්‍යන්තර ආරක්ෂක රාජකාරි (*IS*) පිළිබඳ දේශන සහ ප්‍රායෝගික සැසි ඇතුළත් විය. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති එහි ජයග්‍රාහකයින්ට ත්‍යාග කුසලාන සහ සහතිකපත් ප්‍රදානය කරනු ලැබීය.

# සුබ මොහොතින් වී අස්වනු නෙලයි



ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා ගෙනයන ජාතික වැඩසටහනට සහය දැක්වීම සඳහා මහ කන්නයේදී ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) භටපිරිස් විසින් කුඹුරු අක්කර 10 ක් වගාකරන ලදී.

එහි අස්වනු නෙලීමේ මංගල්‍යය ඉකුත් මාර්තු 23 වන දින ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් නැකැත් චාරිත්‍රවාරිත්‍ර මධ්‍යයේ සුබ මොහොතින් සිදුකෙරිණ. මෙම අවස්ථාව සඳහා එම මූලස්ථානයේ මාණ්ඩලික නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට විශේෂ දිවා ආහාරයක්



මඩකලපුව දිස්ත්‍රික්කයේ මදුරන්කේනිකුලම් පාසලේ සහ කිරිමිච්චිමඩෙයි පාසලේ ළමුන් සඳහා දිවා ආහාර පාර්සල් බෙදාදීමේ වැඩසටහනක් 6 වන ගජබා රෙජිමේන්තුවේ භටපිරිස් ඉකුත් මාර්තු 24 වන දින සිදුකරනු ලැබූහ. මෙම මාහැඟි කටයුත්ත සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) ආඥාපති මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී සහ එම පවුලේ සාමාජිකයින්ගේ ධන පරිත්‍යාගය හිමිවිය.

# වියළි සලාක පරිත්‍යාගයක්

591, 592 සහ 593 වන පාබල බලසේනා බලප්‍රදේශයන්හි ජීවත්වන සිංහල දමිළ අඩු ආදායම්ලාභී පවුල් 200ක් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ ප්‍රජායත්කාරක වැඩසටහනක් 19 වන ගැමුණු සේවා බලකා ක්‍රීඩා පිටියේදී ඉකුත් අප්‍රේල් 06 වන දින පැවැත්විණ. ආරක්ෂක සේනා (මුලතිව්) ආඥාපති මේජර් ජෙනරාල් යූඩී විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවති මෙම වැඩසටහන 593 වන පාබල බලසේනා බලසේනාධිපති කර්නල් කේඩීඑල්සී විජේනායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ගේ අධීක්ෂණය යටතේ 19 වන බළඇණිය ගැමුණු සේවා බලකාය සහ 5 වන බළඇණිය ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව එක්ව සංවිධානය කරන ලදී. පූජ්‍ය නාගලගමුවේ සුමන ස්වාමීන් වහන්සේගේ මගපෙන්වීම යටතේ සංවිධානය කළ මෙම සත්කාරයට විදේශ දානපතීන්ගේ ධන පරිත්‍යාගය හිමිවිය.



# විරු කැකුළු දරුවෝ සිංහල හින්දු අලුත් අවුරුද්ද සමරති





2023 සිංහල හින්දු අලුත් අවුරුද්දට සමගාමීව පනාගොඩ පිහිටි 'විරු කැකුළු' පෙරපාසලේ "සිහිනි අවුරුදු උළෙළ" ඉකුත් අප්‍රේල් 06 වන දින පැවැත්විණ. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහ යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හිමාලි පුස්සැල්ල මහත්මිය සහභාගී වූහ. එහිදී, පෙර පාසල් දරුවන් විසින් ඉදිරිපත් කරන ලද විනෝදාත්මක ඉසව් සහ ක්‍රීඩා නැරඹූ ආරාධිත අමුත්තෝ වැඩසටහන අවසානයේ එම ළමුන් වෙත ත්‍යාග බෙදාදීමටද කටයුතු කළහ. මෙම අවස්ථාවට පෙරපාසල් කාර්යමණ්ඩලය, ගුරුවරු සහ දෙමාපියෝ රැසක්ද සහභාගී වූහ.

# පාසල් දරුවන් හා ගුරු භවතුන් හට ආහාර වේලක්



23 වන බළඇණිය ගජබා රෙජිමේන්තු බලප්‍රදේශයේ පිහිටා ඇති කිරින්දගම ප්‍රාථමික විද්‍යාලයේ දූ දරුවන් සහ ගුරුවරුන් 150 දෙනකු සඳහා පෝෂ්‍යදායී දිවා ආහාර වේලක් සහ පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 24 වන දින එම විද්‍යාලයේදී පැවැත්විණ. 122 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ගේ අධීක්ෂණය යටතේ පැවති මෙම වැඩසටහන සඳහා 23 වන බළඇණිය ගජබා රෙජිමේන්තුවේ නිලධාරීන්, සෙසුනිලයින් සහ හිතවත් දානපතියකු විසින් අනුග්‍රහය දක්වනු ලැබීය.

# ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවයට එක්වෙමින්





කොළඹ ඉසිපතන විද්‍යාලයේ ශිෂ්‍ය නායක නිල ලාංඡන පැළඳවීමේ උත්සවයක් ඉකුත් අප්‍රේල් 03 වන දින එම විද්‍යාලයේදී පැවැත්විණ. එම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්‍ෂක සේනා මූලස්ථානය (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ සහභාගී විය.

# ආගමික වැඩසටහන් සඳහා යුද්ධ හමුදා හටපිරිස් දායකත්වය දක්වති





බණ්ඩාරවෙල, හල්දුම්මුල්ල ශ්‍රී සුදර්ශනාරාම විහාරස්ථානයේ විහාරාධිපති කහගොල්ලේ ආනන්ද හිමිපාණන්ගේ ඉල්ලීමකට අනුව එම විහාරස්ථානයේ ධාතු මන්දිරය ඉදිකර වසරක් ගතවීම නිමිත්තෙන් පැවැත්වූ ආගමික වතාවත් සහ පෙරහැර සඳහා ආරක්ෂක සේනා (මධ්‍යම) ආඥාපති මේජර් ජෙනරාල් ඩබ්ලිව්ආර්එම්එම් රත්නායක ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ඇතුළු එම මූලස්ථානය යටතේ සේවයේ නියුතු විශාල පිරිසක් සහභාගී වූහ.

# සංඥා බලසේනාධිපති ඒකක සංචාරයක





ශ්‍රී ලංකා සංඥා බලකායේ බලසේනාධිපති කර්නල් එච්ඩීජේපී වීරතුංග ඉකුත් අප්‍රේල් මස 04 වන දින එම බලකායට අයත් එකම ස්වේච්ඡා ඒකකය වන 2 (සෙව්) සංඥා බලකායේ සංචාරයක නිරතවිය. ඒකක අණදෙන නිලධාරී ගේ ගෞරවනීය පිළිගැනීම් මධ්‍යයේ එහි පැමිණි බලසේනාධිපති එම ඒකකයේ රාජකාරී කටයුතු සොයා බලමින් එහි හටපිරිස් අමතන්නටද කටයුතු කළේය.

# සංචාරයක මතක සටහන්





අධ්‍යක්ෂ ජෙනරාල් මූල්‍ය කළමනාකරණ හා කෘෂි හා පශු සම්පත් බලකායේ කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඩබ්ලිව්බීඑස්එම් අබේසේකර ආර්එස්පී වීඑස්වී යූඑස්පී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාන්ති අබේසේකර මහත්මිය ඉකුත් මාර්තු 03 වන දින 4(සෙවි) යුද්ධ හමුදා කෘෂි හා පශු සම්පත් බලකායේ කඳවුරු සංචාරයක නිරතවූහ.

එම ඒකක අණදෙන නිලධාරී ලුතිනන් කර්නල් එම්එම්ඩීඑස්කේ බණ්ඩාර පීඑස්සී ඇතුළු එම හටපිරිස්වල ගෞරවනීය පිළිගැනුම් මධ්‍යයේ එහි සපැමිණි එම දෙපළ සත්කාරක වැඩසටහන් කිහිපයකටද එක්වූහ. මෙහිදී, එම ඒකකයේ රාජකාරි කරනු ලබන රණවිරුවකුගේ ආබාධිත මවක් හට රෝදපුටුවක් පරිත්‍යාග කිරීම, පාසල් ළමුන් 61 දෙනකු සඳහා පාසල් උපකරණ පරිත්‍යාග කිරීම, රණවිරු කිරින්දෑවරුන් හට ස්වයං රැකියාවක් සඳහා බිම්මල් බීජ ප්‍රදානය කිරීම මෙන්ම ඒකකයේ රාජකාරී නියුතු සෙනින් සඳහා එළවළු බීජ පරිත්‍යාග කිරීමක්ද එහිදී සිදුකෙරිණ. 4(සෙවි) කෘෂි හා පශු සම්පත් බලකායේ සෙනින් විසින් කුරක්කන් වගාකොට ලබාගන්නා ලද ලාභයෙන් රුපියල් 50,000.00 ක මුදලක් රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ අභිවෘද්ධිය උදෙසා සේවා වනිතා ශාඛාවේ සභාපතිනිය වෙත පරිත්‍යාග කිරීමද එහිදී සිදුවිය.

# 61 වන පාබල සේනාංකයෙන් සත්කාරයක්



61 වන පාබල සේනාංකයේ රාජකාරී නියුතු සොල්දාදුවකුගේ දරුවන් 05 දෙනකු වෙත පාසල් උපකරණ බෙදාදීම හා එම සේනාංකයේම සේවයේ නියුතු සිවිල් සේවිකාවකගේ ආබාධිත දරුවකු වෙත රෝද පුටුවක් පරිත්‍යාග කිරීමේ මාහැඟි කටයුත්තක් පසුගිය මාර්තු 22 වන දින සිදුකෙරිණ. අදාළ ළමුන් වෙනුවෙන් රුපියල් 90,000/- ක වටිනාකමකින් යුත් පාසල් උපකරණ බෙදාදුන් අතර, ඒ සඳහා කොළඹ ඩීඑස් සේනානායක විද්‍යාලයේ සේවය කරන අශා නිපුනි උපෙන්ද්‍රා මහත්මිය අනුග්‍රාහකත්වය දැරූ අතර, ජීවන් ප්‍රභාත් ලියනගේ යන අය සහ ඔහුගේ හිතවත් මිතුරු කැල අදාළ රෝද පුටුව සඳහා අනුග්‍රහය ලබාදුන්හ. මෙම වැඩසටහන 61 වන සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එච්එම්යූ හේරත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එච්ඩීඑම්සී පීඑස්සී ගේ උපදෙස් මත එහි සිවිල් සම්බන්ධීකරණ නිලධාරී ලුතිනන් කර්නල් ජේඊඑල් ද සොයිසා ගේ සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කෙරිණ.

# යටිතල පහසුකම් නංවමින්



11(සෙවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු බලප්‍රදේශයට අයත් කෙවිලියාමඩුව, 23 කණුව, පුළුකුණාව, කාච්චකොඩි යන ගම්මානය තුළ ජීවත්වන ගර්භණී මව්වරුන්ගේ හා ළදරුවන්ගේ සායන කටයුතු සිදුකිරීම සඳහා මෙතෙක් ස්ථිර ස්ථානයක් නොතිබිණි. ඒ පිළිබඳ කෙවිලියාමඩුව පවුල් සෞඛ්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව ඒ සඳහා එම ප්‍රදේශයේ ගරාවැටුණු ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කරදීමට 11(සෙවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු හටපිරිස් විසින් කටයුතු කරනු ලැබූහ.

ඉකුත් මාර්තු 26 වන දින ඉදිරිකිරීම් කටයුතු ආරම්භ කළ එම ගොඩනැගිල්ල ඉකුත් අප්‍රේල් 07 වන දිනට යෙදුණු සුබ මොහොතින් ආදල නිලධාරීන් හට භාරකෙරිණ. එංගලන්තයේ සේවයේ නියුතු නාදීර කහපිටිය මහතා හා ඔහුගේ මිතුරන් ඊට ධන පරිත්‍යාගය සැපයූහ. මෙම අවස්ථාවට 231 වන පාබල බලසේනාවේ බලසේනාධිපති, 11(සෙවි) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු නිලධාරීන් සහ සෙසුනිලයින් පිරිසක් සහභාගී වූහ.

# තැන තැන අවුරුදු අසිරිය





ශ්‍රී ලංකා පාබල හමුදා හටපිරිස් විසින් එම රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේ ස්ථාපිත *'Russie Hein'* ක්‍රීඩා පිටියේදී සංවිධානය කරන ලද සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයක් යුද්ධ හමුදා මාණ්ඩලික ප්‍රධානී හා ශ්‍රී ලංකා පාබල හමුදාවේ රෙජිමේන්තු අධිපති මේජර් ජෙනරාල් සීඩී වීරසූරිය ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ සහ එහි සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දනූෂා වීරසූරිය මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 06 වන දින පවත්වනු ලැබූහ.





ආරක්ෂක සේනා (වන්නි) ආඥාපති මේජර් ජෙනරාල් සීඩී රණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත එම මූලස්ථානය මඟින් සංවිධානය කළ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයක් ඉකුත් අප්‍රේල් 06 වන දින එම මූලස්ථාන පරිශ්‍රයේදී උත්කර්ෂවත් ලෙස පවත්වනු ලැබිය.





ආරක්ෂක සේනා මූලස්ථානය (නැගෙනහිර) විසින් සම්ප්‍රදායිකව පවත්වනු ලබන වාර්ෂික සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය ඉකුත් අප්‍රේල් 09 වන දින ආඥාපති, මේජර් ජෙනරාල් එස්ආර්කේ හෙට්ටිආරච්චි ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් එම කඳවුරු පරිශ්‍රයේදී පැවැත්විණ.






2023 සිංහල හා හින්දු අලුත් අවුරුද්ද නිමිති කොටගෙන 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරෙ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් සංවිධානය කෙරුණු අවුරුදු උත්සවයක් ඉකුත් අප්‍රේල් 11 වන දින 1 වන ශ්‍රී ලංකා රයිෆල් බලකා කඳවුරු භූමියේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්විණ.




55 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එම්කේයූපී ගුණරත්න ආර්එස්පී එන්ඩියූ පීඑස්සී අයිජී ගේ මඟපෙන්වීම යටතේ පළෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, පොලිස් ස්ථානය, වෙළඳ සංගමය, අනෙකුත් සිවිල් සංගම් සහ පරිත්‍යාගශීලීන් සමඟ සම්බන්ධතාවයෙන් යුතුව සංවිධානය කෙරුණු අලුත් අවුරුදු උත්සවයක් ඉකුත් අප්‍රේල් 10 වන දින පළෙයි මහජන ක්‍රීඩාංගණයේදී පැවැත්විණ.



4 වන බළඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ රාජකාරී නියුතු සියළුම නිලධාරීන් සහ සෙසුනිලයින්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු අලුත් අවුරුදු උත්සවයක් එම ඒකක මූලස්ථාන පරිශ්‍රයේදී පෙළ සිරිත්විරිත්වලට මුල්තැනක් දෙමින් ඉකුත් අප්‍රේල් 14 වන දින පැවැත්විණ.



52 වන පාබල සේනාංකය යටතේ රාජකාරියෙහි නියුතු සියලු නිලයන්ගේ සහභාගීත්වයෙන් එම මූලස්ථාන පරිශ්‍රයේදී සංවිධානය කෙරුණු අලුත් අවුරුදු උත්සවයක් ඉකුත් අප්‍රේල් 08 වන දින පැවති අතර, ඒ සඳහා සම්ප්‍රදායික ක්‍රීඩා සහ විනෝදාත්මක අංග රැසක් ඇතුළත් විය.

2023 සිංහල හා හින්දු අලුත් අවුරුද්දට සමගාමීව ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) මගින් සංවිධානය කළ අලුත් අවුරුදු උත්සවයක් එහි ආඥාපති මේජර් ජෙනරාල් ගුයි විජේසේකර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී ආර්සීඩීඑස් පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 22 වන දින පුදුකුඩුඉරිප්පු ප්‍රාදේශීය ක්‍රීඩාංගනයේදී පැවැත්විණ.









22 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්බී අමුණුගම ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මඟපෙන්වීම මත සහ එම සේනාංක හටපිරිස්වල මූලිකත්වයෙන් සංවිධානය කෙරුණු සිංහල හා දමිළ අලුත් අවුරුදු උත්සවයක් ඉකුත් අප්‍රේල් 09 වන දින එම කඳවුරු පරිශ්‍රයේදී පවත්වනු ලැබීය.





ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) ආඥාපති මේජර් ජෙනරාල් ඩීජීඑස්එන් බෝතොට ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ මඟපෙන්වීම මත සංවිධානය කරනු ලැබූ සිංහල හා දමිළ අලුත් අවුරුදු උත්සවයක් ඉකුත් අප්‍රේල් 10 වන දින යාපනය, පලාලි ක්‍රීඩා පිටියේදී පැවැත්විණ.





සිංහල සහ දමිළ අලුත් අවුරුද්ද වෙනුවෙන් 51 වන පාබල සේනාංකය විසින් සංවිධානය කරනු ලැබූ අලුත් අවුරුදු උත්සවයක් ඉකුත් අප්‍රේල් 15 වන දින යාපනය දොරෙඅප්පා ක්‍රීඩාංගනයේදී පවත්වන ලදී.

# 13 වසරක අභිමානය සමරයි




221 වන පාබල බලසේනාවේ 13 වන සංවත්සරය නිමිත්තෙන් ඉකුත් මාර්තු 12 දින සිට 17 දින දක්වා ආගමික වතාවත්වලට මුල්තැන දෙමින් වැඩසටහන් මාලාවක් පැවැත්විණි. එහිදී, ගෝකන්න රජ මහා විහාරස්ථානයේ දී භික්ෂූන් වහන්සේ 07 නමකගේ සහභාගීත්වයෙන් පැවති දානමය පිංකම, ත්‍රිකුණාමලය කෝනේශ්වරම් කෝවිලේ සහ ගල් දේවස්ථානයේ පූජා උත්සව, බලසේනාධිපති වෙත සම්මාන මුරයක් පිරිනැමීම, සියලු නිලයන් සඳහා පැවති දිවා භෝජන සංග්‍රහය බලසේනා පරිශ්‍රයේ පැවති සංගීත සංදර්ශනය සංවත්සර දින වැඩසටහන් අතර සුවිශේෂී තැනක් ගන්නා ලදී.

# 14 වන බළඇණි දිනය සමරමින්




ඉකුත් මාර්තු 30 වන දිනට යෙදීතිබූ 17 (සෙව්) ශ්‍රීලපාහ ඒකකයේ 14 වන බළඇණි දිනය අභිමානවත් අයුරින් සැමරිණි. එහිදී දිවිපිදූ, ආතුරුදහන් රණවිරුවන් හට පිං අනුමෝදන් කිරීමත්, රණසිතයට පත් විරුවන්ට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කිරීමත්, දැනට සේවයේ යෙදී සිටින සියලුම නිලයන් හට සෙත්පැතීමත් අරමුණු කර ගනිමින් ඉකුත් මාර්තු 26 වන දින රාත්‍රී ධර්ම දේශනාවක් පවත්වා පසුදින මහා සංඝරත්නය උදෙසා සාංඝික දානමය පිංකමක් ද සිදුකරන ලදී. තවද, ඒකක කණ්ඩායම් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් ක්‍රිකට් තරගාවලියක් පැවැත්වීම, සෙසුනිල සුහද හමුවක් හා දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම මෙන්ම ඒකක අණදෙන නිලධාරීන් විසින් හටපිරිස් ඇමතීම සංවත්සර දින වැඩසටහන් අතර කැපීපෙණුනි.

# 31 වන සංවත්සරය අභිමානවත්ව සමරයි




වේයන්ගොඩ මධ්‍යම අවි පතුරෝම් ගබඩාවේ සිය 31 වන සංවත්සරය සියළුම නිලයින්ගේ සහභාගීත්වයෙන් යුතුව ඉකුත් මාර්තු 23 වන දින අතිඋත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. එහි සේනාවිධායක කර්නල් කේපීඑන්එස්කේ කාරියවසම් එල්එස්සී ඒඒම් හට කඳවුරු ආරක්ෂක මුරයක් හා සම්මාන පෙළපාළියක් පිරිනමමින් ඇරඹි වැඩසටහන් අතර, සියලු නිල භෝජන සංග්‍රහය රාත්‍රියේ පැවති සංගීත ප්‍රසංගය මෙන්ම සියලු නිලයින්ට සෙත්පතා පැවති බෝධිපූජා පිංකම ප්‍රධාන විය.

# පරිගණක පාඨමාලාව සාර්ථකව අවසන්

ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) අර්ධද්වීපයේ සේවයේ නියුතු භටපිරිසහි තොරතුරු තාක්ෂණ හැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් යාපනය 7 වන රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනයේදී පවත්වනු ලැබූ "පරිගණක නිපුණතා බලපත්‍ර පාඨමාලාව" පසුගිය අප්‍රේල් 04 වන දින සාර්ථකව අවසන් විය. ආරක්ෂක සේනා (යාපනය) ආඥාපති ගේ උපදෙස් මත සංවිධානය කර මසක කාලයක් පුරා පවත්වන ලද මෙම පාඨමාලාවට සෙබළුන් 17 දෙනකු සහභාගී වූහ. මෙහි සහතිකපත් ප්‍රදානෝත්සවයට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස ආරක්ෂක සේනා මූලස්ථානය (යාපනය) බ්‍රිගේඩියර් ප්‍රධාන මාණ්ඩලික නිලධාරී බ්‍රිගේඩියර් කේඑන්ඩී කරුණාපාල ආර්එස්පී එන්ඩියූ සහභාගී විය.



# පාපැදි අලුත්වැඩියා කිරීමේ වැඩසටහනක්





55 වන පාබල සේනාංකයේ මූලිකත්වයෙන් එම සේනාංකය යටතේ ස්ථාපිත සියලුම බලසේනා සහ ඒකකවල භාවිතයට නුසුදුසු හා අමතර කොටස් නොමැතිව තිබූ පාපැදි 42 ක් ඉකුත් මාර්තු 30 වන දින අලුත්වැඩියා කරනු ලැබීය.

ඉන්ධන වියදම් සහ පරිසර දූෂණය අවම කිරීමටත්, ශරීර සෞඛ්‍යය යහපත් කරවීමත් අරමුණු කොටගෙන දියත් කළ මෙම වැඩසටහනේදී දීර්ඝ කලක් පුරාවට අමතර කොටස් නොමැතිකමින් සහ නිසි නඩත්තුවක් නොමැතිව භාවිතයට නුසුදුසු තත්වයෙන් පැවති පාපැදි සියල්ලම සති කිහිපයක් ඇතුළත එක් තැනකට රැස්කර අවම පිරිවැයකින් අලුත්වැඩියා කටයුතු සිදුකිරීම ආරම්භ කෙරිණ. 55 වන පාබල සේනාංකයේ කර්නල් පාලන සහ හටකාර්ය සම්පාදන නිලධාරී ඇතුළු තවත් නිලධාරීන් කිහිපදෙනකුගේ සහභාගීත්වයෙන් එලෙස අලුත්වැඩියා කරන ලද පාපැදි අදාළ බලසේනා සහ ඒකක වෙත බෙදාදෙනු ලැබූහ.

# "කනිෂ්ඨ උපදේශක පාඨමාලා අංක - 100" සාර්ථකව අවසන්



අම්පාර සටන් පුහුණු පාසලේ පැවති "කනිෂ්ඨ උපදේශක පාඨමාලා අංක - 100" හි සහතිකපත් ප්‍රදානෝත්සවය පසුගිය මාර්තු මස 31 වන දින එම පුහුණු පාසල් ශ්‍රවණාගාරයේදී පැවැත්විණි. ජනවාරි මස 09 වන දින ආරම්භ කළ මෙම පාඨමාලාව විවිධ පැතිකඩ ඔස්සේ පුහුණු කරනු ලැබීය. කොමිෂන් නොලත් නිලධාරීන් යුද්ධ හමුදාවේ උපදේශකයින් ලෙස හැඩගැස්වීම එහි අරමුණ වූ අතර, මෙම පාඨමාලාව සඳහා පිරිමි සහ කාන්තා කොමිෂන් නොලත් නිලධාරීන් 70 දෙනකු සහභාගී වූහ. පාඨමාලාවේ සියු සිසුවියන් වෙත සහතිකපත් සහ ඇගයීම් සංකේත ප්‍රදානය කිරීමේ අවස්ථාවට ප්‍රධාන අමුත්තා ලෙස එම සටන් පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් ආර්පී මුණසිංහ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී සහභාගී විය. එහිදී පාඨමාලාවේ ප්‍රථම ස්ථානය 1 වන ශ්‍රී ලංකා පාබල හමුදාවේ ලාන්ස් කෝප්‍රල් ගුණවර්ධන ඩබ්ලිව්ජීකේඑස් දිනාගනු ලැබීය.



# සයුරෙන් එතෙර පෑ හපන්කම්

ඉකුත් ජනවාරි මස 23 දින සිට මාර්තු මස 26 දින දක්වා ඉන්දියාවේ ධනා හි කොමිෂන් නොලත් නිලධාරී විද්‍යාපීඨයේදී (*NCO Academy*) "කණිෂ්ඨ සංග්‍රාමික නායකත්ව" පාඨමාලා අංක - 50 (*Junior Combat Leadership*) පැවැත්විණි. එහිදී, ඊට සහභාගී වූ සියලු විදේශීය සිසුන් අභිබවා ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ සැරයන් බෝධිපක්ෂ විඑස් පාඨමාලාවේ දක්ෂතම විදේශ ශිෂ්‍යයාට හිමි සම්මානය හිමිකර ගත්තේය.



ඉන්දියාවේ බෙල්ගාම් කමාන්ඩෝ පුහුණු පාසලේ පවත්වන ලද කමාන්ඩෝ පාඨමාලා අංක - 334 හි "දක්ෂතම විදේශීය ශිෂ්‍යයාට" හිමි සම්මානය 14 ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ ලාන්ස් කෝප්‍රල් ගුණරත්න ඊඑම්කේවල් හිමිකර ගත්තේය. මාසයක කාලයක් පුරා පැවති මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් නිලධාරීන් සිව්දෙනෙක් සහ සෙබළුනිලයින් සිව්දෙනෙක් සහභාගී වූහ. බෙල්ගාම් කමාන්ඩෝ පුහුණු පාසල ඉන්දියානු හමුදාවේ තරුණ සෙබළුන්ට සහ නිලධාරීන්ට කමාන්ඩෝ පුහුණුව ලබාදෙන ප්‍රමුඛතම පුහුණු පාසලකි.




දේශීය හා විදේශීය ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් 156 දෙනකුගේ සහභාගිත්වයෙන් පැවති "*Potential Subedar Major* පාඨමාලා අංක - 154" පසුගිය පෙබරවාරි මස 10 දින සිට මාර්තු මස 16 දින දක්වා ඉන්දියාවේ බැරේලි ප්‍රදේශයේ පිහිටි "ජූනියර් ලීඩර්ස්" (*Junior Leader's*) හිදී පැවැත්විණි. මෙම පාඨමාලාව සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නියෝජනය කරමින් ජ්‍යෙෂ්ඨ කොමිෂන් නොලත් නිලධාරීන් 10 දෙනකු සහභාගී වූ අතර, එහිදී ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුවේ බලලත් නිලධාරී II නාගහපිටිය එන්ජීඩීසී පාඨමාලාවේ ප්‍රථම ස්ථානය දිනාගැනීමට සමත්විය.

## නිලධාරී පුහුණු දිනය සාර්ථකව අවසන්





24 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ඩබ්ලිව් චන්ද්‍රසිරි ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ උපදෙස් සහ මගපෙන්වීම මත එම සේනාංකයට අයත් නිලධාරීන්ගේ පුහුණු දිනය ඉකුත් අප්‍රේල් 08 වන දින අක්කරෙයිපත්තුව 241 වන පාබල බලසේනා මූලස්ථාන සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවැත්විණි. මෙම පුහුණු දින වැඩසටහනේ ප්‍රධාන අරමුණ වූයේ අම්පාර දිස්ත්‍රික්කයේ යුද්ධ හමුදාව රාජකාරියෙහි නිරත ප්‍රදේශයන්හි ඇති ආර්ථික, සමාජීය, ආගමික හා වෙනත් ගැටලු හඳුනාගැනීම සහ එය නිරාකරණය කරගැනීම මෙන්ම අවම කිරීම සඳහා සුදුසු යෝජනා හා නිර්දේශ ඉදිරිපත් කිරීමයි. මෙම අවස්ථාවට 241 හා 242 වන පාබල බලසේනාවල බලසේනාධිපතිවරු, 24 වන පාබල සේනාංකයේ සහ බලසේනාවන්හි මාණ්ඩලික නිලධාරීවරු, ඒකක අණදෙන නිලධාරීන් ඇතුළු 40 කට අධික පිරිසක් සහභාගී වූහ.

# බළඇණි පුහුණු පාඨමාලාව අරඹමින්





2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ බළඇණි පුහුණු පාඨමාලාව ඉකුත් මාර්තු 22 වන දින බළඇණි පුහුණු පාසල - අරසපුරකුලම් හිදී ආරම්භ කෙරිණ. දින 40 ක් පුරා පැවැත්වුණු එම පාඨමාලාව මැයි 16 වන දින අවසන්වීමට නියමිතව ඇත. එහිදී, බළඇණි පුහුණුවීම්හි වැදගත්කම හා එමගින් ලැබෙන ප්‍රතිඵල පිළිබඳව හටපිරිස් දැනුවත් කරමින් එම පාඨමාලාවේ ආරම්භක දේශනය 66 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්කේඑන්සී ජයවර්ධන ආර්එස්පී එන්ඩීසී විසින් සිදුකරන ලදී.

# යුද හමුදා යුද විද්‍යාලයේ පාඨමාලා රැසක් සාර්ථකව අවසන් කෙරේ








යුද හමුදා යුද විද්‍යාලය බුත්තල වෙතින් පවත්වන ලද ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාව අංක 07, කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලා අංක 26 හා කණිෂ්ඨ මාණ්ඩලික පාඨමාලා අංක 23 යන පාඨමාලා පසුගිය අප්‍රේල් 08 වන දින නිමාවට පත්වූ අතර, එහි සහතිකපත් ප්‍රදානෝත්සවය එම විද්‍යාලයේ සේනාවිධායක බ්‍රිගේඩියර් වයිඑම්එම් යහම්පත් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී පීඑස්සී ගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ. එහිදී, සමස්ත නිලධාරීන් 130 කගේ සහභාගීත්වයෙන් පවත්වන ලද එම පාඨමාලාවන්හි ජ්‍යෙෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාවේ පළමු ස්ථානය ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් මේජර් ටීආර් වීරසිංහ ආර්ඩබ්ලිව්පී යූඑස්පී පීඑස්සී ද කණිෂ්ඨ අණදෙන්නන්ගේ පාඨමාලාවේ පළමු ස්ථානය කාලතුවක්කු හමුදාවේ මේජර් කේඩීඑස් සිල්වා ද කණිෂ්ඨ මාණ්ඩලික පාඨමාලාවේ පළමු ස්ථානය ශ්‍රී ලංකා ඉංජිනේරු බලකායේ කපිතාන් කේපී කළුආරච්චි ද හිමිකරගත්හ.

# සංග්‍රාමික ප්‍රවාහන කණ්ඩායම් (මාලි) පාඨමාලාව





නුදුරේදී මාලි රාජ්‍යයේ සාමසාධක මෙහෙයුම් රාජකාරී සඳහා පිටත්ව යාමට නියමිත නිලධාරීන් 40 ක් සහ සෙසුනිලයින් 324 දෙනකුගෙන් යුත් ශ්‍රී ලංකා සාමසාධක බළඇණිය සඳහා වූ "සංග්‍රාම ප්‍රවාහන කණ්ඩායම් (මාලි) පාඨමාලාව අධියර 05" ඉකුත් මාර්තු 03 වන දින සිට අප්‍රේල් 08 වන දින දක්වා පැවැත්විණ. මෙම පාඨමාලාවේ අවසන් දේශනය මාදුරුඔය යුද්ධ හමුදා පුහුණු පාසලේ සේනාවිධායක බ්‍රිගේඩියර් කේඒඩබ්ලිව්එන්එච් බණ්ඩාරනායක යූඑස්පී විසින් සිදුකරන ලදී.

# සිවිල් සේවක මහතුන්ගේ දරුවන්ට පාසල් උපකරණ පරිත්‍යාගයක්





57 වන පාබල සේනාංකය යටතේ සේවයේ නියුතු සිවිල් සේවක මහත්වරුන් 14 දෙනකුගේ දරුවන් 20 දෙනකුට පාසල් උපකරණ බෙදාදීමේ මාහැඟි වැඩසටහනක් ඉකුත් මාර්තු 30 වන දින සිදුකෙරිණ. එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ජේපීසී පීරිස් ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩීසී ගේ මගපෙන්වීම මත ක්‍රියාත්මක කළ එම සත්කාරය සඳහා මීගමුවේ ව්‍යාපාරිකයන් දෙදෙනකු වන ජීවන්ත ප්‍රනාන්දු මහතා සහ ටෙරන්ස් ප්‍රනාන්දු යන මහත්වරු අනුග්‍රහකත්වය දක්වනු ලැබූහ.

# පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයේ ඒකක සංචාරයක්

68 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස් කස්තුරිමුදලි ආර්එස්පී එන්ඩීසී පීඑස්සී පසුගිය මාර්තු 13 වන දින පුදුකුඩුඉරිප්පු ප්‍රදේශයේ පිහිටි 3 වන (ස්වේච්ඡා) විජයබාහු පාබල රෙජිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවක නිරත විය. එහිදී, එම ඒකකයේ ක්‍රියාන්විත හා පාලන අවශ්‍යතා පිළිබඳ සොයා බැලූ හෙතෙම එහි හටපිරිස් අමතන්නටද අමතක නොකළේය.





# සිවිල් වැසියන් සඳහා නව ජල පවිත්‍රාගාරයක්



593 වන පාබල බලසේනාවේ හටපිරිස් හමුදා සිවිල් සහයෝගීතාවය ප්‍රවර්ධනය කරමින් එම බලසේනා පිවිසුම අසල ස්ථාපිත කරන ලද නව ජල පිරිපහදු ඒකකය ඉකුත් අප්‍රේල් 6 වන දින 59 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් ආර්එම්එම් රණසිංහ ඩබ්ලිව්ඩබ්ලිව්වී ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ සුරතින් විවෘත කෙරිණ. සේනාංකාධිපති ගේ සම්බන්ධීකරණයෙන් විදේශීය මිතුරන් පිරිසක් මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය අනුග්‍රහය ලබාදුන්හ.

# උතුම් ගුණයට පැතුම් කළඹක්



පසුගිය මාර්තු මස 24 වන දින පුත්තලම - ආණමඩුව මාර්ගයේ කොට්ටුකච්චිය ප්‍රදේශයේදී ශ්‍රී ලංගම බස් රථයක ගමන්ගත් ජීවිතයත් මරණයත් අතර සටනක යෙදී සිටි මහියකුගේ ජීවිතය බේරාගැනීමට යුද්ධ හමුදා නිලධාරියකු සමත්විය. කුලියාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉඩම් අංශයේ සේවය කරනු ලබන නිලධාරිනියක එදින පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති සම්මන්ත්‍රණයකට සහභාගීවීමෙන් අනතුරුව  බස් රථයෙන් සිය නිවස බලායමින් සිට ඇත. එම අතරවාරයේදී ඇයට හදිසියේම හෘදයාබාධ තත්වයක් හටගෙන තිබේ. එම බස් රථයේ ඒ වනවිට මගීන් 60 දෙනකුට අධික පිරිසක් සිටියද, එම කිසිදු අයකුට අදාළ කාන්තාවට අවශ්‍ය ප්‍රථමාධාර ලබාදීමට තරම් දැනුමක් නොවීය.

මේ අතර පුත්තලම ආධුනික පුහුණු පාසලේ සේවයේ නියුතු 4 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අයත් මේජර් ආර්එච්එම් සුගත් රාජකරුණා ඒ වනවිට එම බස් රථයේ ගමන්ගනිමින් සිට තිබුණේ එම රෝගී වූ කතගේ වාසනාවකට මෙනි. එහිදී, වහාම ක්‍රියාත්මක වූ එම නිලධාරී බස් රථයේ සිටි පෞද්ගලික රෝහලක සේවය කරනු ලබන මගී කාන්තාවකගේද සහයෝගය ඇතිව කඩිනමින් ඇයට මූලික ප්‍රථමාධාර ලබාදෙනු ලැබූහ. ඒ අතරම "1990" ගිලන්රථ සේවයට දැනුම්දීමටද කටයුතු කළ නමුත්, අවාසනාවකට ඒ මොහොතේ එහි සේවාව ලබාගැනීමට අපොහොසත්වූ හෙයින් ඔහු වහාම ක්‍රියාත්මකව සිය මිතුරකුගේ මෝටර් රථයක් ගෙන්වා අදාළ රෝගී කාන්තාව ආණමඩුව රෝහල වෙත රැගෙනයනු ලැබීය. නිසි අවස්ථාවේදී අවශ්‍යය ප්‍රථමාධාර ලබාදී එලෙස එම කාන්තාව රෝහලට ගෙන නොගියේ නම් ඇය ජීවිතක්ෂයට පත්වීමේ හෝ සදාකාලික අංගභාග තත්වයකට පත්වීමේ අවධානමක් පැවති බව එහිදී රෝහලේ විශේෂඥ වෛද්‍යවරු පැවසූහ. සොල්දාදුවකු සතු බහුවිධ හැකියාවන් සහ වෘත්තීය ප්‍රවීණත්වය පිළිබිඹු කරමින් මේජර් සුගත් රාජකරුණා විසින් සිදුකළ එම උතුම් ක්‍රියාව හරහා ඔහු සිය රෙජිමේන්තුවටද සමස්ත යුද්ධ හමුදාවටද අත්කරදී ඇත්තේ අමිල වටිනාකමකි. ඔහුගේ ඒ උතුම් ගුණයට "රණවිරුවා" ද මෙසේ පැතුම් මල් කළඹක් පුදන්නේය.



ඉකුත් අප්‍රේල් 18 වන දින පස්වරුවේ බූස්ස දුම්රිය ස්ථානයේ සිදුවන්නට ගිය මංකොල්ලයක් වළක්වාලීමට යුද්ධ හමුදා වීරෝදාර රණවිරුවකු සමත්වූ පුවතක් පසුගියදා වාර්තා විය.

බූස්ස ප්‍රදේශයේ ස්ථාපිත 61 වන පාබල සේනාංක මූලස්ථානයට අනුයුක්තව සේවයේ නියුතු ඉංජිනේරු සෙබළ කුමාර ආර්ජීඩී මෙම සිදුවීම සිදුවන අවස්ථාවේ රාජකාරි කරමින් සිට ඇත්තේ බූස්ස දුම්රිය ස්ථානයේය. එම අවස්ථාවේදී දුම්රිය නැවතුම්පොළේ නතරකර තිබූ දුම්රිය ගමන් ආරම්භ කිරීමට සූදානම්ව සිටියදී සොරකු විසින් එහි සිටි කාන්තාවකගේ රන්මාලය කඩාගෙන පලාගොස් ඇත. ඒ මොහොතේ එය දුටු ඉංජිනේරු සෙබළ කුමාර වහා ක්‍රියාත්මකව ඒ පසුපස ලුහුබැඳ ගොස් එම සොරා මෙල්ලකර ඔහුව ජීවග්‍රාහයෙන් අල්ලා රත්ගම පොලිස් ස්ථානයේ නිලධාරීන් වෙත භාරදීමට කටයුතු කරනු ලැබීය. සිය රෙජිමේන්තුවටද යුද්ධ හමුදාවටද අභිමානයක් එක්කළ එම රණවිරුවාගේ වීරත්වය වෙනුවෙන් රණවිරුවා ද මෙලෙස උපහාර පුදනු ලබයි.

## ආබාධිත පුද්ගලයකු හට පරිත්‍යාගයක්



652 වන පාබල බලසේනා බලප්‍රදේශයේ නවිඩන්කණ්ඩාල් ග්‍රාමසේවා වසමේ පදිංචි ආබාධිත පුද්ගලයකු වන පරනිදරන් නර්මදන් යන අය  වෙත අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, ඇඳුම් පැළඳුම් ඇතුළු බඩු භාණ්ඩ පිරිනැමීමේ කටයුත්තක් ඉකුත් මාර්තු 15 වන දින සිදුකෙරිණි. එම අවස්ථාවට එහි බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්ජීයූඑස් වනසිංහ ආර්ඩබ්ලිව්පී යූඑස්පී එක්විය.

## 553 වන පාබල බලසේනාවෙන් පාසල් උපකරණ පරිත්‍යාගයක්



යුද්ධ හමුදාව හා සිවිල් වැසියන් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් යාපනය මරුදන්කේනි ප්‍රදේශයේ අඩුආදායම්ලාභී පවුල්වල සිසු සිසුවියන් සඳහා රුපියල් 9000.00 ක වටිනාකමකින් යුත් පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් මාර්තු 27 වන දින මරුදන්කේනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි සංස්කෘතික මධ්‍යස්ථානයේදී පැවැත්විණ. 553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් ජීඩීජේසී ප්‍රේමතිලක යූඑස්පී පීඑස්සී ගේ අධීක්ෂණය යටතේ 10(සෙවි) විජයබාහු පාබල රෙජිමේන්තු අණදෙන නිලධාරී මේජර් කේඑච්සී සමන්ප්‍රිය ගේ සම්බන්ධීකරණයෙන් පැවති මෙම වැඩසටහන සඳහා අනුග්‍රාහකත්වය *"Help and Helper Foundation"* පදනම විසින් ලබාදෙන ලදී.

## සිවිල් සේවක මහතුන් වෙත වියළි සලාක පරිත්‍යාගයක්



11 වන පාබල සේනාංක මූලස්ථානයේ රාජකාරී නියුතු සිවිල් සේවක මහතුන් සඳහා වියළි සලාක මළු බෙදාදීමේ වැඩසටහනක් එම පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් එස්ආර්බී අළුවිහාරේ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී එන්ඩියූ පීඑස්සී ගේ මූලිකත්වයෙන් ඉකුත් අප්‍රේල් 10 වන දින එම සේනාංක මූලස්ථානයේදී පැවැත්විණ. ඒ සඳහා අනුග්‍රාහක දායකත්වය ගරුතර යටිහලගල රජමහා විහාරාධිපති පූජ්‍ය හඳගනාවේ ධම්මාධාර ස්වාමීන් වහන්සේ විසින් දරනු ලැබූහ.

## තතු විත්ති සොයා ඒකක නිරීක්ෂණ සංචාරයක



511 වන පාබල බලසේනාවේ බලසේනාධිපති කර්නල් රොඩ්රිගෝ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී පීඑස්සී ඉකුත් මාර්තු 17 වන දින 9(සෙවි) බලඇණිය ශ්‍රී ලංකා පාබල හමුදාවේ සංචාරයක නිරතවිය. එහිදී එම ඒකකයේ පාලන අවශ්‍යතා පිළිබඳ සොයාබැලූ අතරම එහි හටපිරිස් අමතන්නටද කටයුතු කළේය.

## හටපිරිස් සඳහා පහසුකම් සංකීර්ණයක්



231 වන පාබල බලසේනාවේ හටපිරිස් වෙනුවෙන් නවතමයෙන් ඉදිකරනු ලැබූ පහසුකම් සංකීර්ණයක් ඉකුත් මාර්තු 15 වන දින එහි බලසේනාධිපති බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එන්කේඩී බණ්ඩාර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී පීඑස්සී ගේ සුරතින් විවෘත කෙරිණ. මෙම පහසුකම් සංකීර්ණය ආපන ශාලාවකින්, පුවත්පත් කියවීමේ මධ්‍යස්ථානයකින් සහ කරනවෑම් හලකින් සමන්විතය.





## පෙරපාසල් ළමුන් වෙත දිවා ආහාර වේලක්

52 වන පාබල සේනාංකයේ හටපිරිස් පසුගිය මාර්තු මස 31 වන දින යාපනය, නාවට්කුලි ප්‍රදේශයේ පිහිටි "විරුදරු" පෙර පාසලේ ඉගෙනුම ලබන ළමුන් සඳහා දිවා භෝජන සංග්‍රහයක් පිරිනැමූහ. නාවට්කුලි "විරුදරු" පෙර පාසල නාවට්කුලි ප්‍රදේශයේ පිහිටි එකම දමිළ/සිංහල මිශ්‍ර පෙර පාසල වන අතර එම පෙරපාසලේ බහුතරයක් සිංහල ළමෝ වෙති. 52 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති මේජර් ජෙනරාල් කේපීඑස්ජ් ප්‍රනාන්දු ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ඇතුළු සිය පවුලේ සාමාජිකයින් මෙම සත්කාරය සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබාදෙනු ලැබූහ.

## පාසල් උපකරණ පරිත්‍යාග කිරීමේ වැඩසටහනක්



අබගස්වැව අශෝක ජයන්ති ප්‍රාථමික විද්‍යාලයේ 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා ඉගෙනුම ලබන සිසු සිසුවියන් 49 දෙනකු සඳහා රුපියල් 5000.00 ක වටිනාකමකින් යුත් පොත් කට්ටල පරිත්‍යාග කිරීම සහ ගුරුවරුන් 06 දෙනකුගේ සේවය අගයා ත්‍යාග ප්‍රදානය කිරීමේ වැඩසටහනක් ඉකුත් මාර්තු 16 වන දින පැවැත්විණි. 5(සෙවි) ගජබා රෙජිමේන්තුවේ හටපිරිස් විසින් සංවිධානය කළ මෙම වැඩසටහනට 62 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ප්‍රධානත්වය දැරීය. මේ සඳහා දේවගැති ඔස්මන්ද අල්විස්, දේවගැති ලූක් ජැන්සන්, දේවගැති රිච්ඩ් ජයකුමාර් හා දේවගැති ලසන්ත ජයලත් යන මහත්වරු මූල්‍ය දායකත්වය සපයනු ලැබූහ. තවද, මෙම අවස්ථාවට 623 වන පාබල බලසේනාධිපති සහ 5(සෙවි) ගජබා රෙජිමේන්තුවේ අණදෙන නිලධාරී ඇතුළු පිරිසක් ද සහභාගී වූහ.

## අභිමානවත් 14 වන සංවත්සරය සමරමින්





9(සෙවි) ඉංජිනේරු සේවා රෙජිමේන්තුවේ 14 වැනි සංවත්සරය ඉකුත් මාර්තු 15 වන දින අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණි. සංවත්සර දිනයට සමගාමීව රුවන්වැලි සෑ රදුන් අභියස ධර්ම දේශනයක් පැවැත්වීම, ඒකක අණදෙන නිලධාරී වෙත කඳවුරු සම්මාන මුරයක් පිරිනැමීම, සුහද ක්‍රීඩා තරග, සියලු නිල දිවා භෝජන සංග්‍රහය, රුක් රෝපණය, නිලධාරී නිවස්නය, ජන අවන්හල සහ මුරහල විවෘත කිරීම කැපී පෙනුණි.

# පොදුසේවා බලකා සේවා වනිතා ශාඛා අලුත් අවුරුදු සැමරුම



අලුත් අවුරුදු උත්සවයට සමගාමීව පොදුසේවා බලකායේ සෙබළියන් සඳහා නව නේවාසික පහසුකම් විවෘත කිරීමත්, සිවිල් සේවකයින් සඳහා වියළි සලාක බෙදාදීමත්, 5 වසර ශිෂ්‍යත්වය සමත් දූදරුවන් හට ලිපි ද්‍රව්‍ය බෙදාදීමත් යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් සිදුකෙරිණි.

තවද, අලුත් අවුරුදු පොලක්ද එහි සංවිධානය කෙරුණු අතර, මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පොදු සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි රුචිනි මෙත්තානන්ද මහත්මිය ඇතුළු එම ශාඛාවේ අනෙකුත් සාමාජිකාවෝ එක්වූහ.







## අලුත් අවුරුද්දේ සිවිල් කාර්ය මණ්ඩලයට සවියක්



යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සේවයේ නියුතු සාමාජික සාමාජිකාවන්ගේ සහභාගීත්වයෙන් සංවිධානය කෙරුණු අලුත් අවුරුදු තේ පැන් සංග්‍රහයක් ඉකුත් අප්‍රේල් 17 වන දින එම කාර්යාල පරිශ්‍රයේදී පැවැත්විණි. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවති එම සුහද හමුවේදී එහි සේවයේ නියුතු සිවිල් කාර්ය මණ්ඩලය වෙත වියළි සලාක පාර්සල් ද බෙදාදෙන ලදී.



# ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකා යෝගට් නිෂ්පාදන ආයතනය සුබ මොහොතින් විවෘත කෙරේ



4 වන යුද්ධ හමුදා සේවා බලකාය යටතේ හිඟුරක්ගොඩ ප්‍රදේශයේ නවතමයෙන් ස්ථාපිත කරන ලද යෝගට් ව්‍යාපෘතියේ නිෂ්පාදනාගාරය විවෘත කිරීම යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 03 වන දින එම කඳවුරේදී පැවැත්විණ.

එහිදී, සේවා වනිතා සභාපතිනිය එම නිෂ්පාදනාගාරයේ නිරීක්ෂණ චාරිකාවකද නිරතවූවාය. තවද, නවතමයෙන් විවෘතකරන ලද එම යෝගට් ව්‍යාපෘතියේ අභිවෘද්ධිය උදෙසා යුද්ධ හමුදා සේවා වනිතා ඒකක අරමුදලින් රුපියල් 1,461,631.00 ක මුදලක් සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තුෂාරි වාසනා වනිගසේකර මහත්මිය වෙත පිරිනැමීමද එහිදී සිදුවිය. යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ පූර්ණ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන රණවිරු යෝගට් ව්‍යාපෘතිය, එම ඒකක සුභසාධන කටයුතු සඳහා අරමුදල් රැස්කරන ප්‍රධාන ව්‍යාපෘතියකි.

# දිවංගත ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුවේ රණවිරුවකුගේ පවුලක් වෙත නව නිවසක්





2 වන ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළුව යටතේ රාජකාරි කරමින් සිටියදී ක්‍රියාත්මක හේතුන් මත මියගිය සෙ/2කිහු00947 සැරයන් තිලකරත්න ආර්එම් යන ජයකොණොනිගේ බිරිඳ වන ආර්එම්ජීආර්කේ රත්නායක වෙනුවෙන් නාවින්න, වාරියපොල ලිපිනයේ ඉදිකරන ලද නව නිවසක් විවෘත කිරීම යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සහ ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බළමුළු සභාපතිනි ජානකී ලියනගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් අප්‍රේල් 06 වන දින සිදුකෙරිණ. එහිදී නිවාසලාභීන් හට එම නිවසට අවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීමද යුද්ධ හමුදා සේවා වනිතා ඒකකයේ සභාපතිනියගේ සුරතින් සිදුවිය.

# කාලතුවක්කු හමුදා සේවා වනිතා සාමාජිකාවෝ රණවිරු සෙවනේ සංචාරයක





කාලතුවක්කු හමුදා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි සහ එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ සමග ඉකුත් මාර්තු 23 වන දින රාගම රණවිරු සෙවණෙහි සංචාරයක නිරතවූහ. එහිදී, සභාපතිනිය ඇතුළු සාමාජිකාවන් ඔවුන් සමග සුහදව අදහස් හුවමාරු කරගත් අතර, ඔවුන් හට ත්‍යාග පාර්සල්ද පිරිනමන ලදී.

## ඉංජිනේරු බලකා සේවා වනිතා සාමාජිකාවෝ අභිමංසල 1 සංචාරයක





ඉංජිනේරු බලකා සේවා වනිතා සාමාජිකාවෝ ඉකුත් මාර්තු 27 වන දින අභිමංසල 1 සුවසහන මධ්‍යස්ථානයෙහි සංචාරයක නිරතවූහ. එහිදී, රණක්ෂිතයට පත්ව නේවාසිකව ප්‍රතිකාර ලබන රණවිරු උපස්ථායකයන්ද ඇගයීමට ලක්කර ඔවුන් වෙත ත්‍යාග ලබාදීමටද එම මධ්‍යස්ථානයෙහි පිහිටි ආයුර්වේද රෝහල වෙත අත්‍යවශ්‍යව පැවති බෙහෙත් ද්‍රව්‍යය සහ තෙල් ගබඩා කිරීමට හැකි රාක්ක පද්ධතියක් පරිත්‍යාග කිරීමටද එම සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනි ශම්මි ජයවර්ධන මහත්මිය කටයුතු කරනු ලැබුවාය. මෙම අවස්ථාවට ඉංජිනේරු බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් එම්කේ ජයවර්ධන ආර්එස්පී යූඑස්පී එන්ඩියූ ද සහභාගී විය.

## සංඥා බලකා සේවා වනිතා සාමාජිකාවෝ අභිමංසල 2 සංචාරයක





සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි තාලනී රත්නායක මහත්මිය සහ එහි සාමාජිකාවෝ ඉකුත් අප්‍රේල් මස 04 වන දින කඹුරුපිටිය අභිමන්සල 2 සුවසහන නිකේතනයෙහි සංචාරයක නිරතවූහ. එහිදී රණවිරුවන්, කාර්ය මණ්ඩලය සහ සිවිල් සේවක මහතුන්ගේ විනෝදාස්වාදය සඳහා විවිධ ඉසව්වලින් සමන්විත අලුත් අවුරුදු උත්සවයක් සංවිධානය කරන ලදී. තවද එම නේවාසික රණවිරුවන් හට ත්‍යාග පාර්සල් පිරිනැමීමද සුවනා මධ්‍යස්ථානයට අවශ්‍ය වටිනා භාණ්ඩ කිහිපයක් පරිත්‍යාග කිරීමද සංඥා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ සුරතින් සිදුකෙරිණි.

# පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ මහසභා රැස්වීම



පාබල හමුදා සේවා වනිතා ශාඛාවේ වාර්ෂික මහසභා රැස්වීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනි දනුෂා වීරසූරිය මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මාර්තු 26 වන දින පවත්වන ලදී. එහිදී එම සේවා වනිතා ශාඛාවේ ඉදිරි අභිවෘද්ධිය සඳහා වූ නව නිලමඩුල්ලක් පත්කරගැනීම සිදුකළ අතර, ඉදිරියේදී සිදුකිරීමට නියමිත සුබසාධන ව්‍යාපෘති පිළිබඳවද සාකච්ඡා කෙරිණ. තවද, රුහුණු විශ්ව විද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය චන්දිමා ගයාත්‍රි විජේසුන්දර මහත්මිය විසින් '' කාන්තා අපි වෙනුවෙන් අපි එක්ව කථාකරමු. සිතමු හැදෙමු'' මැයෙන් හරවත් දේශනයක්ද සිදුකරන ලදී.

## ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාවෙන් සුබසාධන වෙළඳපොලක්

ඉකුත් 2023 අප්‍රේල් 09 වන දින කුරුවිට මහජන ක්‍රීඩාංගණයේදී ගැමුණු හේවා බලකා සේවා වනිතා ශාඛාව මඟින් අවුරුදු පොළක් සංවිධානය කරන ලදී. එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනියගේ සහ සාමාජිකාවන්ගේ එකමුතුවෙන් සංවිධානය කරනු ලැබූ මෙම අවුරුදු පොළ තුළින් ගැමුණු හේවා බලඇණිවල වගාකරන ලද කෘෂිකාර්මික නිෂ්පාදන සහ තම ප්‍රදේශයට අදාළ නිෂ්පාදන අලෙවි කිරීමට අවස්ථාව හිමිවිය. තවද, ප්‍රදේශයේ ජනතාවට සාධාරණ මිලට භාණ්ඩ මිලදීගැනීමේ අවස්ථාවද උදාවිය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස ගැමුණු හේවා බලකා කර්නල් සේනාවිධායක මේජර් ජෙනරාල් ඊඒඩීපී එදිරිසිංහ පීඑස්සී සහ එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි ශාලිකා එදිරිසිංහ මහත්මිය සහභාගී වූහ.



## විරු දරුවන්ට ඉගෙනුමට අත්වැලක්





විජයබාහු පාබල රෙජිමේන්තුවට අයත් රණවිරුවන් සහ සිවිල් සේවක මහතුන්ගේ අධ්‍යාපනය හදාරන දූ දරුවන් 41 දෙනකු වෙනුවෙන් පාසල් උපකරණ බෙදාදීමේ මාහැඟි වැඩසටහනක් ඉකුත් මාර්තු 22 වන දින එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි කුමුදු මානගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණ.

## යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතාවේ මහසභා රැස්වීම






යාන්ත්‍රික පාබල රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ 15 වන වාර්ෂික මහසභා රැස්වීම ඉකුත් මාර්තු 25 වන දින එම රෙජිමේන්තු නිලධාරී නිවස්නයේදී පැවැත්විණ. එයට සමගාමීව 2023 වර්ෂයේ නව පාසල් වාරයට ඇතුළත්වන දරුවන් වෙනුවෙන් අවශ්‍ය සියලුම පාසල් උපකරණ බෙදාදීමේ වැඩසටහනක් ද ප්‍රවීණ ශූපවේදී මධුල්ලක් විසින් මෙහෙයවන ලද ශූපවේදී වැඩටහනක්ද පැවැත්විණ. මෙම අවස්ථාවට එම රෙජිමේන්තු සේවා වනිතා ශාඛාවේ සභාපතිනි හිමාලි පුස්සැල්ල මහත්මිය ඇතුළු එම සේවා වනිතා සාමාජිකාවෝ පිරිසක් සහභාගී වූහ.

## සන්නද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාවෙන් දානමය කටයුත්තක්





සන්නාද්ධ බුද්ධි බලකා සේවා වනිතා ශාඛාව විසින් අංක 2/3, තල්ගස්ගොඩ පාර, පොල්වත්ත, අම්බලන්ගොඩ යන ලිපිනයෙහි පිහිටි වරුසවිතාන වැඩිහිටි නිවාසය වෙත උදේ, දහවල් සහ රාත්‍රී දානය ලබාදීමේ වැඩටහනක් එම බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනි මනෝරි සෙල් මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් මාර්තු 25 වන දින සිදුකෙරිණ.

## සේවා බලකා සේවා වනිතා සාමාජිකාවෝ අභිමංසල 2 සංචාරයක





යුද්ධ හමුදා සේවා බලකා සේවා වනිතා සාමාජිකාවෝ ඉකුත් මාර්තු 17 වන දින අභිමංසල 2 කඹුරුපිටියෙහි සංචාරයක නිරතවූහ. එහිදී එම නේවාසික රණවිරුවන්ගේ සනීපාරක්‍ෂ අවශ්‍යතා රැසක් ලබාදීමට ඔවුන් විසින් කටයුතු කරන ලදී. 1 වන ශ්‍රී ලංකා යුද හමුදා සේවා බලකායේ අණදෙන නිලධාරී ප්‍රතිනාත් කර්නල් ජීකේවී ධර්මසේන යූඑස්පී පීඑස්සී එල්එස්සී ශ්‍රීලයුසේඛගේ සම්බන්ධීකරණයෙන් සිදුකෙරුණු එම අවශ්‍යතා පිරිනැමීමේ අවස්ථාවට සේවාබලකා සේවා වනිතා සභාපතිනි තුෂාරි වනිග සේකර මහත්මිය ඇතුලු පිරියක් එක්වූහ.

# යුධෝපකරණ සේවා වනිතා ශාඛාවෙන් පරිත්‍යාගයක්





යුධෝපකරණ බලකා සේවා වනිතා ශාඛා වාර්ෂික මහසභා රැස්වීමට සමගාමීව රණවිරු පවුල්වල පාසල් යන දූ දරුවන් සඳහා 2023 වර්ෂය වෙනුවෙන් නොමිලේ පාසල් පොත් බෙදාදීම සහ සෙ/602854 මාණ්ඩලික සැරයන් ධනුෂ්ක ආර්එස් යන ජ්‍යෙෂ්ඨකොනොනි හට ආධාර වශයෙන් රුපියල් 50,000.00 ක මුදලක් ලබාදීම එම සේවා වනිතා ශාඛාවේ සභාපතිනී බන්දුනි මාලූෂි රණසිංහ රණවක මහත්මියගේ ප්‍රධානත්වයෙන් ඉකුත් පෙබරවාරි 18 වන දින යුධෝපකරණ පුහුණු පාසල් දේශන ශාලාවේදී සිදුකෙරිණ.

# ද්‍රව්‍යමය ආධාර බෙදාදීමේ සත්කාරයක්





ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකා සේවා වනිතා ශාඛාව සහ 6 වන ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය එක්ව ද්‍රව්‍යමය ආධාර බෙදාදීමේ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 08 වන දින පොලිස් සේවා බලකා රෙජිමේන්තු මධ්‍යස්ථාන නිලධාරී නිවස්නයේදී පවත්වනු ලැබිය. පොලිස් සේවා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී ඉනෝකා ඉලංගකෝන් මහත්මිය ගේ පූර්ණ මගපෙන්වීම යටතේ පවත්වන ලද එම වැඩසටහනේදී විවිධ රෝගාබාධයන්ට ලක්ව අසාධ්‍ය තත්වයෙන් පසුවන එම රෙජිමේන්තුවේ සාමාජික සාමාජිකාවන්, සිවිල් සේවක මහත්ම මහත්මීන් හා ඔවුන්ගේ පවුල්වල අයවළුන් වෙත පරිත්‍යාග පිරිනමන ලදී. එසේම, යුද්ධ හමුදා රෝහලෙහි ප්‍රතිකාර ලබන රෝගීන් කිහිපදෙනකු වෙතද ද්‍රව්‍යමය ආධාර පිරිනැමිණ. මෙම අවස්ථාව සඳහා ඉදිරි නඩත්තු පෙදෙස (මුලතිව්) ආඥාපති මෙන්ම පොලිස් සේවා බලකායේ බලකාධිපති මේජර් ජෙනරාල් ඒඑල් ඉලංගකෝන් සහ එම සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ රැසක් සහභාගී වූහ.

# කාන්තා බලකා සේවා වනිතා ශාඛාවෙන් තවත් සමාජ මෙහෙවරක්



කාන්තා බලකා සේවා වනිතා ශාඛාවේ සභාපතිනී ශ්‍යාමලී විජේසේකර මහත්මියගේ මගපෙන්වීම මත එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේ සහ ඒ යටතේ පාලනය වන අනෙකුත් කාන්තා බලකා ඒකකයන්හි රාජකාරී කටයුතු කරන සිවිල් සේවක මහත්ම මහත්මීන් 23 දෙනකු සඳහා ඇස් කණ්නාඩි ලබාදීමේ විශේෂ වැඩසටහනක් ඉකුත් අප්‍රේල් 01 වන දින එම රෙජිමේන්තු මධ්‍යස්ථානයේදී පැවැත්විණ. ජගත් පුෂ්පකුමාර යන අයගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් සිදුකළ මෙම සත්කාරය ඔහුගේ ආදරණීය බිරිඳ වන සුරංගි ප්‍රියංකා මහත්මියගේ ජන්ම දිනය සමරනු වස් සිදුකරනු ලැබිණ.



# අපි රකින රස්සාව රක්ෂා කරමු ?

ලෝකයේ වෙසෙන සෑම දෙමව්පියෙක්ම ප්‍රාර්ථනා කරන්නේ තම දරුවන්ගේ සතුටයි. ඔවුන්ගේ අභිවෘද්ධියයි. එනම් තම දරුවා සමාජයේ ඉහළින් තැබීමට සෑම දෙමාපියෙක් තුළ වන ප්‍රමුඛතම සිහිනයයි. මේ නිසාම බොහෝ දෙමාපියන් වියල් ලොව තුළ බැඳී පවුල නම් වූ බැම්ම රක්ෂා කරන්නේ රැකියාවෙනි. එනිසාම තම ආර්ථිකය ශක්තිමත් කරගනිමින් දරුවන්ගේ අනාගතය ආලෝකමත් කිරීමට දෙමාපියන් ඒ හරහා කැපවන බව නොරහසකි. එහෙත් ගැටලුවට කරුණු වන්නේ තමා සහ පවුල අරක්ෂා කරන රස්සාව අරක්ෂා කිරීමට වත්මන් පරපුර අපොහොසත්වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබීමයි.

පවුල් ඒකකයන් තුළ සතුට සැනසුම සෙත සදාලන්නට බලපාන රස්සාව නිරන්තරයෙන් අවබෝධයෙන් අවධානයෙන් කළ යුතු වන්නේ මන්ද? එය එකිනෙකා හා සන්සන්දනාත්මකව විමසීමේදී පෙන්වාදිය හැක්කේ රැකියාවේ ස්වභාවය හුදෙක් පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස්වන බවකි. රැකියාව සහ දරුවන් මුල්කර ගත් පවුල් ජීවිතය සමබර ලෙසින් පවත්වා ගැනීමේ වැදගත්කම අප අවබෝධ කරගත යුතුය. එලෙස නොවන්නේනම් පවුල නම් වූ බැම්ම සවිමත් කිරීමට ශක්තීන් නොලැබී යා හැකිය. තම සහකරුගේ හෝ සහකාරියගේ මෙන්ම දෙමාපිය දූ දරුවන්ගේ මානසිකත්වයටද, රැකියාව අහිමිවීම නිසා සිදුවන බලපෑම සුළුපටු නොවේ.

තම රැකියාව ඇතැම් අවස්ථාවක අසීරු විය හැකිය. බැරෑරුම් විය හැකිය. වගකීම් හා බැඳි ඉහළ හෝ පහළ වෘත්තියක් විය හැකිය. එලෙසම රැකියා ස්ථානයේ වන සෙසු පිරිස්හි නේකවිධ කාර්යයන් ඔබට ඔබේ රස්සාව එපාවීමට පවා බලපෑම් කළ හැකිය. හීනමාන තුළට ඔබේ ලෝකය ක්‍රමයෙන් ඇඟෙන යන පිරිස් රැකියා ස්ථානයේ ඔබට හමුවිය හැකිය. සිතන්න. ඔබ ඔබේ රැකියාවේ ගුණාත්මක පසුබිම ගැන. ඔබ ඔබේ රැකියාව රක්ෂා කරන්න. මන්ද, ඔබ සහ ඔබේ පවුලේ ආලෝකය නිරන්තර ඒ වටා බැඳී ඇති බැවිනි.

රැකියාවේ ස්වභාවය කෙසේ වුවද ඔබ කවරටත් වඩා ඊට ශක්තිමත්ව මුහුණදිය යුතුය. ඉවසීමෙන් කටයුතු කළ යුතුය. රස්සාව මෙන්ම දරුවන් හා පවුල වෙනුවෙන් ඔබ ඔබේ අවධානය දිය යුතුය. රැකියාවේ වගකීම් සමඟින්ම තම සම්පතමයින්ගේ ජීවිතයටත් සමීපව සම්බන්ධ විය යුතුය. රැකියා ස්ථානයේ ඇති මානසික සුවතාවය රැකියාවේ ස්වභාවය අනුව තීරණය වේ. එකිනෙකා හා බැඳි අන්‍යෝන්‍ය සබඳතාවයන් පසුපු වූ කාර්යාල පරිසර තුළ නිරන්තරයෙන් ඔබට ඔබේ රැකියාවේ අඩුපාඩු මදිපාඩු මිස හිමිවන වරප්‍රසාදයන් ගැන සිහි නොවනු ඇත.

ඔබ ලබනා වේතනය ඔබට ඔබේ පවලේ ජීවන වියදමට නොසරිලන එකක් විය හැකිය. ඒ කෙසේ වුවද අප රකින රස්සාව අප රක්ෂා කළ යුතුය. ඔබට සිතේවි, මේ රස්සාවට වඩා අර රස්සාව හොඳයි, මං යනවා විදේශ රටකට. එවැනි බොහෝ විකල්ප වියදුම් ඔබ සොයා යාමට හුරුවේවි. එවැනි වියදුම් සෙවීමට ඔබට ඔබේ මිතුරන්ගෙන් පවා ඇරයුම් ලැබේවි. ඒ සෑම අරමුණක්ම හොඳය. එසේ වුවද, ඔබ ඔබේ අරමුණුකරා යාමට කෙතරම් සූදානම් ද? ඒ අරමුණ සාක්ෂාත් කරගැනීමට ඔබට විශ්වාසවන්ත මගක් වේද? එය ඔබ තීරණය කළ යුතුය. පවුල හා දරු දැරියන් ජේන මානයේ ඔවුනගේ සුව සදන්නට ඔබ ඔබේ රැකියාව ආරක්ෂා කළ යුතු නොවේද? එසේනම් තමා ලබාගන්නා වැටුප කළමනාකරණය කරමින් ජීවිකාව ගෙවීමට අප හුරු වියයුතුය. ඒ සඳහා පවුල හුරු කළ යුතුය.

නිරන්තරව ඔබේ රැකියාවේ ඇති ස්වභාවය තේරුම් නොගැනීමෙන් රැකියාව ගැන අනවශ්‍ය අවිවේකී බවක් එපාවීමක් සිත තුළ ගොඩනැගිය හැකිය. එසේනම්, යුද්ධ හමුදා සාමාජිකයන් වන අපටද රාජකාරියේදී එය එලෙසින්ම විය හැකිය. අප සාමාජිකයින් බොහෝ පිරිස් වැඩි කාල පරාසයක් පවුලෙන් දුරස්ව රාජකාරියේ නිරත වන්නන් වන බැවින් අප ද කල්පනාකාරීව පවුල හා රැකියාව ආරක්ෂා කරගත යුතුය. එසේනම්, යුද්ධ හමුදාවෙන් නිවාඩු නොමැතිව නොපැමිණීම් එසේත් නැතිනම් නිතොනො නොවීමට වගබලාගනිමින් අභිමානවත් හමුදාවේ සමාජිකයකු ලෙස වෘත්තිය නිමාකර ඉසිමුලමින්, පවුල හා බැඳි ගතකිරීමට වගබලා ගනිමු. කළමනාකරණය නම් තරාදියේ සීරුවට තැබූ පඩිපත නිසියාකාරව කිරාමැන බෙදාදෙමින් ජීවිතය නම් සංසාර චාරිකාවේ සුවෙන් සැපයෙන් වෙසෙන්නට අප රකින රස්සාව අපි රක්ෂාකර ගනිමු.



සටහන
සෙ/බි03810 කෝප්‍රල් චතුරානි
එම්.ඩබ්ලිව්
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය



# හමුදාව සහ බාර් එක

අපෝ... ඔය ගෝසස්වල ඉන්නෙ මහ බේබද්දො, හමුදාකාරයා බොනව අම්බානෙක. මේ සමාජය තුළ මුල්බැස ඇති ප්‍රකට කරුණකි.

බීම නොබීම කෙසේ වුවත් හමුදා නිලධාරීන් හට බාර්එක සමඟ ඇත්තේ ඉතා ගෞරවණීය සම්බන්ධයකි. තම නිවස හා ආදරණීයන් හැරදමා කඳවුර තුළට වී සිටින හමුදා නිලධාරියා හට තම පවුලේ සාමාජිකයන් වැනි සහෝදර නිලධාරීන් සමඟ සතුටු සාමීචියේ යෙදෙමින් විවේකීව කාලය ගත කිරීමට බාර්එකෙන් ලැබෙන්නේ මහා පිටිවහලකි.

යුද්ධය පැවති සමයේ සමහර දිනක බාර් එකට සෙට්වන නිලධාරීන් ගෙන් කිහිපදෙනෙකු පසුදින මියගිය අවස්ථා අනන්තය. පෙර දින තමන් සමඟ සතුටු සාමීචියේ යෙදුණු තම සම්පතමයාගේ මතකයන්, පෙර දිනයේ තමා සිදුකළ වික්‍රමාන්විත ක්‍රියාවක් විස්තර කළ තම ජ්‍යෙෂ්ඨයා පසුදින මියගිය විට දැනෙන අමිහිරි වේදනාව වැනි මිහිරි අමිහිරි මතකයන් ගොන්නක් සැරිසරන ස්ථානයකි මේ බාර්එක. එවන් වටිනා ජීවිත පරිච්ඡේදයන් වල එකතුවක් සහිත මේ බාර්එක එක්තරා ගෞරවණීය ස්ථානයක් යැයි හැඳින්වීම වරදක් නොවේ.

## බාර්එකට බාර්එක කියන්නෙ ඇයි?

"බාර්" එක යනු ඔබේ බීම/මත්පැන් පිරිනමනු ලබන කවුන්ටරයයි. සාමාන්‍යයෙන් කවුන්ටරයේ පහතින් තිරස්ව දිවෙන පිත්තල පීල්ලක් හෝ "බාර්" එකක් ඇති බැවින් එය මත ඔබේ පාද විවේක ගත හැකිය.

හමුදාවේ බාර් යනු ඔය වටුමේ දකින්නට ඇති බාර් වගේ නොවේය. හමුදා බාර් සම්බන්ධව රැකුණු විවිධ ආචාරධර්ම, සංස්කෘතීන් (*Traditions*) පවතී. ඒවා දැක්වෙන පරිදි විවිධ සැරසිළි , බිලියඩ් කාමර, චිත්‍ර සහිතව ඉතා ගරුගාම්භීර අයුරින් නිමවා ඇත.

හමුදාවක ප්‍රෞඩත්වය විදහා දක්වන විවිධ අයිතමයන් හා "ගැම්මෙන් බීමට" හැකි පරිසරයක් බාර් එකේ ඇත. කලිසම් කොට, ටී ෂර්ට් කෑලි, සෙරප්පු කෑලි දමාගෙන බාර්වලට පැමිනීම සපුරා තහනම්ය. මෙහි බීමට ජෙන්ට්ල්මන් ලෙවල් එකෙන් පැමිනීම අත්‍යාවශ්‍ය කරුණකි. ජෙන්ට්ල්මන් ලෙවල් එකේ බාර්එක යූස් කරන්න පුරුදු වූ කෙනාට ගැන්ග්ල්ලා එකේද හංදියෙ බෝක්කුව උඩද එක සේ ඩ්‍රින්ක් එක දැමිය හැක.

බාර් එකට පැමිණෙන නවකයා හිමේ මූලික සාරධර්ම ඉගෙන ගනී. ඔහු මත්පැන් පානය නොකරන පුද්ගලයෙකු වුවද මත්පැන් පානය කරන සමූහයක සක්‍රිය සාමාජිකයෙකු වීමත් මත්පැන් පානය කරන කෙනෙකු නම් තම තරම දැන මත් වීමටත් පුරා පැය හයක් හතක් අවුට් නොවී සෙමින් ඩ්‍රින්ක් එක ගැනීමට පුරුදුවීම සිදුකරන්නේ බාර් එකේදීය.

බාර් එකට ඇතුළුවීමේ සිට විදුරුවට මත්පැන් වත්කිරීම, ඒ ඒ මත්පැන් වර්ගයට සුදුසු චේසර් (*chasers*) වර්ගය, චියර්ස් (*cheers*) කිරීම, බයිට් මාරයෙකු නොවී අවශ්‍ය ප්‍රමාණයට බයිට් කෑම, බොන අතරේ නොබොන කෙනාට නිසි ගෞරවයෙන් සැළකීම, යමකු සිගරට්ටුවක් ලබාදුන් විට එය පිළිගැනීමේ නියම ක්‍රමය, බොන අතරේ දුම් පානය කරන නියම ක්‍රමය, මත්පැන් බොන සමූහයක් අතරින් සමුගන්නා ආකාරය යන එකී මෙකී නොකී සියලු සම්ප්‍රදායන් සාරධර්ම හැදෑරීමට බාර්එක කදිම තැනකි.

**බාර් එකට ඇතුළුවීමේ සිට විදුරුවට මත්පැන් වත්කිරීම, ඒ ඒ මත්පැන් වර්ගයට සුදුසු චේසර් (*chasers*) වර්ගය, චියර්ස් (*cheers*) කිරීම, බයිට් මාරයකු නොවී අවශ්‍ය ප්‍රමාණයට බයිට් කෑම, බොන අතරේ නොබොන කෙනාට නිසි ගෞරවයෙන් සැළකීම, යමකු සිගරට්ටුවක් ලබාදුන් විට එය පිළිගැනීමේ නියම ක්‍රමය, බොන අතරේ දුම් පානය කරන නියම ක්‍රමය, මත්පැන් බොන සමූහයක් අතරින් සමුගන්නා ආකාරය යන එකී මෙකී නොකී සියලු සම්ප්‍රදායන් සාරධර්ම හැදෑරීමට බාර්එක කදිම තැනකි.**

හමුදාවක නිලධාරීන් අතර බැඳීම (*Bond*)/ කණ්ඩායම් හැඟීම අත්‍යවශ්‍ය කරුණකි. එලෙස බැඳීම් ඇතිවන ප්‍රධාන ස්ථානයන් දෙක වනුයේ ක්‍රීඩා පිටිය හා බාර්එකය. ජ්‍යෙෂ්ඨයින් හා කණිෂ්ඨයන් හමුවන, කාර්යාලීය නොවන මට්ටමින් සුහදව අදහස් හුවමාරු කරගන්නා හොඳම ස්ථානය බාර්එකය. මෙම බාර්වල කිසිවකු පමණ ඉක්මවා මත්පැන් පානය කර පිස්සු කෙලින්නේ ජීවිතේ එක වරකි. එවර ඔහු ඉතා පුදුම සහගත ලෙස තම පරිමාව තේරුම්ගනී.

මත්පැන් බෝතලය ඉක්මනින් ඉවර වේ යැයි බියෙන් ළඟ ළඟ නවා ගැනීම හෝ වරෙකට ඉතා විශාල ප්‍රමාණයක්වත් කරගැනීම ඉතා පහත් ක්‍රියාවන් ලෙස සැළකේ. ක්‍රමයෙන් මත්වීම යනු බෝතලයෙන් බාගයක් විදුරුවට දමා නොගෙන ඉතා කුඩා ප්‍රමාණවලින් හොඳින් වෙලාව ගෙන ඉතා සාරවත් කතාබහක යෙදෙමින් මත්පැන් පානය කිරීමයි.මා ඉහත කී ලෙස හමුදාකාරයන් බේබද්දන් ලෙස සැලකිය නොහැක්කේ මත්පැන් ඉතා කුඩා ප්‍රමාණයක් බොහෝ වේලාවක් රස විඳීමේ ශාස්ත්‍රය ඔවුන් ඉතා හොඳින් ප්‍රගුණකර ඇති නිසාවෙනි.


සටහන :-
උපුටා ගැනීමකි
මේජර් මංජුල වීරසිංහ
(11 වන ඉංජිනේරු සේවා රෙජිමේන්තුව)

## පාඨමාලාව සාර්ථකව අවසන් කෙරේ





විනයාරක්ෂක අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පැවරී ඇති රාජකාරීන් නිවැරදිව ඉටුකිරීමේදී පැනනැගෙන ගැටළු නිරාකරණය කරගැනීම සඳහා විෂය ලිපිකරුවන් දැනුවත් කිරීම වෙනුවෙන් පැවති පාඨමාලාවක් ඉකුත් මාර්තු 29 වන දින සිට අප්‍රේල් 04 වන දින දක්වා පැවැත්විණ. විනයාරක්ෂාධිපති මේජර් ජෙනරාල් ඒයිජ් ද සොයිසා යූඑස්පී එච්ඩීඑම්සී එල්එස්සී ගේ අදහසකට අනුව පැවති මෙම පාඨමාලාවට රාජ්‍ය හා රාජ්‍ය නොවන මුදල් විගනණයේදී ඇතිවන නිරීක්ෂණ, ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ඇතිවන නිරීක්ෂණ, පරීක්ෂණ කටයුතු සඳහා සිවිල් නීතිය හා යුද්ධ හමුදා නීතිය යොදාගන්නා ආකාරය සහ සිද්ධි අධ්‍යනයන් තුළින් විමර්ශන දැනුම වර්ධනය කරගැනීම යන විෂයන් ඇතුළත් විය.




# යුද සාහිත්‍යයක් තුළින් ගොඩනැගෙන්නේ රණවිරු අභිමානයයි

**ලෝක ප්‍රසිද්ධ රුසියානු සාහිත්‍යය පෝෂණය ලබා ඇත්තේද එරට පැවති යුද සංග්‍රාමයන් තුළිනි. 1812 දී නැපෝලියන්ගේ හමුදාවත් 1941 දී හිට්ලර්ගේ හමුදාවත් එවකට සෝවියට් සමූහාණ්ඩුව ආක්‍රමණය කළෝය. දෙවන ලෝක යුද්ධයේ ආපසු හැරවීමේ ලක්ෂය රුසියාව යැයි කිවහොත් නිවැරදිය. එකල එම බිහිසුණු යුද්ධ රුසියානු වෘත්තීය සෙබළුන්ගේ කාර්යයට පමණක් සීමාවූයේ නැත. රජවරුන්, සිටුවරයන් පමණක් නොව, අනෙකුත් වෘත්තීයන් මෙන්ම කවියන්, සාහිත්‍යධරයන් පවා යුද්ධභූමිය තුළ සිටියේය.**

**එකල කවියන්ට, සාහිත්‍යධරයන්ට, කථාකාරයන්ට යුද්ධ භූමිය නුහුරු අත්දැකීමක් නොවීය. තම රට බේරාගැනීමේ අරමුණින් වසර ගණනක් ඇදීගිය මෙම සංග්‍රාමවලින් අනතුරුව අවිආයුධ පසෙක තැබූ රුසියානුවෝ පෑනෙන් මුළු ලෝකයම ආක්‍රමණය කළහ. යුදමය පරිසරය තේමාකොටගත් ඔවුහු තම අත්දැකීම් ශ්‍රේෂ්ඨ සාහිත්‍යය නිර්මාණ හා නවකතා කාව්‍ය ලෙස ලෝකයා සමඟ බෙදාගත්තේය. ලෝකප්‍රචලිත වීරකාව්‍යයක් තරමටම නවකතා සාහිත්‍යයේ "මිණිකිරුළ" නැතහොත් "අග්‍රඵලය" ලෙස සැළකෙන ලියෝ තෝල්ස්තෝයිගේ "යුද්ධය හා සාමය" ඇතුළු ශ්‍රේෂ්ඨ රුසියානු නවකතා බිහිවන්නේ ඔවුන් මුහුණදුන් එම සංග්‍රාමවලින් අනතුරුවය.**

දිගින් දිගටම සාමය සඳහා වූ කිසිම විකල්පයක් පෙනෙන්නට නොමැති නම් වියදුමක් ලෙස යුද්ධයක් සඳහා එළඹීම වැළැක්විය නොහැක. ලෝක සංග්‍රාමවලට පවතින්නේ අද ඊයේ අතීතයක් නොවේ. මේ මහපොළොවේ මිනිසා නමැති සත්වයා ජනිතවූ මුල් කාලයේ පටන් ඔවුනොවුන් අතර ගැටුම් හටගත්තේය. කාලානුරූපව ඒවා මහා සංග්‍රාම බවට පත්විය. මිනිසා කොතරම් කායික හා මානසිකව පරිපූර්ණත්වයට පත්වුවත් මිහිතලයේ යුද ගැටුම් අහවරවී නැත. ලෝකයේ කොහේ හෝ අදත් බිහිසුණු යුද්ධයක් පවතී.

"යුද්ධයක් බිහිසුණුය. බිහිසුණු වුවත් එය ගමන්ගන්නා ඊට ආවේනික ක්‍රමවේදයක් තිබේ. කලාව, සාහිත්‍යය වැනි සියුම් දේවල්වලට එහි ඉඩක් නැත. එබැවින් මේවා අතර අන්තර් සම්බන්ධතාවයක් පැවතිය නොහැක." මිනැම දෙයක් මතුපිටින් පමණක් අවබෝධ කරගන්නා තැනැත්තකුට එසේ පැවසීමට කිසිදු බාධාවක් නැත. එහෙත් සත්‍යය එසේම වන්නේද?

පුද්ගලයකු යම් ආකාරයක චිත්‍රපටයක් හෝ නාට්‍යයක් නරඹන්නේය. නැතහොත් අහම්බෙන් හමුවන පොතක් කියවන්නේය. ඉන් අනතුරුව ඒ තුළින් එම පුද්ගලයාගේ මෙතෙක් පැවති සිතුවිලි හා ඔහුගේ දෛනික පිළිවෙතට යහපත් බලපෑමක් ඇතිකරයිද? නොඑසේනම් එම පොතෙහි හෝ නරඹන ලද නාට්‍යයේ නිරූපිත පුද්ගල චරිත කාලයක් යනතුරු ඔහුගේ හද සන්තානයේ තැන්පත් වී විටින්විට මතකයට ගෙනඑන්නේද? එසේනම් එය විශිෂ්ට කලා හෝ සාහිත්‍ය නිර්මාණයක් ලෙස හැඳින්වීමේ වරදක් නැත.

අතීතයේ සිට පැවති එවැනි විශිෂ්ට සාහිත්‍යය නිර්මාණ කිහිපයක් පුද්ගල හදසන්තානයේ තැන්පත්වී වර්තමානය තෙක් රැගෙනවිත් තිබේ. ඒවා නොනැසී පවතින්නේ එකී නිර්මාණවල පවතින විශිෂ්ටත්වය නියාමය. එවන් ලෝක පූජිත නිර්මාණ කිහිපයක් "වීරකාව්‍ය" ලෙස හඳුන්වති.

අතීත සංස්කෘතික භාෂාවෙන් මහා භාරතයේ සිරි "ව්‍යාස" නම් ඍෂිවරයා විසින් ලියන ලදැයි සැලකෙන

"මහාභාරතය" එවන් සුවිශේෂී වීරකාව්‍යයකි. "වාල්මිකී" සෘෂිවරයාගේ "රාමායනය" තවත් ඉන්දියානු අතීත වීරකාව්‍යයකි. අතීතයේ ග්‍රීක කවියකු වූ "හෝමර්" විසින් ලියන ලදැයි සැලකෙන "ඉලියඩ්" *(The Illad)* හා ඔඩිසි *(The Odyeesy)* ඉංග්‍රීසි සාහිත්‍යයේ එන සුප්‍රසිද්ධ වීරකාව්‍යයන් ලෙස සැලකේ.

ඉහත සඳහන් කළ ලෝක පූජිත වීරකාව්‍යයන් පිරික්සීමේදී කැපීපෙනෙන ඊට ආවේනික පොදු කාරණාව වන්නේ මේවා සියල්ලටම පසුබිම්වී ඇත්තේ යුද්ධය හා වීරත්වයයි. වීරයන් බිහිවන්නේ සංග්‍රාම තුළින් බව අතීතයේ සිට ඇදුනු කරුණකි. ඒ හැරුණුවිට මෙම කාව්‍යයන් තුළ අනෙකුත් කරුණු රාශියක් ගොඩනැගී ඇත. ආගම, ධර්මය, අසාධාරණයට එරෙහිවීම, රටේ සංස්කෘතිය, යුද නීති හා යුද සම්ප්‍රදායන්, යුද්ධයේ වුවද මතුකරන මානුෂීය ගුණාංග, නොනැසෙන අධිෂ්ඨානය, දේව කැමැත්ත ඒ අතර වන්නේය.

මහා භාරත වංශකතාව පුරාවටම ගෙනහැර පාන්නේ භාරතයේ ශ්‍රේෂ්ඨ අතීත සංග්‍රාමයන්හි නිර්භීතභාවයයි. පැරණි ඉන්දියාවේ පැවති "හස්තිනාපුර" රාජධානියේ අයිතිය සම්බන්ධයෙන් එකම රාජකීය පරම්පරාවක දෙපිරිසක් අතර ඇතිවන මහා යුද්ධය මහාභාරත වීරකාව්‍යයේ ගලායන සුවිශේෂී කථාව වන්නේය. මෙම යුද්ධයට එළඹෙන දෙපිරිස "කෞරවවරයන්" හා "පාණ්ඩවයන්" වන්නේය. මෙහිදී, කථාව පුරාවට යහපත්, ධාර්මික පාණ්ඩව පිලෙහි නායක "අර්ජුන" සෙනෙවියා හා ඔහුගේ සොහොයුරන්ගේ නිර්භීතභාවය හුවා දක්වන්නේය. රාමායනය තවත් සුප්‍රසිද්ධ ඉන්දියානු වීරකාව්‍යයකි. එය මූලිකවම රාම හා රාවණා යුද්ධය පදනම් කරගෙන ලියවී ඇත.

මහා භාරතය, රාමායනයට වඩා බෙහෙවින් විශාලය. මහා භාරතවංශ කථාවේ සුවිශේෂී අවස්ථාව වන්නේ යුද්ධ භූමිය තුළදී පාණ්ඩව පිලේ නායක අර්ජුන වෙත ඔහුගේම මිත්‍ර ශ්‍රී ක්‍රිෂ්ණා විසින් "භගවත්ගීතාව" නම්වූ මහා ධර්මානුකූල දේශනාව සිදුකිරීමයි. භගවත්ගීතාව ආගමික පසුබිමකින් යුක්තවුවත් ඒ තුළ යුද්ධයේ බොහෝ කරුණු කාරණා සාකච්ඡාවට ලක්වන්නේය. එබැවින් ලෝක සුප්‍රසිද්ධ බුද්ධිමත් යුද නායකයෝ පවා "භගවත්ගීතාව" යුදබිමේ තම අත්පොතක් ලෙස භාවිතාකළ බව සඳහන්වේ. එබැවින් මෙම වීර කාව්‍යයන්ට වර්තමානය තුළදී පවා හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

"ට්‍රෝජන්" යුද්ධය පසුබිම් කරගෙන "හෝමර්" ශ්‍රේෂ්ඨ කවියා විසින් ලියනලද "ඉලියඩ්" හා "ඔඩිසි" වීර කාව්‍ය ඉංග්‍රීසි සාහිත්‍යයේ ඇත. එහි පසුබිමද පෙර සඳහන් කළාක් මෙන් යුද්ධය හා වීරත්වයයි. මෙම ලෝක පූජිත සියලු වීර කාව්‍යයන්ට පසුබිම් වන්නේ යුද්ධය හා වීරත්වය වීම හේතුවෙන් මේවා අතර පවතින යම් සමානත්වයන්ද දැකිය හැකිය. මන්ද මේවාට අනුව වීරයන් බිහිවන්නේ සංග්‍රාම තුළිනි.

ලෝක ප්‍රසිද්ධ රුසියානු සාහිත්‍යය පෝෂණය ලබා ඇත්තේද එරට පැවති යුද සංග්‍රාමයන් තුළිනි. 1812 දී නැපෝලියන්ගේ හමුදාවත් 1941 දී හිට්ලර්ගේ හමුදාව එවකට සෝවියට් සමූහාණ්ඩුව ආක්‍රමණය කළෝය. දෙවන ලෝක යුද්ධයේ ආපසු හැරවීමේ ලක්ෂය රුසියාව යැයි කිවහොත් නිවැරදිය. එකල එම බිහිසුණු යුද්ධ රුසියානු වෘත්තීය සෙබළුන්ගේ කාර්යයට පමණක් සීමාවූයේ නැත. රජවරුන්, සිටුවරයන් පමණක් නොව, අනෙකුත් වෘත්තීයන් මෙන්ම කවියන්, සාහිත්‍යධරයන් පවා යුද්ධ භූමිය තුළ සිටියේය.

එකල කවියන්ට, සාහිත්‍යධරයන්ට, කථාකාරයන්ට යුද්ධ භූමිය නුහුරු අත්දැකීමක් නොවීය. තම රට බේරාගැනීමේ අරමුණින් වසර ගණනක් ඇදීගිය මෙම සංග්‍රාමවලින් අනතුරුව අවිආයුධ පසෙක තැබූ රුසියානුවෝ පැනෙන් මුළු ලෝකයම ආක්‍රමණය කළා යැයි කිවහොත් නිවැරදිය. යුදමය පරිසරය තේමාකොටගත් ඔවුහු තම අත්දැකීම් ශ්‍රේෂ්ඨ සාහිත්‍යය නිර්මාණ හා නවකතා කාව්‍ය ලෙස ලෝකයා සමග බෙදාගත්තේය. ලෝකප්‍රචලිත වීරකාව්‍යයක් තරමටම නවකතා සාහිත්‍යයේ "මිණිසිරුළ" නැතහොත් "අග්‍රඵලය" ලෙස සැළකෙන ලියෝ තෝල්ස්තෝයිගේ "යුද්ධය හා සාමය" ඇතුළු ශ්‍රේෂ්ඨ රුසියානු නවකතා බිහිවන්නේ ඔවුන් මුහුණදුන් එම සංග්‍රාමවලින් අනතුරුවය.

**"කලාව හා සාහිත්‍යය වෙඩි සීමාවටම පැමිණ ඇත"**

*(ගිනෙලොයි මගෝරෝවී, රුසියානු ලේඛිකා)*

**"අපි උස, පැහැපත් හිසකෙස් ඇති අයයි.../ /**

**ඔබ, මීට්නාවක් මෙන් පොත්වල කියවනු ඇත.../ /**

**ආදරය නොකර.../ /**

**හැරගිය මිනිසුන් ගැන.../ /**

**අන්තිම සිගරට්ටුව ඉවර නොකරම.../ /**

යුද්ධයෙන් අනතුරුව ලියැවුණු තවත් ශ්‍රේෂ්ඨ රුසියානු කතාවක් ලෙස "සැබෑ මිනිසකුගේ කතාව" ග්‍රන්ථය හඳුන්වා දිය හැකිය. ඇලෙක්සෙයි මාරෙස්යෙව් නමැති වීර ගුවන් නියමුවාගේ සැබෑ කතාව මෙයට පදනම් වී ඇත. රුසියානු යුද්ධයෙන් වසර තිහකට පසුව ලියැවුණු "උණුසුම් හිම" නවකතාවෙන් (1942) දෙවන ලෝක යුද සමයේ රුසියාවේ ස්ටාලින්ග්‍රෑඩ් හි සිදුවූ බිහිසුණු සිදුවීමක් නිරූපණය කරයි. එහිදී, සංග්‍රාමයේ ඉතිරි වූ නිර්භීත රුසියානු සෙබළුන් තිදෙනකු, එක් තුවක්කුවක් පමණක් අතැතිව දිගින් දිගටම ජර්මානු ප්‍රහාර වැළැක්වීමට ක්‍රියාකර කටුක අවසානය දක්වාම සටන් කරන වීරත්වය මෙම කතාව තුළින් මනාවට විස්තර කර ඇත.

වර්තමානයේ සමහරු විවිධ අර්ථකථනයන් ඉදිරිපත් කළත් මෙරට තුළද දශක තුනක් ඉක්ම වූ යුද්ධයක් පැවතුණේය. එමෙන්ම එය රට තුළ අභ්‍යන්තර ගැටලුවක් වුවත්, නියමිත භූමි ප්‍රමාණයක් තම පාලනයට නතු කරගනිමින් නවීනතම අවි ආයුධ හා පුහුණුව සමග රජයේ හමුදා සමග දීර්ඝකාලයක් සටනේ යෙදුනා නම් එය යුද්ධයක් ලෙස හැඳින්වීමේ වරදක් නොදකිමි. මෙලෙස ගෙවුනු යුද්ධයේ දී මෙරට සොල්දාදුවන් විශාල පිරිසක් මාතෘ භූමිය වෙනුවෙන් තම ජීවිත පරිත්‍යාග කළෝය. යුද්ධයේදී තම වීරත්වය හා කැපවීම පෙන්නුම් කරමින් ආබාධිත වූවෝ ද බොහෝය. ගෙවුනු යුද්ධයේ ක්‍රියාකාරීව සිට තවමත් ජීවත් වන පිරිස් ද විශාල ප්‍රමාණයකි. යුද්ධ භූමියේ විවිධාකාර අත්දැකීම් ඔවුන් සතුය. දීර්ඝකාලීනව සොල්දාදුවන්ගේ නොනවතින කැපවීම් හා නිපුණත්වය ඉදිරියේ සතුරා පරාජය විය. කලකට පසුව රටට සාමය උදා විය. එකල රටේ ආර්ථිකය, දේශපාලනය, ජන ජීවිතය ඇතුළු විවිධ අංශයන්හි තීරණාත්මක සාධකය වූයේ රට තුළ පැවති එකී යුද්ධය බව ප්‍රකාශකළහොත් එය නිවැරදිය.

මේ සියලු කාරණා එසේ වුවත් මෙරට තුළ පැවති යුද්ධයෙන් අනතුරුව යුදමය සාහිත්‍යයක් ගොඩ නැගුණේ නම් නැත. එකී අඩුව තවමත් එලෙසම පවතින බව ප්‍රකාශ කළහොත් නිවැරදියැයි සිතමි. යුද්ධයෙන් අනතුරුව යුදමය සාහිත්‍යය ගොඩනැගීමේ වැදගත්කම වනුයේ ඒ තුළින් පැවති යුද්ධයේ සැබෑ ස්වරූපය, සොල්දාදුවන්ගේ වීරත්වය මෙන්ම එය එම සමාජ වකවානුව පිළිබඳ කැඩපතක් වීමයි. එහි සැබෑ ස්වරූපය නිරූපණය කිරීමයි. එය යුධමය සාහිත්‍යයක් ගොඩ නැගීමෙන් තොරව සපුරා ගැනීම පහසු වන්නේ නැත.

"යුද්ධයේදී මෙතරම් භටපිරිස් ප්‍රමාණයක් සහභාගී විය. ආයුධ මෙතරම් ප්‍රමාණයක් යොදාගත්තේය. එහිදී, සිදුවූ හානිය මුදලින් මෙපමණය" යනාදී වශයෙන් සංඛ්‍යාත්මක ව කරුණු ඉදිරිපත් කිරීම හුදු වර්තමානයක් මිස යුදමය සාහිත්‍යයක් වන්නේ නැත. එය හුදෙක් වාර්තාකරුවකුගේ කාර්යභාරයක් වන අතර කොතරම් කාලයක් ගත වුවද මෙකී දත්ත අවශ්‍ය අයකුට එම කාලයට අයත් පුවත්පත් හෝ දත්ත ගබඩාවකින් පහසුවෙන් ලබාගත හැකියි. එවන් තොරතුරු අපේක්ෂිත සාහිත්‍ය පදනමකින් බිහි වූ නිර්මාණ නොවෙයි. සාහිත්‍ය නිර්මාණයක් තුළින් යුද්ධයේ සංසිද්ධීන් ඊට වඩා පුළුල් ආකාරයෙන් මෙන්ම සාහිත්‍යමය කෝණයකින් විස්තර වන්නේ ඒ තුළින් සමාජ පණිවුඩයක්ද ගෙනහැරපාමිනි. හුදෙක් පෙර සඳහන් කළ ආකාරයේ තොරතුරු ඉදිරිපත් කිරීමක් පමණක් වන්නේ නැත.

යුද්ධය අවසන් වූ පසුව කාලයත් සමඟ එය අතීත සංසිද්ධීන් පමණක් සීමාවී ඇත. එය මෙරට තත්වය මිස සමස්ත සමාජගත ලෝක තත්ත්වය නොවේ. යුදමය සාහිත්‍යයක් බිහිවිය යුත්තේ එබැවිනි. මෙරට පැවති යුද්ධයට උර දුන් රණවිරුවන් බහුතරයක් දැන් විශ්‍රාමිකය. සමහරු යුද්ධ භූමියේ විවිධාකාර වටිනා අත්දැකීම් සමුදායක් සමග ජීවිතයෙන්ද සමුගෙන ඇත. යුද්ධයේ ඇස දුටු සාක්ෂි මෙන්ම ප්‍රායෝගික අත්විඳි දැනුම හා අත්දැකීම්ද දිනෙන් දින වැලලී යන්නේය. ඉතිහාසයේ ලියවිය යුතු අනාගත පරපුරට බොහෝ වටිනා සංසිද්ධීන් පවා මෙසේ අපතේ යාම පාඩුවක් මෙන්ම අපරාධයක් ලෙස දකිමි. ජාතික වශයෙන් අනාගතයේ පරපුරට පෙන්වාදිය යුතු දේවල් බොහෝය.


එසේම වර්තමානයේ හෝ යුදමය සාහිත්‍ය කෘති බිහිවීමකින් තොරව මේ ආකාරයෙන්ම මෙම තොරතුරු අතීත සංසිද්ධියක් පමණක් ලෙස වැලලී ගියහොත් අනාගතයේ යම් දිනක කිසිදු විශ්වාසනීය තොරතුරුවලින් තොරව එක් එක් ලේඛකයාට රිසි පරිදි යුද්ධය අලලා විකෘති කරුණු මත විවිධ පුද්ගල අභිමතාර්ථයන්ට අවශ්‍ය පරිදි නිර්මාණ ගොඩනැගෙනු ඇත. එය සැබෑ වීරයන්ට කරන අවමානයකි. එබැවින් මෙය වර්තමානයේ හමුදා ලේඛනයන් තුළින් ඉටුවියයුතු කාර්යභාරයක් වන්නා සේම ජාතික යුතුකමක්ද වන්නේය. එසේ නොවනතාක් පසුගිය යුදමය වකවානුවේ සොල්දාදුවන් ප්‍රකට කළ වීරත්වය හා ඔවුන්ගේ කැපවීම සදාකාලිකව වැසීයනු ඇත. මේවා පිළිබඳව තොරතුරු දත්ත ගබඩා තුළ සංරක්ෂණය පමණක් ප්‍රමාණවත් දෙයක් නොවන්නේය. මන්ද ඒවා සමාජගත නොවන බැවිනි. එබැවින් පුද්ගල භාවිතයට මෙන්ම පොදු සමාජ පිළිගැනීමටද දායක කළ හැක්කේ වටිනා සාහිත්‍ය නිර්මාණ බිහිවීම පමණකි.

යුදමය සාහිත්‍යයක අඩුපාඩුව යම්තාක් දුරට හෝ පියවා ගැනීමට ලුතිනන් කර්නල් සුජීත් චමින්ද එදිරිසිංහ විසින් රචිත ග්‍රන්ථයක් වන "කොකාවිල් සටන" කියවා ඇත්තෙමි. එය යුද්ධයෙන් අනතුරුව බිහි වූ ප්‍රබල රුසියානු සාහිත්‍ය නිර්මාණයක් මෙන් ඔහු කොකාවිල් සටන සෙබළුන්ගේ කැපවීම් හා වීරත්වය පිළිබඳව මනාලෙස හුවා දක්වමින් සමාජයට පණිවිඩයක් ඉදිරිපත් කර ඇත්තේ හමුදා අභිමානය ද ආරක්ෂා කර ගනිමිනි. කාලයක් සමඟ වැසී තිබුණු මුලතිව් සටන පිළිබඳව විශ්වාසනීය තොරතුරු පදනම් කරගෙන ඔහු අතින් ලියැවුණු "මුලතිව් සටන" පිළිබඳ කෘතියද යුද සාහිත්‍ය ප්‍රචලිත කිරීමට යම් ආකාරයකින් දායකත්වයක් සපයා ඇති බව අවිවාදයෙන් පිළිගත යුතුව ඇත.

මෙතෙක් කියවා නැතත් තවත් හමුදා නිලධාරීන් කිහිපපලක් අතින් මෙවන් සාහිත්‍ය නිර්මාණ බිහිවීම සතුටට කරුණකි. පසුගිය යුදමය කාලයේ හමුදා නිලධාරීන් හා සොල්දාදුවන්ගේ කාර්යභාරය වූයේ යුද්ධ කිරීම පමණක් නොවේ. සේනාංකාධිපතිවරු, බලසේනාධිපතිවරු, සිවිල් සම්බන්ධීකරණ නිලධාරීන්ගේ මගපෙන්වීමෙන් යුතුව සාමාන්‍ය සිවිල් ජනතාවගේ හිත සුව පිණිස විවිධාකාර සුබසාධන වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. විවිධ අයුරින් සාමාන්‍ය ජනතාවට සහයෝගය ලබාදෙන ලදී. මෙසේ බෙදාදුන් බඩුබාහිරාදිය හෝ ඉටුකරන ලද සේවය වෙනුවෙන් මෙහි පෙර සඳහන් කළාක් මෙන් වාර්තා තබා ගැනීම පමණක් ප්‍රමාණවත් කරුණක් වන්නේ නැත. අවතැන් වූ ජනතාවගේ පුද්ගල සුභසාධනය වෙනුවෙන් සොල්දාදුවන් ඉටු කළ කාර්යභාරය අලලා මා විසින් සාහිත්‍යමය නිර්මාණයක් ලෙස "නිරායුධ" නවකතාව ප්‍රකාශයට පත් කිරීම අප කළ සැබෑ සේවයේ අවංක යථාර්තය පෙන්වා දෙනු ලැබීය. එම කෘතිය ඉංග්‍රීසි භාෂාවෙන් පළ කර ලොව පුරා බෙදාහරින්න යැයි බොහෝ පාඨකයෝ මා වෙතින් ඉල්ලීම් සිදුකරන්නේ එම කාලයේ ශ්‍රී ලංකා යුද හමුදාවේ විශිෂ්ට කාර්යභාරයද අගය කරමිනි. එසේම ඒ තුළින් යුද හමුදාවේ මානුෂීයභාවය පිළිබඳව සියුම් පණිවිඩයක් ද ලබා දී ඇති බැවිනි.


වටිනා යුදමය අත්දැකීම් සහිතව සිටින බහුතරයකට ඒවා නිසි ආකාරයෙන් පෙළගස්වා ලිවීමේ හැකියාව සෑම අයකුටම නොමැති බව සැබෑවකි. එවැනි හැකියාවක්, කුසලතාවක් සෑම සොල්දාදුවකුටම පිහිටන්නේ නැත. එහෙත් එවැනි අත්දැකීම් ලබාගෙන හෝ අසා දැනගෙන හමුදාමය ස්වරූපයෙන් සාහිත්‍ය නිර්මාණකරණයේ යෙදවිය හැකි පිරිසක්ද හමුදාව තුළ සිටිති. එබැවින් අවශ්‍ය වන්නේ ඒ සඳහා නිසි මගපෙන්වීම හා අනුග්‍රහය ලබාදීම පමණක් යැයි සිතමි.

කිසිවිටකත් යුද්ධ භූමියේ කිසිදු අත්දැකීම් නොමැති සාමාන්‍ය සිවිල් ජීවිතයක් ගත කරන අතිදක්ෂ ලේඛකයකුට වුවද හමුදාමය සාහිත්‍ය නිර්මාණ සාර්ථකව කළහැක්කක් නොවේ. එවැනි නිර්මාණ කිහිපයක් මින් පෙර බිහිවී ඇතත් ඒවා අපේක්ෂිත ආකාරයෙන් සාර්ථක වී නැති බව පෙනේ. යුදමය සාහිත්‍යයක් බිහිවීමට අවැසි නිර්මාණ හමුදා පසුබිමක් සහිත නිර්මාණකරුවන් අතින් බිහිවීම වැදගත් වන්නේ එබැවිනි.



කර්නල් එම්ජීපී පෙරේරා
(විශ්‍රාමික)

## පරම වීර විභූෂණ සම්මානයෙන් පිදුම් ලැබූ විරුවෝ



## පුදුමාතලන් හිඳී සිදුකරනු ලැබූ

# වීර ක්‍රියාව

සටහන -
"උත්තමාචාර්ය" ග්‍රන්ථය ඇසුරිනි...



**හි/කමා554572 කෝප්‍රල් පුෂ්පමාල් වස්වත්තම පියබලිවම**
**කමාන්ඩෝ රෙජිමේන්තුව**

ඉර එළියට වැව්දිය මත ගස්වල සෙවණැලි මැවෙන අපූරුව පැස්ටල් කූරකින් සිනිඳු සුදු බිත්තියක අඳින්නට ඇඟිලිතුඩු පොරකැවත් අප්පච්චිගේ ධෛර්යයෙන් බැඳුණු වරිච්චි බිත්ති දෙස බලා පුංචි මාලක තම සිතැඟි ගිලගත්තේය. ගමේ හිතවතුන්ගේ උපකාරයෙන් තනාගත් කුඩා නිවසක ජීවත්වූ මාලක දරුවන් තිදෙනාකුගෙන් යුතු නිවසේ වැඩිමහල් දරුවාය. විජේරත්න අමරාවතී යුවලට දාව උපන් සැලවිදාන ආරච්චිගේ මනෝජ් පුෂ්පමාල්ට කවුරුත් ආදරයට ඇමතුවේ "මාලක" යන නමිනි. 1987 අප්‍රේල් මස 25 වැනි දින උපත ලැබූ මාලකට සිව් වසරක් ඉක්මගිය තැන් පටන් දෙමව්පිය සෙවනින් මිදී කිරි අම්මා ළඟ හිඳීමට සිදුවිය. අප්පච්චිගේ කර තෙක් ගොඩගැසුණු දහසකුත් කම්කටොළු ගොන්නෙන් නිවසට අලුතින් එක්වුණු පුංචි අමුත්තා මුදාගන්නටමෙන් මාලක මව්පිය උණුහුමින් මිදුණි.

කිරි අම්මාගේ තුරුලේ වැඩෙමින් 1993 වසරේදී පාසල් දිවියට පියනැගූ මාලක මූලික අධ්‍යාපනය ලැබුවේ හිඟුරක්ගොඩ කිරිමැටියාව කනිෂ්ඨ විද්‍යාලයෙනි. මේ වනවිට හිරිතලේ, සරණසිරිගම ජීවත්වූ ඔහුගේ පවුලට තෙවැනි සාමාජිකාව ද එක්ව සිටියාය. හේත් ගොවිතැනින් යන්තම්



**කෝප්‍රල් පුෂ්පමාල් ළමා කාලයේදී**

කර ඔසවනවිට මාලකගේ අප්පච්චි වැඩිමහල් පුතු තම සෙවණට කැඳවා ගත්තේ අගහිගකම්වලට දරු සෙනෙහස මරා දැමිය නොහැකි නිසාය. නැවතත් තම දෙමාපියන්කරා ගිය මාලක පොලොන්නරුව ජයන්ති ගුරුකුල කනිෂ්ඨ විද්‍යාලයේ තුන්වන ශ්‍රේණියට ඇතුළත් කෙරිණ. දැරණියගල පොල්ගස්වත්ත සිරිසුමන විද්‍යාලයෙන් හා පොළොන්නරුව ගිරිතලේගම මහා විද්‍යාලයෙන් ද අධ්‍යාපනය හැදෑරූ මාලක ඉගෙනීමේ කටයුතු කෙරෙහි මෙන්ම චිත්‍ර කලාව කෙරෙහිද විශේෂ නැඹුරුවක් දැක්වූයේය. දක්ෂ සිතුවම් ශිල්පියකු ලෙස කීර්තියක් අත්කරගත් හෙතෙම පාසල් ශිෂ්‍යභට කණ්ඩායමේ වසර හතරක පමණ කාලයක් සාමාජිකයකු ලෙසද කටයුතු කළේය. පාසල් ක්‍රියාකාරකම්වලින් ලද නායකත්ව පුහුණුව නිසාම ඔහු විද්‍යාලයේ ශිෂ්‍යභට කණ්ඩායමේ කෝප්‍රල් නිලය දක්වා උසස්වීමක්ද ලැබුවේය.

අපොස (සා/පෙ) විභාගයට පෙනී සිටීමෙන් පසු පාසල් දිවියට සමුදුන් මාලකගේ අරමුණ වූයේ රැකියාවක් ලබාගැනීමයි. කුඩුරුවෙල පිහිටි කමාන්ඩෝ රෙජිමේන්තුවේ තවකයින් බඳවාගැනීමේ පරීක්ෂණය සඳහා මාලකද ඉල්ලුම්පතක් යොමු කළේය. මූලික පරීක්ෂණයෙන් සමත්වූ හෙතෙම වෛද්‍ය පරීක්ෂණයට කැඳවීම ලැබෙන තුරුත් හමුදාවට බැඳීමට ඉල්ලුම් කළ පුවත තම නිවැසියන්ගෙන් සඟවා ගත්තේය. මව්පිය දැසින් කඩාහැලෙන උණු කඳුළු වැස්සක තෙමෙමින් දෙමාපිය ආශිර්වාදය ලබා තම මව්බිමේ උත්තරීතර නිදහස පතා 2007 වසරේ ජනවාරි 11 වන දා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කමාන්ඩෝ රෙජිමේන්තුවේ ඉඳුරාම බඳවාගැනීම් අංක 26 යටතේ සේවයට එක්විය. ඔහු කමාන්ඩෝ පුහුණු පාසල, උවා කුඩාඔය වෙතින් ආධුනික පුහුණු පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අතිදුෂ්කර පාඨමාලාවක් වන මූලික කමාන්ඩෝ පාඨමාලා අංක 58 හා කමාන්ඩෝ උසස් පාඨමාලා අංක 39 සාර්ථක ලෙස නිමකළේය. ලොව විශේෂතම හමුදාවන්ට පමණක් හිමිවන මෙරූන් හිස්වැසුම හා කමාන්ඩෝ නිල ලාංඡන පැළඳීමේ පරම භාග්‍යය හිමිකර ගනිමින් හෙතෙම කමාන්ඩෝ සෙබළකු වශයෙන් වර්ෂ 2008 ජූනි මස 02 වන දින කමාන්ඩෝ රෙජිමේන්තුවට ඇතුළත් විය.

දෙවන කමාන්ඩෝ රෙජිමේන්තුව වෙත එක්වීමෙන් අනතුරුව උතුරු ප්‍රදේශයන්හි ක්‍රියාත්මක රාජකාරි සිදුකරමින් සිටින අතරතුරදී මෙම අභීත රණවිරුවා තමා වෙත පැවරෙන සියලු රාජකාරි නොපිරිහෙලා ඉටු කළේය. සහෝදර යුද්ධ හමුදා සෙබළුන්ගේද සිත් දිනාගනිමින් තම වගකීම් නිසි අයුරින් ඉටුකිරීම උදෙසාත්, උදාර සේවය ඇගයීම වස් පිරිනැමෙන පූර්ණ භූමි පදක්කමෙන්ද මොහු පිදුම් ලැබීය.

**“2009 අප්‍රේල් මස 21 වන දා උදෑසන 0630 ට පමණ නැවතත් දරුණු ත්‍රස්තවාදී ප්‍රහාරයක් මෙම බණ්ඩිය වෙත එල්ලවිය. එයට සාර්ථකව ප්‍රතිප්‍රහාර එල්ලකළ මෙම කොනොනි දෙවැනි වරටත් දරුණු ලෙස ත්‍රස්ත ප්‍රහාරයකට ගොදුරු වූයේය. එම ප්‍රහාරයෙන් පසුවත් සිය ජීවිතය කෙරෙහි කිසිදු තැකීමක් නොකළ ඔහු කෙසේ හෝ මෙම සටනේ ජය යුද්ධ හමුදාවට අත්පත් කරගැනීමේ අරමුණින් ආරක්ෂක වළලේම රැඳී සිටියේය. එහෙත් ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් දරුණු ලෙස තුවාල ලද මෙම කොනොනි සිය අවසන් සුසුම්පොද පුදුමාතලන් වාතලයට මුසුකළේ සිය ගත රැඳි සවිය තම සහෝදර සෙබළුන් වෙත ලබාදෙමිනි. තම රට දැය සමය හා තම මිනිසුන් උදෙසා සිය ජීවිතය දුන් දහස් සංඛ්‍යාත වීර පුතුන් අතරට තවත් එක් අභීත පුතණුවකු එක්විය. දේශයේ උරුමය පතා රටවටා බැඳි රන්වැටෙහි දැල්වුණු තවත් පහනක් සදහටම නිවී ගියේය.”**

දෙවන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "ඒ" කණ්ඩායම යටතේ ක්‍රියාත්මක රාජකාරිවල යෙදෙමින් උතුරු ප්‍රදේශයන්හි කරන සටන්වලදී තම කණ්ඩායම සමඟින් සතුරු ඉලක්ක කරා ගොස් සතුරු භූමිය අත්පත් කරගනිමින් ජයග්‍රාහී හැඟීමෙන් කටයුතු කළේය. තම යුද්ධ හමුදා සේවයේ තවත් පියවරක් ඉදිරියට තබමින් 2009 වර්ෂයේ පෙබරවාරි 21 වැනි දා ලාන්ස් කෝප්‍රල් නිලයට උසස්වීමක් ලැබුවේද එහි ප්‍රතිඵලයක් ලෙසිනි.

2009 වසරේ අප්‍රේල් මස වනවිට වන්නි මානුෂීය මෙහෙයුම අවසන් අදියරට එළඹ තිබිණ. ත්‍රස්තවාදීහු සිය උපරිම වෙර යොදා ඉදිරියට ඇදෙන ආරක්ෂක හමුදා අඩපණ කිරීමට උපක්‍රම යෙදූහ. මේ අනුව ආරක්ෂක හමුදාවන්හි ඉදිරි සැලසුම් අඩාල කරමින් සිත්පිත් නැති ත්‍රස්තවාදීන් සිය උගුලට හසුකරගත්තේ උතුරේ වෙසෙන අහිංසක සිවිල් වැසියන්ය. ඒ අනුව දහස් සංඛ්‍යාත වූ සිවිල් වැසියන් සිය ප්‍රාණ ඇපයට හසුකරගත් ත්‍රස්තවාදීහු ඉදිරියට ඇදෙන ආරක්ෂක හමුදාවේ වේගය අඩාල කිරීමට සමත්වූහ. හුදෙක් සිවිල් වැසියන්ගේ ආරක්ෂාව කෙරෙහි සැලකිලිමත් වූ ආරක්ෂක හමුදාවෝ ෂෙල්වෙඩි ඇතුළු බරඅවි ප්‍රහාර සියල්ල නවතා දැමීමට තීරණය කළහ.

සුවිසල් පස්බැම්, අගල් හා බිම්බෝම්බ ඇතිරූ ප්‍රදේශ මෙන්ම බංකර් ආදිය යොදා සිය ආරක්ෂාව තරකරගැනීමට ත්‍රස්තවාදීහු මෙය අවස්ථාවක් කරගත්හ. ආරක්ෂක බංකර්වලින් යුතුමිලත් ආරක්ෂක වළලු හතරක්

යොදා තම බලය තරකරගත් එල්ටීටීඊ ත්‍රස්තවාදීහු සිය කණ්ඩායමේ ප්‍රබල නායකයින්ද සමඟින් කුඩා බිමකට කොටුවූහ. දෙපසකින් ජලයෙන් වටවී තිබූ මෙම භූමියෙහි බටහිරදිග ප්‍රදේශය මීටර් 600 ක් පමණ දිගින් යුතු කලපුවකින් හා නැගෙනහිර ප්‍රදේශය මුලතිව් මුහුදින්ද ආවරණය වී තිබිණ. මේ සියල්ල ආරක්‍ෂක අංශයන්හි ඉදිරි ගමන්මඟ අහුරාලන ප්‍රබල බාධක විය.

ඉරණමඩු සිතියමේ පුදුමාතලන් යුද මුක්ත කලාපයේ ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවා සිටි දහස් සංඛ්‍යාත සිවිල් වැසියන් මුදවාගැනීමේ උදාරතර මෙහෙයුම දියත්වූයේ මේ අතරතුරදීය. අතිසූක්‍ෂම ලෙස සකස්කරන ලද සැලසුම් ක්‍රියාත්මක කිරීමට යෙදුනේ 2009 අප්‍රේල් මස 20 වන දාය. මෙම දැඩි අවදානම් සහගත ක්‍රියාන්විතය සඳහා 2 වන කමාන්ඩෝ රෙජිමේන්තුවේ "ඒ" හා "බී" කණ්ඩායම් දෙක යොදාගැනීමට තීරණය කෙරිණ. ජාති, ආගම් භේද පසෙකලා දේශයේ උපන් තම මිනිසුන් වෙනුවෙන් ලේ දහඩිය හෙලන්නට උදාර රණවිරුවෝ රැසක් ආයුධ සන්නද්ධ වූහ. ඒ සඳහා සෙ/කමාං554572 ලාන්ස් කෝප්‍රල් පුෂ්පමාල් එස්ඩබ්එම් යන කොතොනිද "ඒ" කණ්ඩායමේ අටදෙනාකුගෙන් යුත් හටකණ්ඩායමක් සමඟින් යුද පෙරමුණ බලා ඇදුනේ අවසන් යුද මෙමෙහෙයුම සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙමිණි.

2009 අප්‍රේල් මස 19 වැනි දින ඉදිරි සැලසුම් සියල්ල නිසි පරිදි අවබෝධ කොටගත් මෙම කණ්ඩායම එදින රාත්‍රී උදාවත්ම සිය ක්‍රියාන්විතය ආරම්භ කළහ. පුදුමාතලන් පස්බැම්මේ බටහිර ප්‍රදේශයන්හි ඉදිකොට තිබූ ත්‍රස්තවාදී බංකර් පෙළ වෙත ප්‍රහාරයක් එල්ල කිරීම මොවුනට පැවරුණු පළමු රාජකාරිය විය. එහෙත් මීටර් 600 පමණ දිගින් යුතු වූ කලපු ප්‍රදේශය තරණය කිරීම ආරක්‍ෂක සේනාවන්ට පැවති ප්‍රධානම බාධකයක් විය. පෙරදින සිහිපයේදී සිදුකරන ලද විමර්ශනවලදී තීරණය වූ පරිදි ගොඩබිමට අවතීරණ වියහැකි මාර්ගය ඔස්සේ කරවටක් ජලයේ ගිලී සහ අඳුර මැදින් ඔවුන්ට ගමන්කිරීමට සිදුවිය. මෙය අතිශය සූක්‍ෂම හා දැඩි අවදානම් සහගත ක්‍රියාන්විතයක් වූ අතර, එම බැරෑරුම් කාර්යය සාර්ථකව ජයගැනීමට ආරක්‍ෂක සේනාවෝ සමත්වූහ.

අඩියක් අඩියක් පාසා වළලා තිබූ පුද්ගල නාශක බිම් බෝම්බවලින් යුතු කලපු තීරයේ තම ජීවිත පිළිබඳව අල්පමාත්‍රයක් වූද හැඟීමකින් තොරව සිය ඒකායන අරමුණ උදෙසා ගමන් කළ මෙම රණවිරුවෝ බංකර් පෙළ අත්පත් කරගැනීමට සිව්දෙනාකුගෙන් යුත් කණ්ඩායම් වශයෙන් ස්ථානගත වූහ. මෙම ක්‍රියාන්විතයේ අභියෝගය වූයේ දහස් සංඛ්‍යාත සිවිල් වැසියන්ගේ ජීවිත නිරුපද්‍රිතව මුදවාග ැනීමයි. ඒ උදෙසා ත්‍රස්තවාදීන් විසින් ශක්තිමත් ලෙස සකස්කරන ලද පස් බැම්ම බිඳ සිවිල් වැසියන්හට ආරක්‍ෂක අංශ කරා පැමිණිය හැකි මාර්ගය විවෘත කරදිය යුතුවිය. පස් බැම්මේ ආරක්‍ෂාව වෙනුවෙන් ත්‍රස්තවාදීන් විසින් බරඅවි යොදාගනිමින් මීටර් 25 ත් 25 ත් අතර ප්‍රමාණයේ දුරින් බංකර් සාදා පුද්ගලනාශක බෝම්බ හා ක්ලේමෝර් බෝම්බ ආදිය ස්ථානගත කොට තිබිණ. ඒ කිසිවක් මෙම කොතොනින්ගේ ස්ථිර වූ අරමුණ බිඳ හෙලීමට සමත් නොවුණේ මොවුන්ගේ මව්බිම දිනාගැනීමේ අරමුණ සියලු දේ අභිබවා ගිය හෙයිනි. තම වගකීම උදෙසා සිය දිවි පරදුවට තබා කටයුතු කිරීමට මොවුන් පසුබට නොවිය.

එදින අලුයම 0200 ට පමණ සැලසුම්සහගත ලෙස ත්‍රස්තවාදීන් වෙත පළමු ප්‍රහාරය එල්ල කෙරිණි. එල්ටීටීඊ ත්‍රස්තවාදීන් මව්තයට පත්කළ එම ප්‍රහාරය හමුවේ ප්‍රතිප්‍රහාර රැසක්ද එල්ලවිය. සිය බංකර් පෙළ කෙසේ හෝ රැකගැනීම ත්‍රස්තවාදීන්ගේ අරමුණ වූ අතර, හමුදා ප්‍රහාර හමුවේ ප්‍රතිප්‍රහාර එල්ලකරමින් පැය ගණනක් පුරා දරුණු සටන් ඇතිවිය.

ත්‍රස්තවාදීන්ගේ දරුණු සටන් හමුවේ තවදුරටත් ඉදිරියට ඇදීම අතිශයින්ම දුෂ්කර කාර්යයක් විය. එසේ නමුත්, රුදුරු ත්‍රස්ත ප්‍රහාර හමුවේ පසුබැසීමට තරම් නොවූ හෙයින් ඇටමිදුලු පසාරු කර වෙඩිලුණ්ඩ කිඳාබසිද්දීත් අභීත සිංහ පුත්‍රයකු ලෙසින් සිය සගයින් සවිමත් කරමින් මෙම කොතොනි ප්‍රතිප්‍රහාර එල්ල කළේය. ජීවිත පිළිබඳ දැඩි අවදානමක් දරමින් තම සිරුරේ වම් ප්‍රදේශයේ ඇතිවූ තුවාලයට තමා විසින්ම ප්‍රතිකාරකර නැවතත් සටන්බිමට එක්විය. නිලධාරී අණදෙන ගුවන්විදුලි සංඥා මඟින් පසුපසට එන ලෙසට දැනුවත් කළද නොනම් එම නියෝගය පසෙකලා සටන්බිමේ රැඳී සිටිමින් සිය සහෝදර සෙබළුන් සමඟින් සතුරාට ප්‍රහාර එල්ල කළේය.

පසුදින උදෑසන 0600 වනවිට පස්බැම්ම බිඳ අසරණ සිවිල් වැසියන් දහස් ගණනකගේ ජීවිත බේරාගැනීමට මොහු දැක්වූ මෙහෙය උදාරතරය. දිනක් පුරා එකම ස්ථානයේ රැඳී සිටි මෙම හටකණ්ඩායම පසුදින එනම් 21 වන දින තෙක් පස්බැම්මේ බලය තමා වෙත රඳවාගැනීමට සමත්වූහ. එහෙත් ත්‍රස්තවාදීන්ගෙන් එල්ලවන ප්‍රහාර අල්පමාත්‍රයකුදු අඩුවීමක් දක්නට නොතිබුණි.



2009 අප්‍රේල් මස 21 වන දා උදෑසන 0630 ට පමණ නැවතත් දරුණු ත්‍රස්තවාදී ප්‍රහාරයක් මෙම ඛණ්ඩය වෙත එල්ලවිය. එයට සාර්ථකව ප්‍රතිප්‍රහාර එල්ලකළ මෙම කොතොනි දෙවැනි වරටත් දරුණු ලෙස ත්‍රස්ත ප්‍රහාරයකට ගොදුරු වූයේය. එම ප්‍රහාරයෙන් පසුවත් සිය ජීවිතය කෙරෙහි කිසිදු තැකීමක් නොකළ ඔහු කෙසේ හෝ මෙම සටනේ ජය යුද්ධ හමුදාවට අත්පත් කරගැනීමේ අරමුණින් ආරක්‍ෂක වළලේම රැඳී සිටියේය. එහෙත් ත්‍රස්තවාදී ප්‍රහාරයෙන් දරුණු ලෙස තුවාල ලද මෙම කොතොනි සිය අවසන් හුස්මපොද පුදුමාතලන් වාතලයට මුසුකළේ සිය ගත රැඳී සවිය තම සහෝදර සෙබළුන් වෙත ලබාදෙමිනි. තම රට දැය සමය හා තම මිනිසුන් උදෙසා සිය ජීවිතය දුන් දහස් සංඛ්‍යාත වීර පුතුන් අතරට තවත් එක් අභීත පුතණුවකු එක්විය. දේශයේ උරුමය පතා රටවටා බැඳි රන්වැටෙහි දැල්වුණු තවත් පහනක් සදහටම නිවී ගියේය.

2009 වර්ෂයේ පුදුමාතලන් පස්බැම්මේ බටහිර ප්‍රදේශයේ තිබූ ත්‍රස්තවාදී බංකර් පෙළ විනාශකර ප්‍රාණ ඇපකරුවන් ලෙස සිටි දහස් සංඛ්‍යාත සිවිල් වැසියන් බේරා ආරක්‍ෂක අංශ වෙත යොමුකිරීමත්, තුවාල ලබා සිටියත් සටන් බිමෙන් ඉවත්ව නොගොස් සිවිල් වැසියන්ගේ ජීවිත ආරක්‍ෂා කිරීමට නොමසුරු දායකත්වය ලබාදී තම ජීවිතය පරදුවට තබා අභීත රණවිරුවකු ස්වේච්ඡාවෙන් ඉදිරිපත්ව, සිදුකරන ලද මෙම වික්‍රමාන්විත වූත්, උත්කෘෂ්ට වූත් නිර්භීත ක්‍රියාව අරභයා ජාතියේ ප්‍රණාමය පුදකිරීම වස් සෙ/කමාං554572 කෝප්‍රල් පුෂ්පමාල් එස්ඩබ්එම් යන අභීත රණවිරුවා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති හා සන්නද්ධ හමුදාවන්හි සේනාධිනායක ගරු මහින්ද රාජපක්‍ෂ මැතිතුමා විසින් 2013 ජූලි මස 15 වන දින අරලියගහ මන්දිරයේදී පරමවීර විභූෂණයෙන් පුදනු ලැබීය.

මෙම එඩිතර රණවිරුවාගේ දෙමාපියන් වන එස්ජී විජේරත්න සහ කේජී අමරාවතී යන දෙපළ අංක 35, සරණසිරිගම, හිරිතලේ, මින්නේරියේ යන ලිපිනයේ දැනට පදිංචිව සිටී.










# රැකියාව

**එදා රැකියාවෙන් මිදුන ගැමියා හවසට රා කට්ටක් බීවත් වලි දැම්මේ නැත. වැනි වැනි ගියේ නැත. යම් හෙයකින් පිත ඇවිස්සුනු දාක රා කට්ටෙන් උනත් බඩු වැඩි උනොත් පිලේ සිට කීවේ සී පදයකි. නැතිනම් ගාථා බණ්ඩයකි. අද ඩෝප් වැඩි උනොත් සංගීත සලාදය පැතිරෙන්නේ වොට් 200 බල්බ්වලින්ය. සමහර සිංදුවලින් කියැවෙන්නේ මොනවද කියලා රචකයාවත්, ගායකයාවත් දන්නේ නැත.**

මේක පිටු සියයක් ලිව්ය හැකි අකුරු හතරෙ ජොබ් එකක්. ඒකට රක්ෂාව කියලත්, රැකියාව කියලත් කියනවා. මේ ලියන එකත් ජොබ් එකක් වශයෙන් කරනවා. බලාගෙන යනකොට මේ අකුරු හතර ගැන පුදුමත් හිතෙනවා. බෙල්ල ලඟට කර එනකොට කොයිකාටත් රස්සාවක් කළොත් හොඳයි කියලා හිතෙනවා. ඉස්සර කාලේ පිරිමි තමයි හුඟක් වෙලාවට රස්සාවක් කළේ. මේ කාලෙ ගැහැණු අයත් රැකියාවල නිරතවෙනවා.

රජ කාලේ ජොබ්එකට කිවේ රාජකාරිය. රජතුමන්ගේ කටයුතු නිසා රාජකාරිය උණා. රාජකාරිය ඉටුකළේ නූලට. තිතට. නැතිනම් බෙල්ල ගහල යනවා. ඒ නිසා අදත් මිනිස්සු රාජකාරිය කියලා බොහොම ගරු ගාම්භීරව කතා කරන්නේ. මේ රාජකාරිය ඇරුනම සෙසු අයටත් රැකියාවල් තිබුණා. ගොවිතැන, ගුරුකම, වෙදකම, වඩුවැඩ, කම්මල් වැඩ, රෙදි විවීම, ආභරණ සෑදීම, ජෝතිෂ්‍ය වැඩ, ගැල් කර්මාන්තය, ධීවර රැකියාව සහ සතුන් ඇතිකිරීම (හරක්, එළුවන් ආදී) කුඹල් කාර්මාන්තය ආදී දේ ප්‍රධාන තැනක් ගත් අතර, තව සුළු කර්මාන්ත රැකියාව වශයෙන් කළා. ඒ කාලේ ජීවිකාව ගෙනගියේ මේවගේ රැකියාවලින්. හැබැයි මේ රැකියාවල විශ්‍රාම ගෙවීම් නැත. පාරිතෝෂික ගෙවීම් නැත. බෝනස් නැත. ඕටී නැත. ඉස්සර කාලේ අම්මලා, තාත්තලා වයසට ගියාම පුතාලා දුවලා ඒ රස්සාව කරලා තමන්ගේ මහළු දෙමාපියන් රැකබලා ගත්තා. ඒ නිසාම ඔය විශ්‍රාම, පාරිතෝෂික නැතිවුනා කියලා බයක් වෙන්න තිබුණේ නෑ. ඒ වගේ ගෞරවයෙන් තමන් පෝෂණය කරපු දෙමව්පියන් බලාගත්තා. අද ඒකෙ අනික් පැත්ත නිසා විශ්‍රාමයක්, පාරිතෝෂිකයක් නැතිවුනොත් මහපාරේ තමයි ඉන්න වෙන්නේ. පස්සේ පාලකයෝ දුරදිග බලලා වෙන්න ඇති ඔය විශ්‍රාම තියෙන, පාරිතෝෂික තියෙන රස්සාවල් හැදුවේ. අද ගොඩක් අය මේ රැකියාවල්ම සොයන්න උත්සාහ කරන්නේ මේ හේතුව නිසා වෙන්න ඇති කියලත් හිතෙනවා.

ඉස්සර රැකියා කළේ ගෙදර අසලමය. එහෙමත් නැත්නම් ගෙදරමය. බස් ගාස්තු, කෑම පැකට්, ඇඳුම් පැළඳුම්, සපත්තු සෙරෙප්පු වලට කියලා විශේෂ වියදමක්, ඒ වගේම මහන්සියක් දරන්න උනේ නැහැ. විශේෂයෙන්ම කරත්ත රස්සාව කරපු අය. ඒ කියන්නේ කරත්තවලින් පළාතෙන් පළාතට බඩු ප්‍රවාහනය කරපු අය කණ්ඩායම් පිටින් උයාගෙන කාලා, මඟ විවේක

ගත්තා. සමහරෙක් තවලං වැනි තැන්වල (කරත්ත පාක්) අසල ගෙවල්වලින් වළලු දාපු අත්වලින් උයපු කෑම කෑවා. ඉතින් මේ කෑම සපයන හාමිනේලාට බඩු භාණ්ඩ, තෑගිබෝග ලැබුණා. සමහර අයට හොර රහසේ ආදරෙත් ලැබුණා. අද උනත් සමහර රියැදුරන් කරන මහත්තැන්ලාටත් ඔෆිස් කිරියන් ඉන්නවා. හුඟක් වෙලාවට වැඩ නැතුව කාමර ඇතුළේ ඉන්න බොස්ලාට තමයි ප්‍රයිවෙට් ඇන්ඩ් කොන්ෆිඩෙන්ෂල් සෙකට්‍රිලා ඉන්නේ. පාළුව මකන්න.

අතීතයේ ඒ ඒ රැකියාව පාරම්පරිකව තාත්තගේ කර්මාන්තේ පුතා කළා. පුතාගෙන් ඊළඟ පුතාට. කිසිම තරඟයක් තිබුණේ නෑ. රැකියාවට ඉන්ටර්විව් තිබුණේ නෑ. තල්ලුවක් අවශ්‍ය උනේ නැහැ. පගාවක් දෙන්න අවශ්‍ය උනේ නෑ. දේශපාලනය කරලා තියෙන්න ඕනෙත් නැහැ. එසේම හරි නිදහස්ය. ස්වාධීනය. නිතැතින්ම රටේ සාමදානය රැකුණේය. වෘත්තියේ සතුට, විවේකය නිසිලෙස භුක්ති වින්ද වූ ඔවුහු විවේකය නොමඳව ලදහ. ඒ අවස්ථාවන්හිදී ගී, සිපද රචනා කළහ. නාඩගම් රඟපෑහ. චිත්‍ර ඇන්දහ. ගල් කැටයම් කළහ. ආගමික කටයුතුවල නිරතවූහ. මරණ මඟුල් චාරිත්‍රානුකූලව ඉටුකළහ. මෙවැනි වාතාවරණයක් තුළ දූෂණයක්, වංචාවක්, මංකොල්ලයක්, මිනීමැරුමක් සිදුවූයේ ඉතාමත් කලාතුරකිනි. මෙකළ පහළවී ඇති පාතාල ලෝක ගැන කවිරුත් අහලවත් තිබුණේ නැත. අද නම් උදේ සිට පසුවදා එළිය වැටෙන තුරුත් දහසකුත් එකක් කරදරය. සවස කාබී නිදාගත් ගැමියා පසුදින අවදිවූයේ පාන්දර කුකුළා හඬලන විටය. ඒ තරම් රැය නිසසලය. අද නම් සමහර විට එළිවන තුරු නිදාගන්නටවත් අපහසු අවස්ථා එමටය.

එදා රැකියාවෙන් මිදුන ගැමියා හවසට රා කට්ටක් බීවත් වලී දැම්මේ නැත. වැනි වැනි ගියේ නැත. යම් හෙයකින් පිත ඇවිස්සුනු දාක රා කට්ටෙන් උනත් බඩු වැඩි උනොත් පිලේ සිට කීවේ සී පදයකි. නැතිනම් ගාථා බණ්ඩයකි. අද ඩෝප් වැඩි උනොත් සංගීත සලාදය පැතිරෙන්නේ වොට් 200 බල්බිවලින්ය. සමහර සිංදුවලින් කියැවෙන්නේ මොනවද කියලා රචකයාවත්, ගායකයාවත් දන්නේ නැත. නිකම්ම කයිකබල් වාදන පමණි. එදා තිබ්බෙ වෙරි නොවන්නටය. අද බොන්නේ වෙරි වන්නටය. එදා පඩිදා කියා දිනයක් තිබුණේ නැත. එහෙත් අද පඩි දිනේ එනතුරු මඟබලා සිටින්නේය. ඊත් අතේ රැඳෙන්නේ දින දෙකතුනකි. ඒ අද රැකියාවේ තත්වයයි. ඉවසන්නම බැරිතැන පිකට් පාරක් දාලා පඩියට ගානක් වැඩිකර ගත්තත් දෙවැනි දවසේ බඩුමිල වැඩිකරලාය. පඩි වැඩිකරනවා. මිල වැඩිකරනවා. මිල වැඩිකරනවා. පඩි වැඩිකරනවා. ඔන්න චක්කරේ. වර්තමානයෙහි ඉල්ලුමට සැපයුම සිදුවන්නේ කලාතුරකින් තැනකය. දැන් රැකියා ගැන කලකිරීමක් ගොඩනැගී ඇත්තේ ජීවත්වන්නට තරම් වැටුපක් නොලැබීමය. ඉතින් රැකියාවට යාමට පෙර ලැබෙන වැටුප තමාට සෑහේදැයි කල්පනා කළ යුතුය. නමුත් ඊටත් පෙර කල්පනා කළයුතු තවත් දෙයක් ඇත. එනම් තමාගේ සුදුසුකම ලැබෙන රැකියාව ගැනය. උදාහරණයක් වශයෙන් වෘත්තියේ සුදුසුකම් උපාධිය නම් අපොස සමත් කෙනකුට එයට ඉල්ලුම් කළ නොහැකිය. තමාට තරඟ කළ හැක්කේ අපොස සුදුසුකම් ලබන රැකියාවකටය. ඉන්පසු රැකියා දෙක අතරෙහි වැටුප් තලයක් ලද පමණින් සතුටුවිය යුතුය. කොටින්ම කියනවා නම් පෙපර්තයාගේ හැටියටලු විමානය. මෙහිදී තම නුවණින් කටයුතු කිරීම තමයි මෙයට ඇති ප්‍රතිකර්මය. දහයක් පඩි ගන්නා අය පන්දහයක් පඩි ගන්නා පුද්ගලයකුගේ ජීවන රටාව අනුගමනය නොකළ යුතුය. තමාගේ වැටුපට අනුකූලව සකස්විය යුතුය. එහිදී, බොහෝ දේ කපා කොටා දැමීමට සිදුවේ. එහෙත් අකමැත්තෙන් වුවද එය නොකරන්නේ නම් ඇතිවන්නේ නොවිසඳෙන ප්‍රශ්න වැලකි. බොහෝ අය අතිරික්තය සොයාගැනීම පිණිස නොයෙක් කූට උපක්‍රම මඟින් කටයුතු කරති. සමහරු ජරාව කති. පගා ගනිති. නොකටයුතු නීතිවිරෝධී කටයුතු මඟින් මුදල් උපයති. තව සමහරු රැකියාවක් ලෙස හොරකම් කරති. අද සිදුවී ඇත්තේ මෙම ක්‍රියාදාමයයි. ලෝකයේම උතුම් සත්වයා ලෙස සැලකෙන මිනිසා යථාර්ථයෙන් තොරව කටයුතු කිරීම කිසිම දහමකට අනුකූල නැත. මෙලෝ වශයෙන් හොඳ යැයි සිතුවද කිසිම ආගමකට අනුව මොවුන් නම් නැවත මිනිසකුව උපදින්නේ නැත.

සටහන -:
මාණ්ඩලික සැරයන් බණ්ඩාර ඩබ්ලිව්එම්එම් (විශ්‍රාමික)

# පාසල් උපකරණ පරිත්‍යාගයක්





එක්සත් ජනපදයේ *'State Island Buddhist Center'* මධ්‍යස්ථානයේ පූජ්‍ය කුඹල්ඹළුවේ විමලජෝති හිමිපාණන්ගේ අනුග්‍රාහකත්වය මත රුපියල් මිලියන 3 ක වටිනාකමකින් යුත් පාසල් උපකරණ සහ පරිගණක බෙදාදීමේ වැඩසටහනක් 11 වන පාබල සේනාංකයේ හටපිරිස් ක්‍රියාත්මක කරනු ලැබූහ. ඉකුත් අප්‍රේල් 04 වන දින උඩාව, ශ්‍රී බෝධිඅංගනාරාම විහාරස්ථානයේදී ක්‍රියාත්මක කරනු ලැබූ මෙම පරිත්‍යාග වැඩසටහන යටතේ මාතලේ දිස්ත්‍රික්කයේ කුඹල්ඹළුව, උඩවල ග්‍රාම නිලධාරී වසමේ පදිංචි සිසු සිසුවියන් 120 දෙනකු වෙත පාසල් උපකරණ සහ පරිගණක 6 ක් බෙදාදෙනු ලැබීය. 11 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති, විසින් මෙම පරිත්‍යාග වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු සිදුකරන ලදී.



# ඩිජිටල් ලෝකයට සාදරයෙන් පිළිගනිමු!

පසුගිය කලාපය හා සබැඳේ...

## අතිශය භයානක හැකර්වරුන්ගෙන් ගැලවී සිටින්නේ කෙසේද?

අන්තර්ජාලය භාවිතා කිරීමේදී තම පෞද්ගලික තොරතුරු තවත් පාර්ශ්වයක් වෙත ලබාදීමේදී සැලකිලිමත් වන්න. ඔබ යම් සමාගමකට, පුද්ගලයකුට ඔබගේ පුද්ගලික තොරතුරු ලබාදී ඔවුන්ගේ සේවාවන් ලබාගත්තා වුවද බොහෝවිට ඔබගේ පුද්ගලික තොරතුරු යම් හෙයකින් පිටවුවහොත් (Leak) එම තොරතුරු ඔබටම විරුද්ධව තවත් පාර්ශ්වයකට භාවිතා කළ හැකිය. බොහෝමයක් සමාගම් තම පරිශීලකයින්ගේ දත්ත පිළිබඳව සහ එම දත්ත ආරක්ෂාව වෙනුවෙන් කිසිදු වගකීමක් නොගන්නා බවත් ඔබ මුලින්ම දැනුවත් වී සිටින්න. මන්ද ඔබ ඒ සමාගමේ වෙබ් පිටුවේ හෝ මෘදුකාංගය හරහා ලියාපදිංචි වන අවස්ථාවේදී ඔවුන් විසින් පනවන බොහෝමයක් නීති හා ගිවිසුම් කිසිදු ආකාරයකින් කියවා බැලීමක් සිදුනොකර ඉඳුරාම එකඟව (Accept) කර ඔබ ඔවුන් සමඟ ගිවිසුම්ගත වන අතර, යම් ආකාරයේ දත්ත ගලනයක් සිදුවුවහොත් ඔබට ඔවුන්ට විරුද්ධව කිසිදු ක්‍රියාමාර්ග යක්ද ගත නොහැකිය. එම කාරණාවම මුල්කරගෙන නිරායාසයෙන්ම පුද්ගලික තොරතුරු තවත් පාර්ශ්වයකට ලබාදීමේ වරද ඔබ මතම දමනවා ඇත. ඇතැම් සමාගම් විසින්ම තම පාරිභෝගිකයින්ගේ දත්තයන් නිර්නාමිකව අලෙවි කරන ලද අවස්ථාවන්ද ඕනෑ තරම් තිබෙන අතර, ඇතැම් සමාගම් තමන්ගේ දත්ත සංචිත ආරක්ෂා කිරීමට ඇවැසි නිසි ආරක්ෂිත ක්‍රියාමාර්ග ගන්නට පවා උනන්දු වන්නේද නැත. එයට හේතුව නම් දත්ත ආරක්ෂණය සඳහා අධික වියදමක් දැරීමට සිදුවීම සහ තමන් සපයන සේවාවෙන් ලැබෙන ආදායමට වඩා වැඩි ආදායමක් තම පරිශීලකයින්ගේ පෞද්ගලික දත්ත විකිණීමෙන් ලබාගැනීමට හැකිවීම යන ආදී කරුණු නිසායි. ඇතැම් සමාගම් තම පරිශීලකයින්ගේ තොරතුරු අවභාවිතා වන බව පවාද නොදන්නවා විය හැකිය. ඒ කෙසේ නමුත්, ඔබ අන්තර්ජාල සේවාවන් ලබාගන්නා සෑම සමාගමක් කෙරෙහිම 100% ක්ම අවිනිශ්චිතභාවයක් ඇතිකර ගැනීමද සිදුනොකළ යුතුය.

එමෙන්ම, මුදල් ගෙවා ලබාගත යුතු මෘදුකාංගයන් නොමිලේ ලබාදෙන (Cracking Softwares) වෙබ් අඩවි අන්තර්ජාලයේ ඕනෑ තරම් තිබෙන අතර, එවන් මෘදුකාංග හැකිතාක් ඔබගේ පරිගණකයේ හෝ ජංගම දුරකථනයේ ස්ථාපිත (Install) නොකරන්න. මන්ද එය ඔබට නොමිලේ ලබාදීම පසුපස හැකර්ස්වරයකු අනිවාර්යයෙන්ම සිටින අතර බොහෝ විට එම මෘදුකාංග අභ්‍යන්තරයේ හැකර්ස්වරයා විසින් ඔබගේ පරිගණකය හෝ ජංගම දුරකථනය දුරස්ථව සිට පාලනය කිරීමට හැකිවන සේ යම් යම් වෙනස්කම් සිදුකොට එය ඔබට නොමිලේම ලබාදේ. එමඟින් ඔවුන්ට ඔබගේ පරිගණකයේ හෝ ජංගම දුරකථනයේ කැමරාවන් මයික්‍රෝෆෝනයන් දුරස්ථව සිටිමින් පාලනය කිරීම මෙන්ම ඔබ සිටින ස්ථානයන් පවා ඔවුන්ට පහසුවෙන්ම දැනගත හැකිය. එම නිසා අන්තර්ජාලය හරහා කුමන මාදිලියක හෝ යමක් නොමිලේ ලබාදෙන්නේ නම් ඒ පිළිබඳව හොඳින් සොයා බලා එය ලබාගන්න.

තමන්ගේ පුද්ගලික ඊමේල් ගිණුම්වල, සමාජජාලා මාධ්‍ය ගිණුම්වල, තමන්ගේ අන්තර්ජාල බැංකු ගිණුම්වල තිබෙනා මුරපද (Passwords) කිසිදු විටෙක කෙතරම් විශ්වාස වුවත් තවත් කෙනකුට නොදී සිටීමට වගබලාගන්න. හැකි තරම් සංකීර්ණ සහ කෙනකුට පහසුවෙන් අනුමාන කළ නොහැකි ආකාරයේ මුරපද (Passwords) යොදා භාවිතා කිරීමට වගබලා ගන්න. උදාහරණ - උපන්දින, දුරකථන අංක, හැඳුනුම්පත් අංක ආදී දෑ මුරපද (Passwords) ලෙස නොදමන්න. අන් අයගේ පරිගණක සහ ජංගම දුරකථන මෙන්ම කාර්යාලයීය පරිගණක වැනි පොදු උපාංගයන් භාවිතාකර තම ඊමේල් ගිණුම් සහ සමාජ ජාලා මාධ්‍ය ගිණුම් වෙත ඇතුළත් (Log in) වීම සිදුනොකරන්න. එවිටද ඔබගේ මුරපදයන් (Passwords) ඇතුළුව බොහොමයක් රහසිගත තොරතුරු පහසුවෙන් තවත් කෙනකුගේ අතට පත්වීම සිදුනොවෙනු ඇත.

කුඩා දරුවන් හට පරිගණක සහ නවීන ස්පර්ශක තිර සහිත ජංගම දුරකථන (Touch Phone) ලබාදුන් පසු බොහෝ විට ඩාර්ක් වෙබ් හි සිටිනා ඩාර්ක් හැකර්ස්වරයකුගේ ගොදුරක් විය හැකියි. එසේ නොමැතිනම් රෙඩ් රූම් එකක වින්දිතයකුද විය හැකිය. එනමුත්, වර්තමානයේ තිබෙන දියුණුව නිසාවෙන් අධ්‍යාපන කටයුතු සඳහාද පරිගණක සහ

**මුදල් ගෙවා ලබාගත යුතු මෘදුකාංගයන් නොමිලේ ලබාදෙන (Cracking Softwares)**

**වෙබ් අඩවි අන්තර්ජාලයේ ඕනෑ තරම් තිබෙන අතර, එවන් මෘදුකාංග හැකිනාක් ඔබගේ පරිගණකයේ හෝ ජංගම දුරකථනයේ ස්ථාපිත (Install) නොකරන්න. මන්ද එය ඔබට නොමිලේ ලබාදීම පසුපස හැකර්ස්වරයකු අනිවාර්යෙන්ම සිටින අතර බොහෝ විට එම මෘදුකාංග අභ්‍යන්තරයේ හැකර්ස්වරයා විසින් ඔබගේ පරිගණකය හෝ ජංගම දුරකතනය දුරස්ථව සිට පාලනය කිරීමට හැකිවන සේ යම් යම් වෙනස්කම් සිදුකොට එය ඔබට නොමිලේම ලබාදේ.**

නවීන ජංගම දුරකථනවල තිබෙනා අනිවාර්ය අවශ්‍යතාවය හමුවේ ඔබගේ දරුවාට පරිගණකයක් හෝ නවීන ජංගම දුරකථනයක් ලබානොදී සිටිය නොහැකිය. එසේම, නිරතුරුවම ඔබට ඔබේ දරුවා පරිගණක හා ජංගම දුරකථන භාවිතයෙන් සිදුකරනා කටයුතු පිළිබඳව අවධානයෙන් බලාසිටීමටද නොහැක. ඒ නමුත්, ඔබගේ දරුවාට ලබාදෙන එම විද්‍යුත් උපාංගයන් සඳහා තාක්ෂණිකව යම් යම් සීමාවන් පැනවිය හැක. (උදාහරණ :- අධ්‍යාපනික වෙබ්අඩවි සඳහා පමණක් ප්‍රවේශවීමට හැකි ලෙස උපාංගයන් සැකසීම ආදිය) තවද, අන්තර්ජාල සේවා සපයන ආයතනය හා සම්බන්ධව Child Locks ආදිය යෙදීමද ඔබට සිදුකළ හැකිය. එමෙන්ම, දරුවාගේ පරිහරණය සඳහා ලබාදෙනු ලබන පරිගණකය කාමරයක නොතබා ඔබගේ නිවසේ සාලයේ තැබිය හැකිය. එමඟින් විවිධාකාරයේ වැරදි ක්‍රියාවන්වලට දරුවා යොමුවීම විශාල වශයෙන් අඩුවන අතර, නන්නාඳුනන පුද්ගලයකු සමඟ යම් ඇසුරක් පවත්වනවාද නැද්ද යන්න පිළිබඳව විමසිලිමත්වීම තුළින් බොහොමයක් සයිබර් අපයෝජනවලින් ඔබගේ දරුවා ඔබටම ආරක්ෂාකරගත හැකිය.

ඉහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමුකළහොත් ඔබටත් හැකර්ස්වරුන්ගේ ග්‍රහණයට ලක්නොවී ඩිජිටල් ලෝකය තුළදී නැතුවම බැරි අන්තර්ජාලයෙන් නිසිඵල නෙලා ගැනීමට හැකි වේවි.

## තොරතුරු යනු ධනයයි (Information is wealth)

තමන් අන්තර්ජාලය හරහා බැංකු කටයුතු සිදුනොකරන්නේය. කිසිදු ආකාරයක වෙළඳ කටයුත්තක් සිදුනොකරන්නේය. සමාජ ජාලා මාධ්‍ය ගිණුමක්ද පවා නොමැති අතර, හුදෙක්ම සිය විනෝදය පිණිස අන්තර්ජාලය භාවිතා කරමින් සිටින්නේ යැයි කියා යමෙකුට සිතෙන්නට පුලුවන. කෙටියෙන්ම කිවහොත් ඔහුගේ හෝ ඇයගේ දුරකථන අංකයන් ලිපිනයන් උපන්දිනයන් ආදී තොරතුරු පිටස්තරයකු අතට පත්වූවාට ඒවායෙන් ඵලක් නොමැති බවද කල්පනා කරනවා විය හැකිය. එනමුදු අන්තර්ජාලයට ඔබගේ පැමිණීම හැකර්ස් කෙනකුට හෝ අන් අයගේ පෞද්ගලික දත්තයන් සොරාගෙන අලෙවි කරන අයකුට මහමෙරක්ය. වෙළඳ දැන්වීම් ප්‍රචාරණයට මෙන්ම තවමත් හඳුනානොගත් උපක්‍රමයන් මස්සේ ඔබව ග්‍රහණයට නතුකොටගෙන ඔබවත් ඔවුන්ගේ ඉත්තකු බවට පත්කර ගැනීමේ කටයුතු සිදුකිරීම උදෙසා ඔවුන්ට අන්තර්ජාලය වෙත ඔබගේ පැමිණීමම ප්‍රමාණවත්ය.



අප අතර සිටින පුද්ගලයින් දස දෙනකුගෙන් නව දෙනකු හට ඊමේල් ලිපිනයන් තිබේ. ඒ තරමටම අන්තර්ජාලය සහ පරිගණක අප ජීවිතවලට කා වැදී ඇත. අන්තර්ජාලය සහ පරිගණක නොමැතිව ඔබගේ තොරතුරු පිටතට ගලා යා හැකි තවත් ක්‍රම ඇත. ඒවා නම් සංනිවේදන මධ්‍යස්ථාන (Communication Centers) හරහා ඔබගේ වැදගත් ලියකියවිලි ඊමේල් මඟින් යැවීම සහ ඔබගේ ජාතික හැඳුනුම්පත ඇතුළු අතිශය වැදගත් ලියකියවිලි ආදියෙහි ඡායා පිටපත් (Photo Copy) ලබාගැනීම සිදුකිරීම මෙන්ම ස්කෑන් කිරීම සහ අන්අයගේ කැමරාවලින් හෝ ජංගම දුරකථනවලින් ලබාගන්නා අපගේ ඡායාරූප. ඒ මාර්ගයෙන්ද ඔබගේ පුද්ගලික තොරතුරු පිටවී තවත් අයකුට අවභාවිතා කළහැකිය. එම නිසා එවන් කටයුතු සිදුකිරීමේදී දැඩි අවධානයෙන් සිටින්න.

මතක තබාගන්න ඔබගේ ජීවිතයේ සෑම දෙයක්ම විශේෂයෙන් පුද්ගලික දේවල් අන්තර්ජාලයට ඇතුළත් කරන්න එපා!

එසේ වුවහොත්, ඔබටත් සිදුවන්නේ ඔබටත් නොදැනීම තවත් කෙනකුගේ පාලනයට නතු වීමටය.

ඇත්ත වශයෙන්ම අප ප්‍රවේසම් විය යුත්තේ කාගෙන්ද? හැකර්ස්ලාගෙන්ද? මාගේ අදහස නම් අප ප්‍රවේසම් විය යුත්තේ අපගෙන්මයි කියාය.

**ස්පර්ශක තිරය සහිත (Touch Phone) දුරකථනයක් අරන් ඩිජිටල් ලෝකයට කවුරුන් පැමිණියත් ඔහුගේ හෝ ඇයගේ හිස ගල්වන කෑම්පු වර්ගයේ සිට පය පළඳින පාවහන් ගැනම පමණක් නොව ඔහු හෝ ඇය කැමති අකමැති සියලුම තොරතුරු පිටවෙනවා. මෙය වර්තමාන ඩිජිටල් ලෝකයේ කොතනකවත් ලියා නැති සිද්ධාන්තයයි.**

"ඔබත් ඔබගේ වටිනා ජීවිතය තාක්ෂණයේ බිල්ලක් බවට පත්වීමට ඉඩ නොහරින්න"




සටහන -:
සෙ/322441 සැරයන් පෙරේරා එම්ඩීපීආර් ආර්එස්පී
1 ශ්‍රීලපාහ
පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය
බත්තරමුල්ල



# "චර්ම රෝගයක් වැළඳුණු මුල් අවස්ථාවේදීම ඊට වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුයි"

## - චර්ම රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍ය ලුතිනන් කර්නල් ලක්මාලි පතිරාජ

චර්ම රෝග සම්බන්ධ විශේෂඥ වෛද්‍යවරියක වන ලුතිනන් කර්නල් ලක්මාලි පතිරාජ දැනට ශ්‍රී ලංකා යුද්ධ හමුදා රෝහලේ චර්ම රෝගී සායන අංශයේ සේවය කරනු ලබයි. ඇය මාතර සුජාතා බාලිකා විද්‍යාලයෙන් සිය ද්විතීක අධ්‍යාපන කටයුතු නිමකර කොළඹ වෛද්‍ය විද්‍යා පීඨයට ඇතුළත්ව වෛද්‍ය විද්‍යා උපාධිධාරිනියක ලෙස සිය අධ්‍යාපන කටයුතු සාර්ථකව නිමකිරීමෙන් අනතුරුව "ඇමරිකන් ඇකඩමි ඔෆ් ඊස්තටික් මෙඩිසින්" (American Academy Of Aesthetic Medicine) විශ්ව විද්‍යාලයෙන් වෘත්තීය සුදුසුකම් ලබන ලද ශ්‍රී ලාංකීය වෛද්‍යවරියන් දෙදෙනා අතරට එක්වීමේ භාග්‍යය හිමිකරගෙන ඇත. තවද, රාජ්‍ය සේවයට එක්වීමෙන් පසු චර්ම රෝග පිළිබඳව විශේෂඥ වෛද්‍යවරියක ලෙස වසර ගණනාවක හසල අත්දැකීම්ද ලබාඇති ඇය 2019 වසරේදී ලුතිනන් කර්නල්වරියක වශයෙන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට එක්ව දැනට නාරාහේන්පිට යුද්ධ හමුදා රෝහලේ චර්ම රෝග අංශයට අනුයුක්තව සේවය කරනු ලබයි. මෙම විශේෂාංග ලිපිය හමුදා කඳවුරක සේවය කරන සෙබළුන් අතර බහුල වශයෙන් ව්‍යාප්තවීමේ හැකියාවක් ඇති චර්ම රෝග හා ඒවා බෝවීම වළක්වාගැනීම මෙන්ම එකී රෝග වෙනුවෙන් ලබාගතයුතු ප්‍රතිකාර සම්බන්ධව හමුදා සෙබළුන් දැනුවත් කිරීමේ මූලික අරමුණින් ඇය සමඟින් පවත්වන ලද විශේෂ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරෙන් සකස් කෙරිණි.

**ප්‍රශ්නයෑ- චර්ම රෝගයක් යනු කුමක්දැයි කෙටියෙන් නිර්වචනය කළහොත්?**

පිළිතුරෑ- අපගේ ශරීරය තුළ පිහිටාඇති විශාලතම ඉන්ද්‍රියක් වශයෙන් "සම" හැඳින්විය හැකියි. එනිසාම සම ආශ්‍රිතව ඇතිවිය හැකි රෝගී තත්ත්වයන් බහුලයි. එමෙන්ම ශරීරය ඇතුළත හටගන්නා අනෙකුත් රෝග මෙන් නොව, සම ආශ්‍රිතව ඇතිවන මෙම රෝගී තත්ත්වයන් පිටතට නිරාවරණය වීමේ හැකියාව වැඩියි. එනිසාම අනෙකුත් ලෙඩ රෝගවලට සාපේක්ෂව චර්ම රෝගයක් වැළඳුණු පුද්ගලයකු යම්කිසි මානසික පසුබෑමකට ලක්වීමේ හැකියාවක් තිබෙනවා. එමෙන්ම මෙම චර්ම රෝග සෑදීමට හේතුවන කරුණු අතර ජානමය හේතු, බැක්ටීරියා ආසාදන, වෛරස් ආසාදන මෙන්ම ශරීරයේ ඇතුළත සෑදෙන වෙනත් රෝගී තත්ත්වයක් නියාවෙන් ඇතිවිය හැකි චර්ම ආසාදනයන්ද තිබෙනවා. ඒ අනුව මොනයම් වූ හේතුවක් නිසා යම් පුද්ගලයකුගේ සමෙහි සංයුතියේ ඇතිවන වෙනසක් "චර්ම රෝගයක්" ලෙස හැඳින්විය හැකියි.

**ප්‍රශ්නයෑ- කිසියම් පුද්ගලයකුට මෙම චර්ම රෝග ඇතිවීමට බලපාන ප්‍රධාන හේතු මොනවා ද?**

පිළිතුරෑ- චර්ම රෝගයක් ඇතිවීමට බලපාන ප්‍රධාන හේතූන් අතර, ජානමය හේතූන් මෙන්ම විවිධ පාරිසරික තත්ත්වයන්, එනම් අධික හිරු රශ්මියට නිරාවරණය වීම මෙන්ම සූර්යයාගෙන් පැමිණෙන සමට අහිතකර පාරජම්බුල කිරණ මඟින් සිදුවන බලපෑම් සහ අප භාවිතා කරනු ලබන විවිධ වර්ගයේ චර්ම ආලේපන නිසාද චර්ම රෝගී තත්ත්වයන් ඇතිවීමේ හැකියාවක් තිබෙනවා.

**ප්‍රශ්නයෑ- අද වෙළෙඳපොළ තුළ විවිධ චර්ම ආලේපන දක්නට ලැබෙනවා. සැබැවින්ම මේවා ආලේපනය කිරීම සමට කොතරම් සුදුසුද?**

පිළිතුරෑ- ඇත්තෙන්ම අද වෙළඳපළ තුළ විවිධ චර්ම ආලේපන ඉතා බහුල වශයෙන් දක්නට ලැබෙනවා. එම චර්ම ආලේපන අතර ප්‍රමිතියක් සහිත සහ කිසිදු ප්‍රමිතියකින් තොර චර්මාලේපනද දක්නට ලැබෙනවා. එමෙන්ම යම්කිසි පුද්ගලයෙක් චර්ම ආලේපනයක් භාවිතා කරන්නේ නම් අනිවාර්යෙන්ම ඔහු හෝ ඇය යම්කිසි ප්‍රමිතියක් සහිත චර්ම ආලේපනයක් තෝරාගත යුතුයි. එසේම එසේ තෝරාගන්නා ලද චර්මාලේපනය ඔබගේ සමට ගැළපෙනවාද යන්න පිළිබඳව වඩා සැලකිලිමත්



විය යුතුයි. මෙසේ ආලේපන තෝරාගැනීමේදී සාමාන්‍ය සමට, වියළි සමට තෙල්සහිත සමට මෙන්ම වඩා සංවේදී සමකට සුදුසු චර්මාලේපනයන් තිබෙනවා. එමෙන්ම මේ කවර ආකාරයේ චර්මාලේපනයක් වුවද එය ඔබගේ සමට ගැලපිය යුතුයි. එමෙන්ම විශේෂයෙන්ම සඳහන් කළ යුත්තක් වන්නේ සම සුදුකරගැනීම මෙන්ම වඩා පැහැපත් සමක් ලබාගැනීම සඳහා දේශීයව නිෂ්පාදනය කරනු ලබන චර්මාලේපනයන් අතර, සමට අහිතකර රසදිය සහිත චර්මාලේපයන්ද තිබෙන බවයි. එබැවින් මෙවැනි සමට අහිතකර චර්මාලේපයන් භාවිතා කිරීම තුළින් ඔබට ඔබගේ සම සුදුකරගැනීමට හැකියාවක් ලැබුනද ඉන් ලැබෙන අතුරු ප්‍රතිඵල භයානකයි. එනිසා හිතුමතේ මෙවැනි අහිතකර චර්මාලේපනයන් භාවිතා කිරීම තුළින් සමේ පිළිකා තත්ත්වයන් පවා ඇතිවිය හැකියි. එබැවින් ඔබ කිසිවිටෙක ඔබගේ මිතුරන් භාවිතා කළ පමණින් හෝ චර්මාලේපනයන් පිළිබඳ වෙළඳ දැන්වීමක් දුටු පමණින් ඒවා භාවිතා කිරීමට පෙළඹීම සුදුසු නොවේ.

**ප්‍රශ්නයඃ- වඩාත් නිරෝගී සමක් පවත්වා ගෙන යාම වෙනුවෙන් අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග කවරේද?**

පිළිතුරඃ- එය ඉතාමත් වැදගත් ප්‍රශ්නයක්. අපේ සම නිරෝගීව හා පිරිසිදුව තබාගැනීම වෙනුවෙන් සිදුකළ යුතු ක්‍රියාපිළිවෙත් අනුගමනය කළ යුතුයි. විශේෂයෙන් කේශාන්තයේ සිට පාදාන්තය දක්වා අප සම ආශ්‍රිතව පවතින විවිධ රෝගී තත්ත්වයන් වන හිස්හොරි ආසාදන, හිසකෙස් අකලට ගැලවියාම පිළිබඳ ගැටලු, මුහුණේ ඇති කුරුලෑ හා ලප කැළැල් ආදී තත්ත්වයන්, ඉන්නන්, ඉකිලි ආශ්‍රිතව ඇතිවන අවපැහැගැන්වීම් ඇතුළු ආසාදනයන් හා වෛරස් ආසාදනයන් සම්බන්ධව වෛද්‍යවරයකු හමුවී නොපමාව ප්‍රතිකාර ලබාගත යුතුයි. එමෙන්ම ඔබගේ මුහුණ ආශ්‍රිතව පිහිටා ඇති සම නිරෝගීව පවත්වාගෙන යෑම සඳහා දිනපතා එනම් උදේ සවස අනුගමනය කළයුතු ක්‍රියා පිළිවෙතක් තිබෙනවා. ඒ අනුව සෑම දිනකම උදෑසන ඔබේ මුහුණ සේදීම වෙනුවෙන් සුදුසු පිරිසිදු කාරකයක් (Face wash) භාවිතාකර එම සේදුම් කටයුතු සිදුකළ යුතුයි. එමෙන්ම දිවා කාලය තුළ හිරු එළියට නිරාවරණය වන ඔබගේ සමෙහි තෙතමනය ආරක්‍ෂා කරගැනීම සඳහා ඔබගේ සමට වඩාත් යෝග්‍ය වන හිරු එළියෙන් සම ආරක්ෂා කරගැනීම සඳහා භාවිතා කරන ක්‍රීම් වර්ගයක් භාවිතා කිරීමෙන් පසු රූපලාවණ්‍ය කටයුතු සිදුකිරීම වඩාත් සුදුසුයි. එමෙන්ම බෙල්ල ප්‍රදේශය ආශ්‍රිතව හටගන්නා ඉන්නන් සහ ඉකිලි ආශ්‍රිත ප්‍රදේශවල ඇතිවන අවපැහැගැන්වීම් ඇතුළු වෙනත් දිලීර ආසාදන සඳහා නොපමාව වෛද්‍ය ප්‍රතිකාර ලබාගත යුතුයි. එමෙන්ම මුහුණු ප්‍රදේශය ආශ්‍රිතව සේදීම් කටයුතු සිදුකර පිරිසිදු කරගන්නා අවස්ථාවන්හිදී ඒ සඳහා ඔබේ සමට ගැලපෙන මෘදු සබන් වර්ගයක් හෝ සේදීම් කාරකයක් ඒ සඳහා යොදාගත යුතුයි.

**ප්‍රශ්නයඃ- ඉකිලි ආශ්‍රිතව, හා ලිංගාශ්‍රිතව ඇතිවන චර්ම රෝග හේතුවෙන් බොහෝ පුද්ගලයන් පීඩා විඳින බව දක්නට ලැබෙනවා. ඇතැම් විට ඔවුන් එම තත්ත්වයන් මත වෛද්‍යවරුන් හමුවීමට පවා මැලිකමක් දක්වනවා. මෙම රෝගී තත්ත්වයන් ගෙන් අත්මිදීමට ඔවුන් ගතයුතු පියවරයන් කවරේ ද ?**

පිළිතුරඃ- විශේෂයෙන් සඳහන් කළයුතු වන්නේ ඉකිලි හා ලිංග ආශ්‍රිතව සුලභව දැකගත හැකි වන්නේ දිලීර ආසාත්මිකතාවනයන් නිසා ඇතිවන රෝගී තත්ත්වයනුයි. එමෙන්ම, මෙම රෝගී තත්ත්වයන්ට මූලිකව බලපානුයේ පුද්ගලයන්ගේ අයහපත් සෞඛ්‍ය පුරුදු, එනම් යට ඇඳුම් ආදිය නොසෝදා දිනකිහිපයක් ඇඟලෑම, අධික උෂ්ණාධික දිනයන්හිදී දීර්ඝ වේලාවක් ඇඟට තදවූ එකම යට ඇඳුම ඇඳ සිටීම ආදිය කරුණු මීට හේතුවනවා. මෙවැනි ආසාත්මිකතා ඇති රෝගීන් වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවන්නේ එම රෝගී තත්ත්වයන් ඉතාමත් උග්‍රවූ අවස්ථාවලදී පමණයි. එසේම, මෙවැනි රෝගී තත්ත්වයන් සඳහා ප්‍රතිකාර වශයෙන් ඉකිලි ආශ්‍රිත ප්‍රදේශවල රැඳෙන තෙතමනය වියළි පිරිසිදු රෙදි කැබැල්ලකින් පිසදා පිරිසිදුකර වියළිව තබාගැනීම, යට ඇඳුම් නිතර පිරිසිදුකර පාවිච්චියට ගැනීම යට ඇඳුම් තද අව් රශ්මියට දමා හොඳින් වේලා ගැනීම සහ ඔබ භාවිතා කරන තුවා, යට ඇඳුම්, පතා, බුරුසු හා රැවුල බාන රේසර ආදිය හවුලේ භාවිතා කිරීමෙන් වැළකී සිටීමටද ඔබ වගබලා ගතයුතුයි. මෙහිදී, විශේෂයෙන් සඳහන් කළ යුතු වන්නේ ලිංගාශ්‍රිතව හෝ ඉකිලි ප්‍රදේශ ආශ්‍රිතව ඇතිවන දිලීර ආසාත්මිකතාවයන් හේතුවෙන් හිතුමතේ ක්‍රීම් වර්ගය ආලේප කිරීමට යෑමෙන් වැළකී සුදුසුකම් ලත් වෛද්‍යවරයකු වෙතින් පමණක් ඒ සඳහා ප්‍රතිකාර ලබාගත යුතු බවයි.

**ප්‍රශ්නයඃ- චර්ම රෝගයක් කිසියම් පුද්ගලයෙක්ගෙන් තවත් පුද්ගලයකු වෙත ව්‍යාප්ත වීමට හැකියාවක් තිබේ ද?**

පිළිතුර :- චර්ම රෝග තත්ත්වයන් දෙයාකාරයකින් යුතුයි. ඒ අනුව සමහර චර්ම රෝග තත්ත්වයන් යම් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකු වෙත බෝවීමේ හැකියාවක් ඇති අතර, තවත් සමහර චර්ම රෝගී තත්ත්වයන් එසේ යම් පුද්ගලයකු වෙතින් තවත් පුද්ගලයකුට සම්ප්‍රේෂණය නොවේ. විශේෂයෙන් මෙසේ බෝවන චර්ම රෝගී තත්ත්වයන් අතර බැක්ටීරියා ආසාත්මිකතා, දිලීර ආසාත්මිකතා ආදිය ප්‍රධාන තැනක් ගන්නා අතර එක්සිමා, සොරයිසිස් ආදී චර්ම රෝගී තත්ත්වයන් එසේ යම් පුද්ගලයකුගෙන් තවත් පුද්ගලයකු වෙත බෝවෙන රෝගී තත්ත්වයන් නොවේ. නමුත් සාමාන්‍ය ජනතාවට මේ පිළිබඳ නිවැරදි වැටහීමක් නොමැතිකමින් එක්සිමා ආදී රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන රෝගීන් සමාජයෙන් කොන්වීම පවා දැකගත හැකිවනවා. නමුත් එවැනි රෝගී තත්ත්වයන්ගෙන් පෙළෙන රෝගියකුගෙන් තවත් අයකුට එම චර්ම රෝගය වැළඳෙනු ඇතැයි එසේ අනියත බියක් ඇති කර ගත යුතු නොවේ.

**ප්‍රශ්නයඃ- එමෙන්ම සුදු කබර වැනි චර්ම රෝග නිට්ටාවටම සුවකිරීමේ හැකියාවක් තිබේද?**

පිළිතුරඃ- ඇත්තෙන්ම එවැනි සමහර චර්ම රෝගී තත්ත්වයන් සම්පූර්ණයෙන්ම සුව කිරීමේ ක්‍රමවේදයක් වෛද්‍ය විද්‍යාවට අනුව තවමත් සොයාගෙන නැහැ. කෙසේ වුවත් එවැනි චර්ම රෝගී තත්ත්වයකින් පෙළෙන පුද්ගලයකුගේ එම රෝගී තත්ත්වය යම් ප්‍රමාණයකින් පාලනය කිරීමේ හැකියාවක් වෛද්‍ය විද්‍යාව සතුයි. ඒ අනුව මෙලෙස රෝගී තත්ත්වයන් පාලනය කළ පුද්ගලයකුට සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමේ හැකියාවක් තිබෙනවා. එනමුත් කිසියම් හෝ අවස්ථාවකදී එම රෝගී තත්ත්වයන් මොනයම් හෝ ආකාරයකින් නැවත මතුවීමේ හැකියාවක් තිබෙනවා. සාමාන්‍යයෙන් මෙවැනි රෝගී තත්ත්වයන් හටගනුයේ අප ශරීරය තුළ ඇති ප්‍රතිශක්තිකරණ පද්ධතියේ ඇතිවන හදිසි වෙනස්වීම් මතයි. එනිසා එම රෝගී තත්ත්වයන් යළි උද්ගත වූ විට නැවත වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමුවිය යුතුයි.



සංවාද සටහන -:
ලුතිනන් දුමින්ද සෙනරත්
ර/සෙබ් ශ්‍රීලශ්‍රපොදුසෙම
ජනමාධ්‍ය අධ්‍යක්ෂ මණ්ඩලය
යුද්ධ හමුදා මූලස්ථානය

# සෙබළ සිතුවිලි



## මගේ පියාණන්...

මතක පොතක ලියන
තරම් ඉක්මවන
අපේ මතක අමතක නොවන
තෙමෙන හිතක් අවුස්සන
එතරම් සියුම්ව වැයෙන
තත් වන් පරිකල්පන

නොරවීන් නොපැමින
සුද්දියක ලෙසින් වන
නමක් පටපැදගෙන
සුද්දී ලෙසින් හැමදින
කල සිට නොතේරෙන
එකට සිටියා එකාමෙන

කජුගස් අතුනැමෙන
නැවී පොලොවට බරළන
නැවක් වුවා මුදේ යන
අපට මුදට නොයන
ඇයද නැගනියද එන
නැවී මම කපිතාන් තැන

උල්කැන්දා පටිල වීන
කොහිකිරිල්ලා පඩවැලක ඉදෙන
දම් වල්දෙල් පුහුලන් එල්ලුන
ඇඹිල්ල හිඹුටු මාදං කලුවට පෙනුන
කුරුම්බා වැලවරක ලිඳ ලඟ තිබුන
පිනෙව්වා දොල මෙන්ම අපේ මන

වෙලට උඩින් ගහේ ගොරකා ඉදෙන
ලොකුගුනසේකරගෙ ඕවිටේ තිබෙන
රත්මල්ගහෙන් අපුරුවට හැදුන
රතඹලා කහා වෙලට වැටුන
අඹ ඇහිලුවා ඔබ සමගින
රබර් වත්තේ මෙනා කොන

ලොකුඅම්මා සැපේ නිවන
අයෙකු වී ඇත එය විඳින
අමුඩය ගසා පොල්අතු වියවන
ගමන් පොල් අතු විලින් ගොඩදමන
කෑ ගසා ඔච්චමින් සිනාසුන
එදින "මු මීමා නම් මාමා" අද, මම උන
ආදර "සුද්දී" දුවට පනම්
"සුභොපන්දිනයක් වේ

මේජර් මංජුල වීරසිංහ
පෙදවින අණදෙන නිලධාරී
11 ශ්‍රලපෙර

## විරු සොයුර...

ගිනි අවියට හිසතියන්
යුද බිමේ හිඳිනා සොයුර නුඹ
ජීවිතේ වසන්තය
අප වෙනුවෙන් බිලිකොට
යුද ගිනිදැල් මැද
දැවෙන නුඹට
නයයි අප සඳා
දුර ඈත සිටියත් නුඹ
එක්ව හඳින් ඔබ හා
පතන්නම් සදා ජය ඔබට
ගිනිබටයේ රස්නය උහුලන්නට
යුදබිම් කතරේ පිපාසය දරාගන්න
හැකිවේවා ඔබට සොඳින්
හෙට්දින ජයගැනුමට
මෙන්න පැතුම් හිත තුලින්
යුදබිමේ දිවි ගෙවනා
සොයුර නුඹ වෙනුවෙන්
හදවතින් ජය පතලා

සෙ/384751
ලා/කෝ ශ්‍රීනාත් ජීඩබ්ලිව්
7 ශ්‍රීලංසිරෙ

## මාපිය සෙනෙහස...

සුන්දර උදෑසනක
යානතමට පිපුණු
පුංචි නිල් මහනෙල් මලක
පෙත්තක් මත පතිතවී
හිරු කිරණින් දිදුලන
මුතුවක් වැනි බිඳුවක් මතින් මතු වූ
නොවෙනස් වූ රූපය
නුඹයි මගේ ජීවය
මිහිපිට පය තබන්නට
උරුම කරදුන් නොමනා දුක්විඳි කත
ආදර අම්මා

සෙනෙහසට නිමක් කතරක් නැති
බිඳුවක් පාසා බිඳුවක්
දනාදිය මහ පොළොව මත පතිතකර
කරදඬු උස් මහත්කර රට රකින්නට
අවි දරන්නට දිරිය දුන්
උදාර සීගිරි පර්වතයට සමකල
නොහැකි
මිහිපිට පිළිරුව පියා

සෙ/485186
ලා/කෝ ධර්මසේන එල්පීටීඑස්
14 ගරෙ

## සෙබළ පුතු...

පුරා සඳෙන් ඝණ කළුවර එළිය කෙරූ
මිරිවැඩි සගල මල් පෙති මෙන් පහස කෙරූ
දෑතෙ ගිනිඅවිය දෑතට බරක් නොවූ
දෑයටම දෙලොස් මහ පහනකි සෙබළ පුතු

සෙ/106244
කෝප්‍රල් දිසානායක ඩීඑම්ඩී
4 සරෙ ශ්‍රීලසබ

## මිනිසත්කම...

මල් සුවඳින් සිසිල විඳිනවා සේ
හැඩුම් සුළඟට ගෙසින පුබුදුවනවා සේ
උතුම් මිනිස් ගුණ පුබුදුවනු මැන
මිනිසත්කම පහන නොසැවන්

මව්පිය සෙනෙහස අහකදමා
සොයුරු පෙම බේද කරගෙන
අසල්වැසි වෛර කරගෙන
අයාලේ යන මිනිසුනේ

දහම් දීපයක් යයි කලක් නම දිලුන
නොමඟ දහමට අද නැගක්
රාගය ද්වේශය මෝහයෙන් මුලාවුන
මිනිසුනේ
නුවණැස විවරකරන කාලයයි උදාවුනේ

සෙ/2ඩී03197
ලා/කෝ දයාරත්න ඩීඒ
2 ශ්‍රීලපාහ

## පුංචි පවුල රත්තරං...

සුන්දර කැදැල්ල තුටින් පිරිලා
දූ පුතුන් පැටවුන් හිනා පතුරලා
මව්පිය දෙපලගෙ සිත් තුටු පිරිලා
දැකුමන් සිරියයි මගේ හිත පිරිලා

සෙ/110564
කෝප්‍රල් සුමනරත්න එච්එම්පීකේ
4 සරෙ ශ්‍රීලසබ

## හිතාගන්න බැරි තරමට...

හිතාගන්න බැරි තරමට බැන්දෙ පෙම
දරාගන්න බැරි තරමට අහිමිවෙද
කියාගන්න එක වදනක් නොහැකි මට
බලාගන්න ඔබ ඇවිදින් විඳින දුක

සෙ/243513
ඉසෙ පුෂ්පකුමාර එම්එච්එම්
10 කාඉරෙ ශ්‍රීලංඉ



# ක්‍රීඩා විත්ති

## 74 වන "මිස්ටර් ශ්‍රී ලංකා ජාතික කායවර්ධන ශූරතාවලිය 2023"



ශ්‍රී ලංකා කායවර්ධන සම්මේලනය මගින් සංවිධානය කරන ලද 74 වන "මිස්ටර් ශ්‍රී ලංකා ජාතික කායවර්ධන ශූරතාවලිය 2023" ඉකුත් මාර්තු මස 26 දින කොළඹ ටවර් හෝල් හිදී පැවැත්විණි. ඒ සඳහා සහභාගී වූ යුද්ධ හමුදා කායවර්ධන ක්‍රීඩකයෝ රන් පදක්කම් 2 ක්, රිදී පදක්කම් 4 ක් සහ ලෝකඩ පදක්කමක් දිනාගත්හ. මෙම තරගාවලිය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදා කණ්ඩායම ඇතුළු දිවයින පුරා ක්‍රීඩා සමාජ 9 ක් නියෝජනය කරමින් සහභාගී වූ කායවර්ධන ක්‍රීඩකයින් 377 දෙනකු කිලෝ ග්‍රෑම් 60, 65, 75, 80, 85 සහ 90 යන බර බාණ්ඩ යටතේ තරගවැදිණි. තරගාවලියේ අනුශූරතාවය දිනාගැනීමට 2 වන (ස්වේච්ඡා) ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකායේ ලාන්ස් කෝප්‍රල් පුෂ්පකුමාර එම්ඩබ්ඩබ්ලිව් සමත්විය.

## ජාතික දුනුවිදීමේ ශූරතාවලිය - 2023






ශ්‍රී ලංකා දුනුවිදීමේ සංගමය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව එක්ව සංවිධානය කරන ලද 21 වැනි ජාතික දුනුවිදීමේ ශූරතාවලිය - 2023, ඉකුත් මාර්තු 05 සහ 06 යන දිනයන්හිදී දියගම මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණයේ දී පැවැත්විණි. එහිදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා දුනුවිදීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ රන් පදක්කම් 3 ක්, රිදී පදක්කම් 1 ක් සහ ලෝකඩ පදක්කම් 2 ක් දිනා ගැනීමට සමත් වූහ. ත්‍රිවිධ හමුදාවේ දුනුවිදීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ ඇතුළු දුනුවිදීමේ ක්‍රීඩා සංගම් 20 කට අධික සංඛ්‍යාවක් නියෝජනය කරමින් දිවයින පුරා සිටින දුනුවිදීමේ ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 200 කට අධික සංඛ්‍යාවක් මෙම තරගාවලිය සඳහා තරග වැදුනහ.

# ආරක්ෂක සේවා ඔරු පැදීමේ ශූරතාවලිය






ශ්‍රී ලංකා ගුවන් හමුදාව මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ආරක්ෂක සේවා ඔරු පැදීමේ ශූරතාවලිය ඉකුත් මාර්තු මස 22 දින සිට 24 දින දක්වා දියවන්නා ඔය පරිශ්‍රයේදී ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. මෙම තරගාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩකයින් පදක්කම් 06 ක් සහ ක්‍රීඩිකාවන් පදක්කම් 04 ක් දිනාගත්හ. යුද්ධ හමුදා පිරිමි ඔරු පැදීමේ කණ්ඩායම රන් පදක්කම් 03 ක්, රිදී පදක්කමක් සහ ලෝකඩ පදක්කම් 02 ක් දිනාගත් අතර, යුද්ධ හමුදා ක්‍රීඩිකාවන් රන් පදක්කම් 03 ක් සහ ලෝකඩ පදක්කමක් දිනාගත්හ. ශ්‍රී ලංකා නාවික හමුදා ඔරු පැදීමේ පිරිමි සහ කාන්තා කණ්ඩායම් එම ඉසව් දෙකෙහිම අනුශූරතාව දිනාගත් අතර, ගුවන් හමුදා කණ්ඩායමට තෙවන ස්ථානය හිමිවිය.

# *CR & FC* ක්‍රීඩා සමාජයේ ශත සංවත්සර සත් සාමාජික රග්බි තරඟාවලිය

*'CR & FC'* ක්‍රීඩා සමාජයේ ශත සංවත්සරය වෙනුවෙන් ඉකුත් අප්‍රේල් 1 සහ 2 දෙදින තුළ කොළඹ *CR ) FC* ක්‍රීඩාංගණයේදී පැවති සත් සාමාජික රග්බි තරගාවලියේදී යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවෝ දක්ෂතා දැක්වූහ. පාසල් සහ විදේශීය රග්බි කණ්ඩායම් (ඕස්ට්‍රේලියානු සහ දෝහා කටාර්) ඇතුළු මෙරට ප්‍රමුඛ පෙළේ රග්බි ක්‍රීඩා සමාජවල සහභාගීත්වයෙන් මෙම තරගාවලිය පැවැත්විණි. එහිදී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පිරිමි රග්බි කණ්ඩායම ශ්‍රී ලංකා පොලිස් රග්බි කණ්ඩායම පරදවමින් ඔඳුන ශූරතාව දිනාගත් අතර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා රග්බි කණ්ඩායම, ඕස්ට්‍රේලියානු කාන්තා රග්බි ක්‍රීඩා සමාජය පරදවමින් එහි අනුශූරතාව හිමිකර ගත්හ.



# *"Magasthota Festival of Speed*-2023" තරඟාවලියේ



ඉකුත් අප්‍රේල් මස 8 සහ 9 යන දෙදින තුළ නුවරඑළිය, මාගස්තොට කඳු තරණ මෝටර් රථ ධාවන පථයේ පැවති *"Magasthota Festival of Speed -2023"* තරගාවලියේදී ශ්‍රී ලංකා යුද්ධ හමුදා ධාවන පැදි තරගකරුවෝ දිවයිනේ අනෙකුත් තරගකරුවන් පරාජය කරමින් කුසලාන දිනාගැනීමට සමත්වූහ.

එහිදී 125 *CC* / 250 *CC speed trail bike* විවෘත ඉසව්වේ තෙවන ස්ථානය දිනා ගැනීමට ඉංජිනේරු සේවා බලකායේ කෝප්‍රල් ජයලත් ජේඑම්එස් සමත් විය. එසේම *SM-Super Motard* 250/450*CC* විවෘත ඉසව්වේ පළමු ස්ථානයත්, *Sport Touring* 600*CC* විවෘත ඉසව්වේ තෙවන ස්ථානයත් දිනාගැනීමට ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකායේ කෝප්‍රල් මධුරංග බීඅයි සමත්විය. ගජබා රෙජිමේන්තුවේ සාමාන්‍ය සෙබළ සෙනෙවිරත්න එල්බීඩී විසින් *SM - Super Motard* 250/450 *CC* විවෘත ඉසව්වේ 3 වන ස්ථානය හිමිකරගන්නා ලදී.

# "58 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා ශූරතාවලිය"





යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ දක්ෂතා ප්‍රදර්ශනය කරමින් දින තුනක් පුරා පැවති "58 වන යුද්ධ හමුදා මළල ක්‍රීඩා ශූරතාවලිය" ඉකුත් මාර්තු මස 31 වන දින අවසන් විය. ජාතික හා යුද්ධ හමුදා වාර්තා රැයක් අළුත්වුණු මෙම මළල ක්‍රීඩා උළෙලේ ශූරතාවය ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු බලකා ක්‍රීඩකයෝ දිනාගත්හ.

යුද්ධ හමුදාවේ සියලුම රෙජිමේන්තු නියෝජනය කරමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 600 කට අධික පිරිසකගේ සහභාගීත්වයෙන් මාර්තු මස 29 දින සිට 31 දින දක්වා පැවැති මෙම තරගාවලියේදී නව ජාතික වාර්තා 04ක් සහ යුද්ධ හමුදා වාර්තා 08 ක් පිහිටුවිණි. තවද, රිටි පැනීම, මීටර් 10000 ඇවිදීම (පිරිමි සහ කාන්තා කාණ්ඩ) නියෝජනය කරමින් සහභාගී වූ යුද්ධ හමුදා ක්‍රීඩක ක්‍රීඩිකාවන් ජාතික වාර්තා 3 ක් පිහිටුවීමද මෙහිදී සුවිශේෂී කරුණකි.

යුද්ධ හමුදා මළල ක්‍රීඩා කමිටුවේ සභාපති මේජර් ජෙනරාල් ඩීජීඑස් සෙනරත් යාපා ආර්ඩබ්ලිව්පී ආර්එස්පී එන්ඩියූ ගේ මගපෙන්වීම මත යුද්ධ හමුදා මළල ක්‍රීඩා කමිටුව විසින් මෙම තරගාවලිය සංවිධානය කරන ලදී. තරගාවලියේ සමාප්ති උත්සවය ඉකුත් මාර්තු 31 වන දින පැවැත්විණි.

# "ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති අභියෝගතා කුසලාන අත්පන්දු තරඟාවලිය - 2023"



ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති මේජර් ජෙනරාල් ඩීඑම්කේඩීබී පුස්සැල්ල ආර්ඩබ්ලිව්පී ආර්එස්පී ගේ උපදෙස් මත එම මූලස්ථානය යටතේ සේවයේ නියුතු භටපිරිස් සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවයට සමගාමීව සංවිධානය කරන ලද "ආරක්ෂක සේනා (බටහිර) ආඥාපති අභියෝගතා කුසලාන අත්පන්දු තරඟාවලිය - 2023" අවසන් තරඟය ඉකුත් අප්‍රේල් 03 වන දින පනාගොඩ යුද්ධ හමුදා ජනපද ශතසංවත්සර ක්‍රීඩාංගනයේදී පැවැත්විණි.

මේ සඳහා අත්පන්දු කණ්ඩායම් 10 ක් තරඟ වට දෙකක් යටතේ තරඟවැදුණු අතර, අවසන් තරඟය සඳහා ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) සහ 143 වන පාබල බළසේනා කණ්ඩායම් සුදුසුකම් ලැබූහ. මෙම අත්පන්දු තරඟාවලියේ මූලික තරඟ ඉකුත් මාර්තු මස 27 සිට 29 දින දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකා ක්‍රීඩා පිටියේදී පැවැත්විණි. අවසන් තරඟයේදී ආරක්ෂක සේනා මූලස්ථානය (බටහිර) අත්පන්දු කණ්ඩායම වට 3 - 0 ක් ලෙස 143 වන පාබල බළසේනා අත්පන්දු කණ්ඩායම පරදවා ජයග්‍රහණය හිමිකරගත්තේය.



## වෘත්තීය දිවියේ නේකවිධ කඩඉම් පසුකොට සුබ මොහොතින් නව තනතුරු ලැබූ ඔබ සියලු දෙනාට දිරිය, විරිය,රැකවරණය ලැබේවායි "රණවිරුවා" ද මෙසේ සුබ පැතුම් එක්කරයි.



21 වන පාබල සේනාංකයේ සේනාංකාධිපති ලෙස

**මේජර් ජෙනරල් ඩබ්ලිව්පීඩබ්ලිව්ඩබ්ලිව් නානායක්කාර ආර්ඩබ්ලිව්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ**

**2023 මාර්තු 22 වන දින සිට**



ඉදිරි නඩත්තු පෙදෙස (මධ්‍යම) ආඥාපති ලෙස

**මේජර් ජෙනරල් ඩීඑම්පීපී දසනායක**


**2023 මාර්තු 15 වන දින සිට**



ඉදිරි නඩත්තු පෙදෙස (උතුර) ආඥාපති ලෙස

**බ්‍රිගේඩියර් එස්වී පතිරණ ආර්එස්පී**

**2023 අප්‍රේල් 19 වන දින සිට**



පර්යේෂණ, සංකල්ප හා මූලධර්ම අධ්‍යක්ෂ මණ්ඩලයේ බ්‍රිගේඩියර් පුහුණු සංකල්ප හා අධීක්ෂණ ලෙස

**බ්‍රිගේඩියර් එම්පීඑන්ජී මුතුමාල යූඑස්පී පීඑස්සී**


**2023 අප්‍රේල් 04 වන දින සිට**



අභිමංසල 3 සුවසහන නිකේතනයේ සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර් පීයූපීපී පැස්කුවල්**

**2023 මාර්තු 16 වන දින සිට**



611 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ජේපීසීඑම්එච් ගමිලත් ආර්එස්පී යූඑස්පී**

**2023 අප්‍රේල් 10 වන දින සිට**



යුද්ධ හමුදා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය - කලාඔය සේනාවිධායක ලෙස

**බ්‍රිගේඩියර් එච්ටී අනිල් සෝමවීර ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2023 අප්‍රේල් 24 වන දින සිට**



553 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් පීඑස්ජේ පෙරේරා ආර්එස්පී**

**2023 අප්‍රේල් 20 වන දින සිට**



111 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**බ්‍රිගේඩියර් ඩබ්ලිව්එම්එස්ජී ඇරැවගොඩ ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**

**2023 අප්‍රේල් 04 වන දින සිට**



501 වන පාබල බලසේනාවේ සං.නි බලසේනාධිපති ලෙස

**කර්නල් එස්ඩබ්ලිව්එම්එම්ඩී අරංගෙපොල ආර්ඩබ්ලිව්පී**

**2023 මාර්තු 17 වන දින සිට**



221 වන පාබල බලසේනාවේ බලසේනාධිපති ලෙස

**කර්නල් ඒකේ පීරිස් ආර්එස්පී**

**2023 අප්‍රේල් 25 වන දින සිට**



ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදුසේවා බලකායේ මධ්‍යස්ථාන සේනාවිධායක ලෙස

**කර්නල් එම්පීජේඑස් ද සිල්වා**

**2023 අප්‍රේල් 04 වන දින සිට**



59 වන පාබල සේනාංකයේ
කර්නල් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**කර්නල්**
**එච්ජේපී කරුණාතිලක**
**ආර්එස්පී**

**2023 මාර්තු 01 වන**
**දින සිට**



62 වන පාබල සේනාංකයේ
කර්නල් (පාලන/සැපයුම) ලෙස

**කර්නල්**
**ජේඑම්එන් දිස්කුඹුර ආර්එස්පී**

**2023 මාර්තු 29 වන**
**දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර)
කර්නල් ප්‍රධාන මාණ්ඩලික ලෙස

**කර්නල්**
**බීඩීඩීඑන්කේ මුලන්සිංහල**
**ආර්ඩබ්ලිව්පී ආර්එස්පී යූඑස්පී**
**පීඑස්සී**

**2023 අප්‍රේල් 24 වන**
**දින සිට**



යුද්ධ හමුදා මූලස්ථානයේ
පිරිස් පාලන අධ්‍යක්ෂ මණ්ඩලයේ
කර්නල් (පාලන) ලෙස

**කර්නල්**
**ඩබ්ලිව්ඩබ්ලිව්එම්අයියූබී වීරසේකර**
**යූඑස්පී පීඑස්සී**

**2023 මාර්තු 22 වන**
**දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(නැගෙනහිර)
කර්නල් සම්බන්ධීකරණ ලෙස

**කර්නල්**
**ඊබීඑම්ආර් කන්දෙකුඹුර**
**ආර්එස්පී යූඑස්පී**


**2023 අප්‍රේල් 19 වන**
**දින සිට**



යුද්ධ හමුදා පුහුණු පාසල
මාදුරුඔය
අණදෙන නිලධාරී (පුහුණු) ලෙස

**කර්නල්**
**එම්ටීඅයි ගුණවර්ධන ආර්එස්පී**
**පීඑස්සී**

**2023 අප්‍රේල් 04 වන**
**දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(වන්නි) ප්‍රමාණි 1 (ක්‍රියා) ලෙස

**ලුතිනන් කර්නල්**
**ඩීඑම්එස් දිසානායක යූඑස්පී**
**පීඑස්සී**

**2023 මාර්තු 30 වන**
**දින සිට**



ගුවන් සංචලිත පුහුණු පාසලේ
සේනාවිධායක ලෙස

**ලුතිනන් කර්නල්**
**අයිඑච්ආර්පී ගුණතිලක**
**ආර්ඩබ්ලිව්පී යූඑස්පී**

**2023 මාර්තු 23 වන**
**දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(මධ්‍යම)
මාහි 1 (පාලන) ලෙස

**ලුතිනන් කර්නල්**
**එස්ආර්ජේඩී සිරිසේන ආර්එස්පී**
**යූඑස්පී**

**2023 අප්‍රේල් 04 වන**
**දින සිට**



11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා
කාලතුවක්කු හමුදාංගේ (ආධාරක)
අණදෙන නිලධාරී ලෙස

**ලුතිනන් කර්නල්**
**ඒආර්එස් ද සිල්වා ආර්එස්පී**
**යූඑස්පී පීඑස්සී අයිජී**

**2023 මාර්තු 20 වන**
**දින සිට**



ආරක්ෂක සේනා මූලස්ථානය
(බටහිර) සහකාර කර්නල්
සම්බන්ධීකරණ (කෘෂි) ලෙස

**ලුතිනන් කර්නල්**
**එස්එම්පී සෝමතිලක**

**2023 අප්‍රේල් 24 වන**
**දින සිට**



11 වන බළඇණිය ශ්‍රී ලංකා
පාබල හමුදාංගේ
අණදෙන නිලධාරී ලෙස

**මේජර්**
**ජේපීඑස්එස් විතානගේ යූඑස්පී**
**පීඑස්සී**

**2023 අප්‍රේල් 04 වන**
**දින සිට**

# "මායා චිත්‍ර" වැඩසටහන



අභිමංසල 1 සුවසහන නිකේතනයේ පුනරුත්ථාපනලාභීන්ගේ හා කාර්ය මණ්ඩලයේ සෞන්දර්යාත්මක චින්තනය වැඩිදියුණු කිරීම හා චිත්‍ර නිර්මාණයේ පළමු පියවර නිවැරදිව හඳුනාගැනීම වෙනුවෙන් සංවිධානය කරන ලද "මායා චිත්‍ර" වැඩසටහන ඉකුත් මාර්තු 15 වන දින පැවැත්විණි. ශ්‍රී ලංකා ජාතික අධ්‍යාපන ආයතනයෙහි චිත්‍ර උපදේශක එම්ජී රත්නසේන මහතා විසින් මෙහෙයවන ලද එම වැඩසටහන සඳහා අභිමංසල 1 සුවසහන නිකේතනයේ පුනරුත්ථාපනලාභීන්, කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සහ සෙසුනිලයින් රැසක් සහභාගී වූහ.

# මාහැඟි පරිත්‍යාගයක්


පුනරුත්ථාපන අධ්‍යක්ෂ මණ්ඩලය යටතේ පාලනය වන අභිමංසල 3 සුවසහන නිකේතනයේ රුපියල් 500,000.00 ක ධන පරිත්‍යාගයෙන් ඉදිකරන ලද නව ජල පිරිපහදු යන්ත්‍රය විවෘත කිරීම මෙන්ම මියගිය රණවිරුවකුගේ බිරිඳකට සහ සිවිල් සේවක මහතකු වෙත කෘත්‍රිම පාද 02 ක් බෙදාදීම ඉකුත් මාර්තු 23 වන දින ඔමා උපමාලිකා විජේගුණවර්ධන මහත්මියගේ සුරතින් සිදුවූවාය.





# රණවිරුවා



අධීක්ෂණය

බ්‍රිගේඩියර්
ඩබ්ලිව්එම්ඩීඑස්බී කුලතුංග ආර්එස්පී එන්ඩීසී පීඑස්සී



උපදේශකත්වය

ලුතිනන් කර්නල්
ආර්එම්එම්පීජේ රත්නායක



ප්‍රධාන සංස්කාරක

ලුතිනන් කර්නල්
සුජිත් චමින්ද එදිරිසිංහ



සහය සංස්කාරක

කපිතාන්
එච්එල්යූ ලක්ෂිකා

පරිගණක අකුරු සංයෝජනය,
කවර නිර්මාණය හා පිටු සැකසුම
සෙ/752158 ඔනි II සේනාරත්න ජීපී - 3 ඉංජිනේරු
සෙ/753797 කෝප්‍රල් කුමාරසිංහ එම්ජීඑන්එම් - 11 ඉංජිනේරු
සෙ/754676 ලා/කෝප්‍රල් ලක්තිලිණ ඩබ්ලිව්ආර් - 11 ඉංජිනේරු

රණවිරුවා ලිපිනය

රණවිරුවා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය,
යුද්ධ හමුදා මූලස්ථානය,
කොළඹ

ඊමේල්

dtepsyops@army.lk
ranaviruwa@yahoo.com

දුරකථන

011 2993076

ගුප්ත දිගුව

51445/51446

"රණවිරුවා" අන්තර්ජාලය ඔස්සේ කියවීමට


ප්‍රකාශනය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා
මනෝවිද්‍යාත්මක මෙහෙයුම් අධ්‍යක්ෂ මණ්ඩලය

# රෝද දෙකේ විසේකාර ආඩම්බරය...

රෝද දෙකේ දඬුමොණරෙන්
හපන්කම් පෙන්වන අය මහමඟ ඕනතරම්.
හැබැයි ඒ වැඩිදෙනෙක් අනුන්ටත් කරදර කරල,
තමුනුත් කරදරයක වැටිල අන්තිමට නතර
වෙන්නෙ රෝහලක. එහෙම නැත්නම් කනත්තක.

යුදබිම තුළත් රෝද දෙකේ විසේකාරයො හිටියා.
වැලි දූවිලි, කටු පඳුරු, මඩ වගුරු අස්සෙ ඒ
අය පාපු හරඹ හින්ද මේ රට රකින සටනට
ලැබුණෙ අසීමිත දායකත්වයක්. ඒ වෙනුවෙන්
යුදබිමේ ඇඳුණු ටයර් සළකුණු අදත් එහෙමමයි.
අපේ රණවිරුවො රෝද දෙකෙන් කරපු හපන්කම්
කොයිතරම්ද කියල යුදබිමේ පයගහපු කාටවත්
අමතක වෙන්න විදියක් නැහැ.





රණබිමේ මතක

# මන්දස්මිතය...

රණවිරුවො හිනා වෙන්නෙ අඩුවෙන්.
ඔවුන් කරන්නෙම අනිත් අයට හිනාවෙන්න
ඉඩ සලස්වන එක. ඒ වෙනුවෙන්
උහුලන දුක්, දරන බර, කරන කැපකිරීම්
ඒ කාලෙ වගේම අදත්, මතුවටත් එකම
විදියයි.
මුළු රටේම හිනාව වෙනුවෙන්
තමන්ගෙ අවයව විතරක් නෙමෙයි,
ජීවිතය පවා කැපකළ එකම පිරිස
රණවිරුවොයි. ඒ අසීමාන්තික දරාගැනීම
හැමෝටම කරන්න බැහැ.
රණවිරුවො කියන්නෙ එහෙම ජාතියක්.